පුරෝගාමියා සමඟ සම්බන්ධ වීම සඳහා

# kcg.edu

The Kyoto College of Graduate Studies for Informatics

京都情報大学院大学


**URL: https://www.kcg.edu/**

**විද්‍යුත්තැපෑල: admissions@kcg.edu**

---

විමසීම: ඇතුළත් කිරීමේ අංශය,

කියෝතෝ තොරතුරු විද්‍යා උපාධි අධ්‍යයන විද්‍යාලය

7 Tanakamonzen-cho, Sakyo-ku, Kyoto 606-8225, Japan

දුරකථනය: 075-681-6334 (+81-75-681-6334 ජපානයෙන් පිටත)

ෆැක්ස්: 075-671-1382 (+81-75-671-1382 ජපානයෙන් පිටත)


シンハラ語 202108

ජපානයේ ප්‍රථම තොරතුරු තාක්ෂණ වෘත්තීය උපාධි පාසල

# කියෝතෝ තොරතුරු විද්‍යා උපාධි අධ්‍යයන විද්‍යාලය

**(KCGI:The Kyoto College of Graduate Studies for Informatics)**

*ජපානයේ කියෝතොහිදී තියුණු ලෙස තොරතුරු තාක්ෂණ විද්‍යාව පිළිබඳ හදාරන්න*





# තොරතුරු තාක්ෂණයෙහි අති දක්ෂ වෘත්තීයවේදීන් බිහි කිරීමට

මෑත වසරවලදී සිදු වූ විද්‍යා හා තාක්ෂණයේ දියුණුව, විශිෂ්ට තාක්ෂණික නවෝත්පාදනයන් සහ රැඩිකල් සමාජ-ආර්ථික වෙනස්කම් (විවිධාංගීකරණය, සංකීර්ණත්වය වැඩිවීම, නවීනත්වය ඉහළ යාම, ගෝලීයකරණය සහ IoT යුගයේ ආගමනය ආදිය) සමගම ජපානය තුල හා ජාත්‍යන්තර මට්ටමින් උසස් ගණයේ තොරතුරු විද්‍යා වෘත්තිකයන් පිළිබඳව අපේක්ෂාවන් වේගයෙන් වැඩිවෙමින් තිබේ.
කෙසේ වුවද, මෙවන් තොරතුරු හා කළමනාකරණය වැනි විශේෂිත වූ ක්ෂේත්‍රයන්ගෙන් සමන්විත වන්නා වූ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයෙහි, තොරතුරු තාක්ෂණ පද්ධති වෘත්තිකයින් බිහි කිරීමේ අභියෝගයන්ට මුහුණ දීමට ශක්‍යතාවය ඇති පාසල් හා උපාධි පාසැල් සංඛ්‍යාව මේ වන විටත් ශූන්‍ය තත්වයට පත් වී ඇත.
මෙම තත්වයෙන් අත්මිදීම සඳහා කියෝතෝ තොරතුරු විද්‍යා උපාධි අධ්‍යයන විද්‍යාලය (KCGI) 2004 වසරේ අප්‍රියල් මසදී ජපානයේ ප්‍රථම සහ එකම තොරතුරු තාක්ෂණ වෘත්තීකයන්ගේ උපාධි පාසල ලෙස පිහිටුවන ලදී.
KCGI ආයතනය වසර 57 ක් පුරාවට ක්ෂේත්‍රයේ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා තොරතුරු සැකසුම් ඉංජිනේරුවන් පුහුණු කර ඇති ජපානයේ ප්‍රථම පරිගණක අධ්‍යාපන ආයතනය වන ජපානයේ කියෝතෝ කොම්පියුටර් ගකුඉන් සාම්ප්‍රදායන් සහ ජයග්‍රහණයන් හට උරුමකම් කියයි.
KCGI ආයතනය විසින් ජාත්‍යන්තර රෝචෙස්ටර් තාක්ෂණික ආයතනය ඇතුළු ලොව පුරා විසිරී තිබෙන විශ්ව විද්‍යාල සමඟ ගෝලීය අධ්‍යාපනික ජාලයක් මත පදනම්ව ජාත්‍යන්තර තොරතුරු තාක්ෂණ විෂය නිර්දේශයන් ක්‍රියාත්මක කරයි. තවද KCGI හි විෂය මාලාව කළමනාකරණය සහ පරිපාලන අධ්‍යාපනය ද සැලකිල්ලට ගනී. KCGI ආයතනය මගින් සම්ප්‍රදායික පර්යේෂණ ඉලක්ක කරගත් උපාධිධාරී පාසල් මගින් නිසි අධ්‍යාපනයක් ලබා ගැනීමට අපහසු වන තනතුරුවලට, එනම් උසස් මට්ටමේ තොරතුරු තාක්ෂණ වෘත්තිකයන් සහ විශේෂයෙන්ම ප්‍රධාන තොරතුරු තාක්ෂණ නිලධාරීන් (CIO) වැනි තොරතුරු තාක්ෂණ යෙදුම් ක්ෂේත්‍ර සඳහා ඉහළ පෙළේ නායකයින් බිහි කරයි.



## පාසලේ දර්ශනය

අපගේ පාසලේ පරමාර්ථය වන්නේ සමාජයේ ඉල්ලීම් සපුරාලීමටත් වර්තමාන හා අනාගත පරපුර සඳහා වන වගකීම ඉසිලීමටත් හැකියාව ඇති, වර්තමාන ව්‍යාපාරික භාවිතයන් පිළිබඳ ශක්තිමත් ප්‍රායෝගික දැනුමක්, ශක්තිමත් න්‍යායාත්මක පසුබිමක් සහ නිර්මාණාත්මක හා නව්‍යකරණ ජීවගුණයක් සහිත ඉහළ සුදුසුකම් ලත් තොරතුරු තාක්‍ෂණ වෘත්තිකයින් පුහුණු කිරීමයි.

## KCGI හි මෙහෙවර සහ අරමුණ

අපගේ තොරතුරු තාක්ෂණ සමාජයේ ඉහළ මට්ටමේ සහ විවිධ වූ මානව සම්පත්වල අවශ්‍යතාවය සපුරාලීමත්, සාම්ප්‍රදායිකත්වය ඉක්මවා ගිය වඩාත් පුළුල් දැනුමක් හා ඉහළ මට්ටමේ කුසලතා සහිත මෙන්ම සාර්වත්‍රික පරිගණකකරණ යුගයේ අන්තර්ජාතික චින්තනයක් සහිත ඉහළ මට්ටමේ තොරතුරු තාක්ෂණ වෘත්තිකයින් සැපයීම තුළින් ආර්ථිකයේ දියුණුව සහ ඉහළ මට්ටමේ තොරතුරු සමාජයක් සාක්ෂාත් කර ගැනීමට දායක වීම.
අපගේ අරමුණ වන්නේ තොරතුරු හා ඒ ආශ්‍රිත තාක්ෂණයන්හි විකාශනයන්ට අනුවර්තනය වීම සහ ඉහළ මට්ටමේ වෘත්තිකයින් පුහුණු කිරීමේ දී විද්‍යාව, තාක්‍ෂණය සහ ව්‍යාපාර පරිපාලනය සම්බන්ධ අධ්‍යයන ක්ෂේත්‍රයන්හි න්‍යාය හා ප්‍රායෝගික තාක්‍ෂණය පිළිබඳ අධ්‍යාපනය ලබා දීමයි.

kcg.edu
The Kyoto College of Graduate Studies for Informatics

## ඇතුළත් කරගැනීමේ ප්‍රතිපත්ති

තොරතුරු තාක්ෂණ / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කර්මාන්තය යනු තොරතුරු මෙන්ම කළමනාකරණය සම්බන්ධ ක්ෂේත්‍ර දෙකෙහිම ඒකාබද්ධ ක්ෂේත්‍රයක් වන අතර එහි ඉලක්ක සංකීර්ණ හා විවිධ වේ. මේ හේතුවෙන්, තොරතුරු තාක්‍ෂණ කර්මාන්තයේ අවශ්‍යතා සඳහා වන කුසලතා වෙන කවරදාටත් වඩා විවිධාංගීකරණය වෙමින් පවතී. අද වන විට, ජපාන කර්මාන්ත ක්ෂේත්‍රයේ පවතින විවිධාකාර කුසලතා සැපයුම් අවශ්‍යතාවන්, දැනට පවත්නා ඉංජිනේරු විද්‍යාව හා සම්බන්ධ පර්යේෂණ උපාධි පාසල් තුළින් කෙරෙන ඉංජිනේරු උපාධි අපේක්ෂකයින් සංවර්ධනය කිරීම මත පමණක් රඳා පවතින ජපන් අධ්‍යාපන ක්‍රමයෙන් සපුරාලීමට නොහැකි වී ඇත. ඉදිරි අනාගතයේදී, ජපාන කර්මාන්ත ක්ෂේත්‍රය සහ ආර්ථිකය තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා, තොරතුරු තාක්‍ෂණ / තොරතුරු සන්නිවේදන තාක්ෂණ කර්මාන්තයේ ඉහළ විශේෂඥ වෘත්තිකයන් ලෙස විවිධ පසුබිම්වල පුද්ගලයන් සෑම ආකාරයකින්ම පුහුණු කිරීම වැදගත්ය.

මෙම ඉදිරි දර්ශනයෙන් බලන විට, විවිධ පසුබිම්වලින් පැමිණෙන සිසුන් හැකිතාක් ප්‍රමාණයක් ඔවුන්ගේ අපේක්ෂක උපාධි විශේෂණය කිරීමකින් තොරව පුළුල් ලෙස පිළිගැනීමේ ප්‍රතිපත්තියක් අප පාසල සතුව ඇත.

**1) අපගේ පාසලේදී විශේෂිත දැනුම ඉගෙනීමේ පදනම් අධ්‍යයන හැකියාව ඇති පුද්ගලයින්;**

**2) ස්ථාපිත සංකල්පවල සිරවී නොසිට අලුත් දේ ඉගෙනීමට, තනිවම සිතීමට සහ අලුත් දෙයක් නිර්මාණය කිරීමට අභිලාෂය ඇති පුද්ගලයින්; හා**

**3) අන්‍යයන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට සහ සන්නිවේදනය තුළින් ගැටළු වලට පිළිතුරු සෙවීමට කැමැත්තක් ඇති පුද්ගලයින්.**

# KCGI අධ්‍යාපනයක්

The Kyoto College of Graduate Studies for Informatics
කියෝතෝ තොරතුරු විද්‍යා උපාධි අධ්‍යයන විද්‍යාලය



**සභාපති සහ මහාචාර්ය**
**කියෝතෝ ජෝහෝ ගකුඑන්**

## වතරු හසෙගාවා 長谷川 亘

## Wataru Hasegawa

ශාස්ත්‍රවේදී උපාධිය, වසේදා විශ්ව විද්‍යාලය

අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, කලා ශාස්ත්‍රපති, ඇමරිකා එක්සත් ජනපදයේ කොලම්බියා විශ්ව විද්‍යාලය

සභාපති, කියෝතෝ ප්‍රාන්තයේ තොරතුරු කර්මාන්ත සංගමය

භාරකරු සහ සභාපති, සමස්ථ නිපොන් තොරතුරු කර්මාන්ත සංගම් සම්මේලනය

නියෝජිත සභාපති සහ අග්‍ර උප සභාපති, ජපන් තොරතුරු තාක්ෂණ සමිති සම්මේලනය

තායිලන්ත රාජධානියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ උප අමාත්‍ය සම්මානය (දෙවරක්)

ඝානා ජනරජයේ අධ්‍යාපන අමාත්‍යාංශ සම්මානය

ඇමරිකා එක්සත් ජනපදයේ නිව්යෝක් ප්‍රාන්තයේ අධ්‍යාපන පරිපාලකයෙකු ලෙස සුදුසුකම් ලබා ඇත

බාහිර මහාචාර්ය, තියැන්ජින් විද්‍යා හා තාක්ෂණ විශ්ව විද්‍යාලය, චීනය

ප්‍රතිපත්ති උපදේශක කමිටුව, JDC, ජෙජු නිදහස් අන්තර්ජාතික නගර සංවර්ධන මධ්‍යස්ථානය

**පාඨමාලා:** නායකත්ව න්‍යාය, ප්‍රධාන ව්‍යාපෘතිය

කියෝතෝ තොරතුරු විද්‍යා උපාධි අධ්‍යයන විද්‍යාලය ජපානයේ ප්‍රථම තොරතුරු තාක්ෂණ වෘත්තීය උපාධි පාසල වේ. KCGI හි මව් සංවිධානය වන කියෝතෝ කම්පියුටර් ගැකුයින් (KCG) යනු ජපානයේ ප්‍රථම පුද්ගලික පරිගණක අධ්‍යාපන ආයතනයයි. KCG පුද්ගලික පාසලක් ලෙස ෂිගියෝ හසෙගාවා සහ යසුකෝ හසගාවා විසින් තම අද්විතීය, ඉදිරි දර්ශනය යටතේ පිහිටුවන ලදී.

1963 දී ස්ථාපනය කිරීමෙන් පසුව වසර 55 කට අධික කාලයක් පුරා පරිගණක අධ්‍යාපනය සඳහා KCG කටයුතු කර ඇති අතර, එම කාලය තුළ උසස් පෙළ උපාධිධාරීන් පමණක් නොව, සිව් වසරක විශ්ව විද්‍යාල උපාධිධාරීන් බොහෝ දෙනෙක් ද එහි වැඩසටහන් වලට ඇතුලත් වී උපාධි ලබා ඇත. මෙම පාසල ආරම්භ කරන අවස්ථාවේ, ජපානයේ පැවතුනේ පර්යේෂණ අරමුණු කොටගත් උපාධිධාරී පාසල් පමණකි.

විශ්ව විද්‍යාල උපාධි ලැබීමෙන් පසු බඳවාගත් බොහෝ සිසුන් විසින් පරිගණක පිලිබඳව ප්‍රායෝගික පැත්තට ඍජුවම සම්බන්ධ උසස් අධ්‍යාපන ආයතනයක් සොයා යාමෙන් පසු, KCG තෝරා ගන්නා ලදී. KCG වෘත්තීය පාසැල් ක්‍රමය යටතේ සංවිධානය කරන ලද නමුත් එය ජපන් සමාජය තුළ විශ්ව විද්‍යාල උපාධිධාරීන් සඳහා අධ්‍යාපනික ආයතනයක් ලෙස කටයුතු කරන අතර වෘත්තිය හා ප්‍රායෝගික උපාධි පාසලක කාර්යභාරයද සිදු කරනු ලබයි.

මෙම තත්ත්වය හා ඉතිහාසය මත පදනම්ව 1998 දී KCG විසින් ඇමරිකා එක්සත් ජනපදයේ රොචෙස්ටර් තාක්ෂණ ආයතනයෙහි උපාධි වැඩසටහන් (තොරතුරු විද්‍යාව හා තාක්ෂණය, පරිගණක විද්‍යාව සහ වෙනත්) සමග ඒකාබද්ධ වැඩසටහනක් ආරම්භ කරන ලද අතර පසුව විෂය මාලාව, ප්‍රායෝගික ඉගෙනීම අරමුණු කොට ගත් වෘත්තීය උපාධි පාසලක් ආරම්භ කර ඇත. ජපාන වෘත්තීය පාසලක් සහ ඇමෙරිකානු උපාධිධාරී පාසැල් වැඩසටහනක් අතර වූ මෙම සහයෝගිතාවය ජපානය තුළ ඒ ලෙසට ඇති වූ ප්‍රථම සහ නවීන සහයෝගිතාවයි.

කියෝතෝ කොම්පියුටර් ගැකුයින් (KCG) හි මෙවැනි නිපුණ පුද්ගලයින් විසින් වෘත්තීය උපාධි පාසල් පද්ධතිය යටතේ තොරතුරු තාක්ෂණ කේන්ද්‍රීය අධ්‍යාපන ආයතනයක් පිහිටුවීම යම් ආකාරයකින් අවශ්‍යයෙන් කළයුත්තක් විය. කියෝතෝ තොරතුරු විද්‍යා උපාධි අධ්‍යයන විද්‍යාලය (KCGI) ආරම්භ කරන ලද්දේ මූල්‍ය පාර්ශ්ව මෙන්ම රොචෙස්ටර් තාක්ෂණ ආයතනයේ සහ කොලොම්බියා විශ්ව විද්‍යාලයේ පීඨ ඇතුළු අධ්‍යාපන ක්ෂේත්‍රයන්හි අදාළ පාර්ශ්වයන්ගේ නොමසුරු අනුමැතිය හා සහයෝගය ඇතිවය. නව පද්ධතිය අනුගමනය කළ පළමු වසර, එනම් 2004 අප්‍රේල් මාසයේදී KCGI ජපානයේ පළමු හා එකම තොරතුරු තාක්ෂණ වෘත්තීය උපාධි පාසල ලෙස විවෘත කෙරිණි.

KCGI හි ආරම්භක දර්ශනය වන්නේ “සමාජයේ අවශ්‍යතා සපුරාලන, වත්මන් යුගයට උරදෙන සහ අනාගත පරපුර වෙත අපට මඟපෙන්වන නිර්මාණශීලීත්වය සහ ඉහළ මට්ටමේ ප්‍රායෝගික හැකියාවන්ගෙන් හෙබි ව්‍යවහාරික තොරතුරු තාක්ෂණය පිළිබඳ විශේෂඥයින් බිහි කිරීම” වේ. තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය ජාත්‍යන්තර ව්‍යාපාරික අධ්‍යාපනය සමඟ ඒකාබද්ධ කරමින්, KCGI විසින් ඉංජිනේරුවන් සහ විශේෂයෙන් වෙබ් ව්‍යාපාර (ඊ-ව්‍යාපාර) පිළිබඳ නිපුණ පරිගණක තොරතුරු නිලධාරීන් (CIO) බිහිකිරීමේ වැඩසටහනක් නිර්මාණය කරන ලද්දේ, පරිගණක යන්ත්‍රෝපකරණ පිළිබඳ සංගමයේ (ACM) තොරතුරු පද්ධති (IS) ශාස්ත්‍රපති උපාධි වැඩසටහන් විෂයමාලාවේ සංශෝධිත සංස්කරණය පදනම් කරගෙන ය.

KCGI හි මෙහෙවර හා අරමුණ වනුයේ සුවිශේෂී නිපුණතා මට්ටම්වලින් හෙබි දැනුම් සම්භාරයකින් යුත්, අන්තර්ජාතික චින්තනයක් සහිත තොරතුරු තාක්ෂණ වෘත්තිකයින් සැපයීම වෙනුවෙන් පෙනී සිටීමයි. මෙම ප්‍රයත්නයන් ආර්ථික සංවර්ධනයට සහ උසස් තොරතුරු තාක්ෂණ සමාජයක් සාක්ෂාත් කර ගැනීමටත්; තොරතුරු තාක්ෂණය හා අදාළ තාක්ෂණයන්ට අනුවර්තනය වීමට පහසුකම් සැපයීමටත්; විද්‍යාව, තාක්‍ෂණය සහ ව්‍යාපාර කළමනාකරණයට අදාළ අධ්‍යයන ක්ෂේත්‍රයන්හි න්‍යාය හා ප්‍රායෝගික තාක්‍ෂණය පිළිබඳ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමටත් ඉවහල් වනු ඇතැයි අපි විශ්වාස කරමු. මෙම ජයග්‍රහණයන් ඉහළ නිපුණතා සහිත වෘත්තිකයන්ගෙන් හෙබි අනාගත පරම්පරා බිහි කිරීමට හේතු වනු ඇතැයි අපි තවදුරටත් විශ්වාස කරමු.

KCGI ආරම්භ වනතුරු, උපාධි අපේක්ෂක හා උපාධි විද්‍යාල මට්ටමින් වූ වෙබ් ව්‍යාපාර (ඊ-ව්‍යාපාර) පිළිබඳ ප්‍රධාන උපාධි වැඩසටහන් ජපානයේ නොතිබූ තරම් ය. මෙම ප්‍රධාන උපාධි සලකන ලද්දේ හුදෙක්ම ව්‍යාපාර කළමනාකරණය කාර්මික ඉංජිනේරු තාක්ෂණය සහ තොරතුරු සම්බන්ධ ප්‍රධාන උපාධි වැනි සාම්ප්‍රදායික ප්‍රධාන උපාධි වැඩසටහන් වල අනු-ක්ෂේත්‍රයක් ලෙසය. ගෞරව උපාධි පර්යේෂණය සහ ඉගැන්වීම සිදු වූයේ හුදෙක්ම ක්‍රමික හා පුළුල් ප්‍රධාන උපාධියක කොටසක් ලෙස හෝ ප්‍රධාන උපාධි ක්ෂේත්‍රයක කොටසක් ලෙස ය.

KCGI වෙන්කර හඳුනාගත හැකි කරුණ වන්නේ, තොරතුරු තාක්ෂණය පිළිබඳ පුළුල් අර්ථයෙන් තොරතුරු තාක්ෂණ වෘත්තීය උපාධි පාසලක් ලෙස ගත්කළ, නායකත්ව හැකියාවන් ඔප්නැංවීම කෙරෙහි ද අවධානය යොමු කෙරෙන ලෝක මට්ටමේ වෘත්තීය පාසලක් වීම අපගේ ඉලක්කය වීමයි. බොහෝ විශ්වවිද්‍යාල මෙන් නොව, අපි "සිරස්ව බෙදුණු තනි ක්ෂේත්‍ර" පරිගණක විද්‍යා උපාධි පාසලක් හෝ තොරතුරු විද්‍යා හා ගණිත උපාධි පාසලක් නොවේ. අප සහ එම ආයතන සතු බොහෝ සමානකම් තිබුණද, අප පාසල වෙනස් ප්‍රභේදයක උපාධි පාසලකි. අධ්‍යාපනික දෘෂ්ටි කෝණය මත පදනම් වූ විෂයමාලා සැලසුම් සහ උපදේශක ගුරු පද්ධතියකට අමතරව, ජපාන විශ්ව විද්‍යාල වල කලාතුරකින් දක්නට ලැබෙන පුළුල් පරාසයක අංග සහ ප්‍රතිපත්ති ඒකාබද්ධ කරමින් මනාව සැකසූ සමබර අධ්‍යාපන ක්‍රමයක් සැපයීමට KCGI ඉලක්ක කරයි. මෙයට ශිෂ්‍ය-මූලික උපදේශන සැලසුමක්, විවෘත හා තිරස් ශ්‍රම විභාජනයක් සහිත අධ්‍යාපන ක්‍රමවේදයක් සහ කාලානුරූපීව සිදුකෙරෙන ඉගෙනුම් ප්‍රතිඵල ඇගයීම් ඇතුලත් වේ. තවද, ආසියාව හා ලෝකය පුරා වැඩ කිරීමට තම හැකියාවන් යෙදවිය හැකි තොරතුරු තාක්‍ෂණ හා කළමනාකරණ කුසලතා වලින් පිරිපුන් ජාත්‍යන්තර නායකයින් සහ ව්‍යාපාරිකයින් බිහිකිරීමේ ඉලක්කයද KCGI හට ඇත. KCGI අප විසින් ලොව පුරා සිසුන් සක්‍රීයව අප වෙත පිළිගනු ලබන්නේ, ආරම්භයේ පටන්ම අප සතුව තිබූ ආසියාවේ අංක එකේ තොරතුරු තාක්ෂණ වෘත්තීය පාසල බවට පත්වීමේ අරමුණෙහි කොටසක් ලෙසය.

තොරතුරු තාක්‍ෂණය අද අපගේ දෛනික ජීවිතයේදී සහ කර්මාන්තයේ අත්‍යවශ්‍යක අංගයකි. ආශ්‍රිත ක්ෂේත්‍ර ගණනාවකට විවිධාංගීකරණය වී ඇති තොරතුරු තාක්ෂණය මගින් සමාජීය අවශ්‍යතා රාශියක් සපුරාලයි. KCGI සිය විෂය මාලාව නිරන්තරයෙන් සංශෝධනය කර වැඩිදියුණු කරනු ලබන්නේ, එහි උපාධිධාරීන්ට තොරතුරු තාක්ෂණය පිළිබඳ මූලික පුහුණුවක් ලබා දීමටත්, එම පදනම මත උපාධිධාරීන් විසින් තෝරා ගන්නා ක්ෂේත්‍රයන්හි වැදගත් කාර්යභාරයක් ඉටු කිරීමට උපයෝගී වන කුසලතා සහ කාර්මික ලෝකයේ භාවිතා කළ හැකි ප්‍රායෝගික කුසලතා ඔවුන්ට සමීප කරවීම සඳහාත් වේ. 2018 අධ්‍යයන වර්ෂයේදී KCGI විසින් ආකෘති තුනකින් යුත් පාඨමාලා ලියාපදිංචි කට්ටලයක් එළිදක්වන ලදී. සංකේන්ද්‍රණ ක්ෂේත්‍ර මඟින් සිසුන්ට නිශ්චිත ක්ෂේත්‍රයක මූලික දැනුමේ පටන් ව්‍යවහාරික ශිල්පීය ක්‍රම දක්වා වන වෘත්තීය දැනුම ලබා දෙයි. කර්මාන්ත පාඨමාලා මඟින් තොරතුරු තාක්ෂණය යොදාගන්නා සෑම කර්මාන්ත ක්ෂේත්‍රයක් සඳහාම ඵලදායී සැලසුම් සහ නිර්මාණ කුසලතා ඉගැන්වේ. අවසාන වශයෙන්, සිසුන්ගේ විවිධ අධ්‍යයන අරමුණු වලට ප්‍රතිචාර දක්වමින්, බෙස්පෝක් විෂයමාලාව මඟින් යම් ක්ෂේත්‍රයකට අදාළ පුළුල් පරාසයක පාඨමාලා තෝරා ගැනීමට සිසුන්ට ඉඩ ලබා දේ. KCGI හිදී අත්කර ගන්නා ප්‍රායෝගික කුසලතා සහ පුළුල් දැක්මෙහි ප්‍රතිඵලයක් ලෙස, අපගේ උපාධිධාරීන් ජපානයේ සහ ජාත්‍යන්තරව පුළුල් පරාසයක ක්ෂේත්‍රයන්හි වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

KCGI විසින් සප්පෝරෝ සහ තෝකියෝ වලද පරිවාර සරසවි පිහිටුවා ඇත. මෙම පරිවාර සරසවි කියෝතෝ හි ප්‍රධාන පාසලට ඊ-ඉගෙනුම් පද්ධතියක් හරහා සම්බන්ධ කර ඇති අතර එමඟින් සිසුන්ට පරිවාර සරසවියක ඉගෙනුම ලබන අතරතුර නවීනතම තොරතුරු තාක්ෂණ වෘත්තීය අධ්‍යාපනය ලබාගත හැකිය. පාඨමාලා තථ්‍ය කාලීනව (රියල් ටයිම් ලෙස) සිදු කෙරෙන අතර, එමඟින් සිසුන්ට ඍජුවම කැමරාව හරහා මහාචාර්යවරුන්ගෙන් ප්‍රශ්න ඇසිය හැකි වේ. මෙම පාඨමාලා ද පටිගත කර ඇති බැවින් සිසුන්ට අපගේ සර්වරයේ ගබඩා කර ඇති පාඨමාලා නිවසේ සිටම බැලිය හැකිය. කුමන වේලාවක කොතැනක සිටියද, ඉඩ අවකාශයේ හා කාලයේ බාධක ඉක්මවා යමින්, ඉතා උසස් වෘත්තීය අධ්‍යාපනයක් ලබාගැනීමේ හැකියාව සිසුන් සතුය. මීට අමතරව, එක්සත් ජනපදය, චීනය සහ දකුණු කොරියාව ඇතුළු ලොව පුරා උසස් අධ්‍යාපන ආයතන හා සම්බන්ධ වන ශක්තිමත් ජාලයකට KCGI උරුමකම් කියයි. KCGI සිය අධ්‍යාපනික මෙහෙයුම් සක්‍රිය ලෙස වැඩිදියුණු කරගන්නේ මෙම ජාත්‍යන්තර සම්බන්ධතා ජාලය තවදුරටත් පුළුල් කර ගනිමිනි.

වත්මන් ලෝකයේ උද්ගත වන කලබලකාරී වෙනස්කම් මධ්‍යයේ, ඉතා උසස් මට්ටමේ තොරතුරු තාක්ෂණ වෘත්තිකයන් බිහි කිරීම උදෙසා KCGI දැඩි ප්‍රයත්නයක් දරන්නේ අපගේ ආරම්භක දර්ශනය සහ ස්ථාපිත මෙහෙවර හා අරමුණු තුළින් වන මෙහෙයවීමෙනි. ඔබ වැනි අභිලාෂයෙන් අනූන සිසු සිසුවියන්ගේ ආගමනය දෙස මා ඉතා අපේක්ෂාවෙන් බලා සිටිමි.

kcg.edu
The Kyoto College of Graduate Studies for Informatics

# නව යුගයක හැරවුම් ලක්ෂායක් අභියස

## සභාපතිතුමාගේ පණිවුඩය




ව්‍යවහාරික තොරතුරු තාක්ෂණ පාසල් සභාපති සහ ප්‍රධානී,
කියෝතෝ තොරතුරු විද්‍යා උපාධි අධ්‍යයන විද්‍යාලය

**තොශිහිදේ ඉබරාකි** 茨木 俊秀 **Toshihide Ibaraki**

ඉංජිනේරු උපාධිධාරී, කියෝතෝ විශ්ව විද්‍යාලය;
ඉංජිනේරු විද්‍යාව පිලිබඳ ආචාර්ය, කියෝතෝ විශ්ව විද්‍යාලය (ඉලෙක්ට්‍රෝනික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උසස් උපාධිය);
විශ්‍රාමලත් මහාචාර්ය, කියෝතෝ විශ්වවිද්‍යාලය;
කියෝතෝ විශ්ව විද්‍යාලයේ තොරතුරු විද්‍යා පාසලේ හිටපු පීඨාධිපති;
හිටපු මහාචාර්ය, ක්වන්සෙයි ගකුඉන් විශ්වවිද්‍යාලය;
හිටපු මහාචාර්ය, ආරාධිත මහාචාර්ය, ඉලිනොයිස් විශ්ව විද්‍යාලය සහ වෙනත්.
ACM; ජපානයේ තොරතුරු සැකසුම් සංගමය; කාර්මික හා ව්‍යවහාරික ගණිතය පිළිබඳ ජපාන සංගමයේ සාමාජික.

පාඨමාලා: පද්ධති සිද්ධාන්තය පිළිබඳ උසස් මාතෘකා; ප්‍රධාන ව්‍යාපෘතිය


වාෂ්ප එන්ජිම නම් වූ නව ආරක ශක්තිය නිර්මාණය කිරීමත් සමඟම, 18 වන සතවර්ෂයේ පසු භාගයේ සිට 19 වන සතවර්ෂය වෙත කාලයේදී කාර්මික විප්ලවය ඇති වුනි. 20 වන සතවර්ෂයේ පසු භාගය පමණ වන විට ඉල්ලුම මිනිසාගේ නිෂ්පාදන හැකියාව අභිබවා යාමත් සමඟම විදුලිය හා පෙට්‍රෝලියම් භාවිතය තුලින් නිෂ්පාදනයේ වේගය ඉතා සීග්‍රයෙන් වර්ධන. වන්නට විය. එහි ප්‍රතිඵලය වූ, ප්‍රමාණාත්මක බවින් ගුණාත්මක බව වෙත පරිවර්තනය වීම, එවකට මහා පරිමාණ නිෂ්පාදන ක්‍රමයේ යල් පැනවීමට මෙන්ම කුඩා ප්‍රමාණයකින් නමුත් විශාල වර්ගීකරණයක් සහිත නිෂ්පාදනයකට මාරු වීමට හේතු පාදක විය. මෙම වෙනස්වීමේ මහා විප්ලවය අතරතුර, නව සමාජ ක්‍රමයකට මඟ විවර කරමින් ලෝකය තුල කාර්මික සංයුතිය සැලකිය යුතු පරිවර්තනයකට භාජනය වෙමින් පවතී.

මෙම සිධාන්තයම තොරතුරු ලෝකය තුලද ඇතිවෙමින් පවතියි. කෙසේවෙතත්, එහි වේගවත් බව ඉතා වැඩිය. ලෝකය තුල පළමු පරිගණකය නිෂ්පාදනයෙන් 70 වසරක් ගතව තිබුනද ඒවායේ ක්‍රියාකාරී වේගය සහ මතක ධාරිතාව යන දෙකම අදහාගත නොහැකි වේගයකින් දියුණු වෙමින් පවතී. සංඛ්‍යාත්මක කාලගුණ අනාවැකි ලබා ගැනීමෙහි තීරණාත්මක සාධකය වන්නේ කාලගුණික විපර්යාසයන්ට වඩා වේගයෙන් සිදුවන වායුගෝලීය වෙනස්කම් විස්තර කරන අර්ධීය අවකල සමීකරණ විසඳීම සඳහා පරිගණකයේ ඇති හැකියාව වේ. මිනිසාගේ කතාවේ වේගය පාලනය කිරීම සඳහා ශබ්ද විශ්ලේෂණය සහ හඳුනාගැනීම වේගවත් වී තිබේ. පරිගණක මතක ධාරිතාවයට බාධක සැබැවින්ම නොපවතින අතර, සමස්ත ලෝකයෙන් සෑම පොතක්ම ඩිජිටල් දත්ත ලෙස ගබඩා කිරීමට හැකියාව ඇත. ජීවිත කාලය පුරාම මිනිසාගේ දෙනෙත් සහ දෙකන් මඟින් ගන්නා සෑම දත්තයක්ම වාර්තාගත කිරීමට පරිගණකයට හැකියාව තිබේ. අපගේ ජීවන රටාව හා සංස්කෘතියේ ගුණාත්මකභාවය වෙනස් කිරීම සඳහා තොරතුරු බලශක්තියෙහි මෙම වැඩි දියුණු වීම ප්‍රමාණවත් මට්ටමක පවතී.

21 වන ශතවර්ෂයට ඇතුල් වීමත් සමඟම අප තුල ගුණාත්මක වෙනස්වීමේ සලකුනු දක්නට ලැබෙන බව මා හට හැඟේ. ඉතා පහසු ලක්ෂණ ඇතුලත් වීම සහ ප්‍රමාණයෙන් කුඩා කිරීමත් සමඟ, විශේෂයෙන්ම තරුණ පිරිසගේ ජීවන රටාව වෙනස් කරමින් ජංගම දුරකථන සහ ස්මාර්ට්ෆෝන් වලට හිමි ස්ථානය මිනිසාගේ සාක්කුව බවට පත්ව ඇත. අන්තර්ජාලය හරහා සංඥා මඟින් මේ වන විට ක්ෂණිකව ලිපි හා අක්ෂර පමණක් නොව ෆයිබර් ඔප්ටික් කේබල් හරහා පින්තූර සහ වීඩියෝ දත්ත පවා හුවමාරු කර ගත හැකිය. යටිතල පහසුකමක් ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT) ලොව පුරා මූල්‍ය හා ව්‍යාපාර ගෝලීයකරණය කරන අතර ලොව පුරා ජනතාව අතර සෘජු සම්බන්ධතා නිර්මාණය කිරීම හරහා රටවල් හා සමාජවල සාමාන්‍යය ස්වභාවයන් කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරයි. මෙම වෙනස්කම් සියල්ල තුලින්ම ධනාත්මක මඟ පෙන්වීමක් නොවන බව අමුතුවෙන් කිව යුතු නැත. ඊට අමතරව, පරිගණක අපරාධ වැනි සෘණාත්මක ප්‍රතිඵලද නොසලකා හැරිය නොහැකිය. එම අර්ථයෙන් ගත් කල අප සැබවින්ම මෙම පරිවර්තනය තුල සිටින්නෙමු. අප විසින් මානව වර්ගයාගේ අනාගතයේ හැරෙන ලක්ෂායකට එළඹෙන බව පැවසීමට පවා හැකිය.

තොරතුරු විද්‍යාව සඳහා උපාධි අධ්‍යයන පිළිබද කියෝතෝ විද්‍යාලය (KCGI) ආයතනයේ මව් සංවිධානය වන කියෝතෝ කම්පියුටර් ගැකුයින් (KCG) 1963 දී එනම් පරිගණකයේ බිළිඳු අවදියේදී ආරම්භ කරන ලදී. KCG ජපානයේ ප්‍රථම පරිගණක අධ්‍යාපන ආයතනය ලෙස පරිගණකයේ වැඩි දියුණු වීමත් සමග වර්ධනය වූ අතර බොහෝ බලාපොරොත්තු සහිත උපාධිධාරීන් ලොවට බිහි කර ඇත. මෙම සම්ප්‍රදායන් සහ ඉතිහාසයෙහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රථම වරට එය ජපානයේ ප්‍රථම වෘත්තීය උපාධිධාරී පාසල ලෙස හැඳින්වූ අතර, 2003 නොවැම්බර් මාසයේදී එහි ආරම්භය සනිටුහන් කරමින්, 2004 අප්‍රියෙල් මාසයේදී සිය පළමු සිසුන් බඳවාගැනීම සිදු කෙරිණි. මෙම හැරවුම් ලක්ෂයේදී අප සැබවින්ම අපේ ගමන ආරම්භ කර ඇති බව කිව හැක. KCGI ආයතනය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා දිගින් දිගටම කැපවී සිටින අතර, එය සමාජයට බලපාන අන්දම සහ එය නිවැරදි දිශාවකට යොමු කරවන මානව සම්පත වගා කිරීමට අපේක්ෂා කරයි. ඔබ හට කැපවීම සහ අවශ්‍යතාවය ඇත්නම්, ඔබේ වයස, පෞද්ගලික ඉතිහාසය, ජාතිකත්වය හෝ ඔබ පැමිණෙන්නේ මානව ශාස්ත්‍රයෙන් ද විද්‍යාව න්ගෙන් ද යයි නොතකා ඔබ වෙනුවෙන් දොරටු විවෘත වනු ඇත. උපාධි අපේක්ෂක අධ්‍යාපනය අවසන් කර ඇති අය පමණක් නොව, සිය වෘත්තීය ජීවිතය ඉදිරියට ගෙනයාම සඳහා බලාපොරොත්තුවෙන් දැනටමත් ලොව පුර සිටින වැඩිහිටියන් සහ ජපානයේ ඉගෙනුම ලැබීමට කැමති ලොව වටා සිටින සිසුන් හට අප විවෘතව ආරාධනා කරමු.



## KCG හි ලාංඡනය

**kcg.edu**

KCG සමූහය යනු අධ්‍යාපන ආයතන සමූහයක ගෝලීය එකතුවකි. එයට කියෝතෝ තොරතුරු විද්‍යා උපාධි අධ්‍යයන විද්‍යාලය (KCGI); රකුහෝකු සරසවිය, කමෝගාවා සරසවිය සහ කියෝතෝ එකිමේ සරසවිය ඇතුළත් ඇතුළත් කියෝතෝ කොම්පියුටර් ගකුඉන් (KCG); කියෝතෝ ඔටෝමොබයිල් විද්‍යාලය; කියෝතෝ ජපන් භාෂා පුහුණු මධ්‍යස්ථානය; KCG Career ඇතුලත් වේ.

KCG සමූහයේ ලාංඡනය වන "kcg.edu" ලාංඡනය 1995 වසරේදී ලබාගත් අන්තර්ජාල ඩොමේන් නාමයෙන් (www.kcg.edu) ව්‍යුත්පන්න වී ඇත. එය 2003 දී KCG සමූහයේ ප්‍රධාන විධායක නිලධාරි වතරු හසෙගාවා විසින් තෝරා ගන්නා ලද්දකි.

"kcg" යන ඩොමේන් නාමයෙහි අර්ථය ජපානයේ පළමු පරිගණක අධ්‍යාපන ආයතනයේ නම වන "කියෝතෝ කොම්පියුටර් ගකුඉන්" යන්නයි. ".edu" යනු ඉහළ මට්ටමේ වර්ගීය ඩොමේන් නාමයක් (gTLD: ඉහළ පෙළේ අන්තර්ජාල ඩොමේන් නාම වලින් එකක්) වන අතර එය භාවිතා කිරීමට අවසර ඇත්තේ එක්සත් ජනපද ප්‍රතීතන සංවිධාන විසින් අනුමත කරන ලද උසස් අධ්‍යාපන ආයතනවලට පමණි. ".edu" ඩොමේන් නාමය යටතේ සිදුවූ පළමු අධ්‍යාපන ආයතන ලියාපදිංචිය 1985 අප්‍රියෙල් මාසයේදී සිදුවූ අතර, ඒ කොලොම්බියා විශ්ව විද්‍යාලය, කානගී මෙලන් විශ්ව විද්‍යාලය, පර්ඩියු විශ්ව විද්‍යාලය, රයිස් විශ්ව විද්‍යාලය, කැලිෆෝනියා විශ්ව විද්‍යාලය, ලොස් ඇන්ජලීස් හි බර්ක්ලී සහ කැලිෆෝනියා විශ්ව විද්‍යාලය යන ඇමරිකානු උසස් අධ්‍යාපන ආයතන හයක් gTLD ලබාගත් විටය. මෙයින් ටික කලකට පසු, මැසචුසෙට්ස් තාක්‍ෂණ ආයතනය (MIT), හාවඩ් විශ්ව විද්‍යාලය සහ ස්ටැන්ෆර්ඩ් විශ්ව විද්‍යාලය ඇතුළුව එක්සත් ජනපදයේ අනෙකුත් කීර්තිමත් විශ්ව විද්‍යාලද gTLD ලබාගන්නා ලදී.

1989 දී KCG සමූහය විසින් එක්සත් ජනපදයේ MIT සහ අනෙකුත් විශ්ව විද්‍යාල සහ පර්යේෂණ මධ්‍යස්ථාන සමඟ එක්ව එතෙර පුහුණුව හා ශිෂ්‍ය හුවමාරුව සඳහා කේන්ද්‍රස්ථානයක් ලෙස බොස්ටන් සරසවියක් පිහිටුවන ලදී. මෙම ප්‍රයත්නයන්හි ප්‍රතිඵලයක් ලෙස, එක්සත් ජනපද පරිගණක සංවර්ධකයින් සහ අන්තර්ජාල යුගයේ පුරෝගාමීන් විසින් KCG සමූහය විශ්වාසදායක පරිගණක පාසලක් මෙන්ම ".edu" ඩොමේන් නාමය ලැබීම සඳහා සුදුසු උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස පිළිගනු ලැබීය. මෙම gTLD අනුමැතිය ලද ජපානයේ ප්‍රථම අධ්‍යාපන ආයතනය වූයේ KCG සමූහයයි. පසු කාලයේදී, ".edu" ඩොමේන් නාමය එක්සත් ජනපදය තුළ අධ්‍යාපන ආයතනවල භාවිතය සඳහා පමණක් වෙන් කරන ලදී. අද දක්වාම ජපානයේ ".edu" නාමයට හිමිකම් කියන එකම අධ්‍යාපන ආයතනය වන්නේ KCG සමූහයයි.

KCG සමූහය සතු "kdg.edu" ඩොමේන් නාමයේ හිමිකම හරහා KCG සහ KCGI ආයතන එක්සත් ජනපදය තුළ මෙන්ම ජපානය තුළද පිළිගත් උසස් අධ්‍යාපන ආයතන බව සහතික කරයි. වර්තමානයේ මෙම ".edu" ඩොමේන් නාමය අපගේ මූලාරම්භයේ සංකේතයක් ලෙස පවතී.

"kcg.edu" ලාංඡනය මඟින් උසස් තොරතුරු සමාජයක පුරෝගාමී ජීවගුණය නිරන්තරයෙන් අගය කරන අධ්‍යාපන ආයතනයක් ලෙස KCG සමූහය සතු අයෝමය ජීවගුණය විදහා දක්වන අතරම යුගයේ දිශානතිය හැඩගැස්වීමේ හැකියාව සහිත පිරිසක් පුහුණු කිරීම පිළිබඳ අප සතු අධ්‍යාපනික පරමාදර්ශී භාවය පිළිබිඹු කරයි.

## KCG සමූහයේ වර්ණය

**kcg.edu**
The Kyoto College of Graduate Studies for Informatics

### KCG රතු
(කියෝතෝ තොරතුරු විද්‍යා උපාධි අධ්‍යයන විද්‍යාලයේ පාසල් වර්ණය (KCGI))

පාසල් කළමනාකාරිත්වය හැර, KCG සමූහයේ නිර්මාතෘ, සිජියෝ හාසේගාවා, තමන් තරුණ අවධියේ සිටියදී කිරීමට නොහැකි වූ අධ්‍යාපනයට අභියෝග කිරීම සඳහා හාවර්ඩ් විශ්ව විද්‍යාලයේදී ඔහුගේ පසුකාලීන වසරවල නැවතත් අධ්‍යයනය කරන ලදී. ඔහු බොස්ටන් හී අනුනිවාසයක් කුලියට ගෙන තරුණ සිසුන් සමඟ සාහිත්‍ය සහ දර්ශණය පිළිබඳ පන්තියකට සහභාගි විය. නිර්මාතෘ ඉගෙන ගත් හාවර්ඩ් විශ්ව විද්‍යාලයේ පාසල් වර්ණය වන තද රතු වර්ණය මත පදනම් වී, KCGI හි පාසල් වර්ණය KCG නිල් වර්ණයට ප්‍රතිවිරෝධී වර්ණයක් ලෙස KCG රතු ලෙස ස්ථාපිත කර ඇත. මෙයින් වයස හෝ ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ නොසලකා උද්යෝගයෙන් අභියෝග කිරීමට සහ අලුත් දෙයක් ඉගෙන ගැනීමේ ආකල්පය ප්‍රකාශ කරයි.

**kcg.edu**
Kyoto Computer Gakuin

### KCG නිල්
(කියෝතෝ කොම්පියුටර් ගැකුයින් (KCG) සහ KCG සමූහයේ පාසල් වර්ණය)

KCG ස්ථාපිත කිරීම තුළ එහි මුල් සාමාජිකයින් සියලූම දෙනා උපාධිධාරීන් සහ කියෝතෝ විශ්ව විද්‍යාලයේ උපාධි සිසුන් වූ නිසා, KCG සහ KCG සමූහයේ වර්ණය තද නිල් පැහැ ගත් කියෝතෝ විශ්ව විද්‍යාලයේ පාසල් වර්ණය මත පදනම් වී තෝරා ගෙන ඇත. මෙම වර්ණය 1970 සිට භාවිතා කිරීම ආරම්භ කර ඇත. 1998 දී 35 ස් වැනි සංවත්සරයේදී "KCG නිල්" ලෙස වර්ණයක් අපි අර්ථවක් කැළෙමු.

**kcg.edu**
Kyoto Computer Gakuin Automobile School

### KCG තැඹිළි
(කියෝතෝ කොම්පියූටර් ගැකුයින්ඔටෝමොබයිල් පාසලේ පාසල් වර්ණය (KCGM))

කියෝතෝ කොම්පියූටර් ගැකුයින් ඔටෝ මොබයිල් පාසල උසස් තාක්ෂණය සහ තොරතුරු තාක්ෂණය තුළ දැනුම සහිත ස්වයංක්‍රීය යන්ත්‍ර සහ ඉදිරි පරම්පරාවේ ස්වයංක්‍රීය තාක්ෂණයන්ට අදාළවන ජාලකරණය පෝෂණය කරයි. 2013 දී හවුල් වූ KCG සමූහයේ නව සාමාජිකයෙක් වන, KCGM සඳහා, KCG සමූහයට ගෙන ආ එහි නව ජවය ප්‍රකාශ කිරීම සඳහා එහි පාසල් වර්ණය ලෙස අපි තැඹිළි වර්ණය නම් කළෙමු.

**kcg.edu**
Kyoto Japanese Language Training Center

### KCG කොල
(කියෝතෝ ජපන් භාෂා පුහුණු මධ්‍යස්ථානයේ පාසල් වර්ණය (KJLTC))

අන්තර් ජාතික සිසුන් සඳහා, මෙම මධ්‍යස්ථානය KCG සමූහයේ පළමු ප්‍රවේශය වේ. මෙම මධ්‍යස්ථානය අධිකරණ අමාත්‍යාංශය විසින් දැනුම් දෙන ලද ජපාන භාෂා අධ්‍යාපනික පහසුකමක් වන අතර, අධ්‍යාපන, සංස්කෘතික, ක්‍රීඩා, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය විසින් ප්‍රාරම්භක අධ්‍යාපනික විෂයමාලාවක් ලෙස පවරන ලදී. මහාද්දීවීප හතේ හරිත භූමියේ ප්‍රතිරූපයකින්, ඉහත සඳහන් KCG නිල් සහ KCG රතුවලට ප්‍රතිවිරෝධී වර්ණයක් ලෙස පාසල් වර්ණය ලෙස කොල වර්ණය තෝරා ගන ලදී.

# KCGI හි ලක්ෂණ

## සැබවින්ම සමාජය හට ප්‍රයෝජනව ප්‍රායෝගික හැකියාවන් ප්‍රගුණ කිරීම.

**■ කර්මාන්තයේ අවශ්‍යතා සහ තොරතුරු තාක්ෂණයේ උන්නතීන් වලට අනුරූප ලෙස සැකසූ විෂයමාලා සැලසුම්**

KCGI හි විෂයමාලා, පාඨමාලා සැලසුම් සහ උපෙද්ශාත්මක සැලසුම් කර්මාන්තයේ අවශ්‍යතා අනුව අනුවර්තනය කරන ලද අධ්‍යාපනයක් ප්‍රවර්ධනය කිරීම සඳහා පාසල තුල සහ බාහිර විශේෂඥයින්ගෙන් උපදෙස් ලබා ගැනීමෙන් නිර්මාණය කරනු ලබයි. මීට අමතරව තොරතුරු තාක්ෂණයේ (ICT) වේගවත් වෙනස්කම්වලට සරිලන පරිදි එක්සත් ජනපදයේ රෝචෙස්ටර් තාක්ෂණික ආයතනය සමඟ වන සහයෝගීතාවයන් පදනම්ව ලොව විශිෂ්ටතම තොරතුරු තාක්ෂණ අධ්‍යාපන විෂය මාලා ආනයනය කර ඒකාබද්ධව සංවර්ධනය කර ඇත.

**■ පුහුණුව හොඳින් පදනම් වූ විෂයමාලා සංයුතිය**

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) හා කළමනාකරණ කුසලතා ඇති මානව සම්පත් වර්ධනය කිරීම අරමුණු කොටගෙන, සිසුන් තුල තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය සඳහා පමණක් නොව, කළමනාකරණ හා ආර්ථික විද්‍යාව වැනි එම ව්‍යාපාරයට සම්බන්ධ අනෙකුත් විෂයන් සඳහා ද තිබිය යුතු නිපුණතා පිළිබඳව KCGI අවධානය යොමු කරයි. KCGI හි සිසුන් ඔවුන්ගේ අවසන් වසර තුළ ශාස්ත්‍රපති උපාධි නිබන්ධනය වෙනුවට ඔවුන් විසින් සැලසුම් කරගත් ප්‍රධාන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනුයේ ඔවුන්ගේ වෘත්තීය ජීවිතය සනාථ කරගැනීමට අවශ්‍ය කරන උසස් මට්ටමේ නිපුණතා වලින් සන්නද්ධ වෙමිනි.

**■ ඉ-ඉගෙනුම් සහ පන්ති කාමරයේ ඉගෙනීම තුලින් ඵලදායි අධ්‍යාපන ක්‍රම අනුගමනය කිරීම.**

එක්සත් ජනපදයේ කොලම්බියා විශ්ව විද්‍යාලය හි මහාචාර්යවරුන්ගෙන් බලගතු සහායක් ඇතිව, KCGI විසින් ඉහළ මට්ටමේ තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය සාක්ෂාත් කර ගැනීමට අරමුණු කරයි. පන්ති තුල උගන්වන සහ ඒවා ගෙන ඇති ආකාරයේ නම්‍යශීලීභාවය, සිද්ධි අධ්‍යයනය, ක්ෂේත්‍ර ක්‍රියාකාරිත්වය, කණ්ඩායම් වැඩ සහ සාකච්ඡා වල ඇතුළු පාඨමාලා වල සංයුතියේ ඇති ප්‍රයෝගික බව සහ විවිධ බව පිළිබඳව අවධාරණය කරයි. මීට අමතරව, KCGI පූර්ණ-ක්ෂේත්‍ර ඉ-ඉගෙනුම් ස්ටුඩියෝවක් ස්ථාපනය කර ඇති අතර ඉ-ඉගෙනුම් සහ පන්ති කාමරය තුල ඉගෙනීම භාවිතයෙන් ඵලදායී අධ්‍යාපනයක් ක්‍රියාත්මක කරයි.

## තොරතුරු තාක්ෂණය (ICT) සහ කළමනාකරණය සමබරතාවයකින් යුතුව අධ්‍යයනය කරන්න.

**■ තොරතුරු තාක්ෂණය සහ කළමනාකරණය වැනි විවිධ ක්ෂේත්‍රවල සේවයේ යෙදිය හැකි වෘත්තිකයන් බිහිකිරීම**

අන්තර්ජාල තාක්ෂණය මුඛ්‍ය ප්‍රතිෂ්ඨාව කොටගෙන තොරතුරු තාක්ෂණ (ICT) කුසලතා සහ කළමනාකරණ උපාය මාර්ග නිර්මාණය කිරීම වැනි කළමනාකරණ කුසලතා යන දෙඅංශයේම දක්ෂතා ඇති පුද්ගලයින්ට, වර්තමානයේ ව්‍යාපාර ක්ෂේත්‍රය තුළ ඉල්ලුම ඇත. KCGI තුලින් තොරතුරු සහ කළමණාකරණය වැනි විශේෂිත ක්ෂේත්‍ර ගණනාවක් පිළිබඳව අවබෝධය සහිත වෘත්තිකයින් බිහි කරයි. ඔවුනොවුන්ගේ පුද්ගලික පසුබිම්වලට ගැලපෙන පරිදි ඉතා හොඳ සමබරතාවකින් යුතුව තොරතුරු සහ කළමනාකරණය ඉගෙනීම සඳහා පාඨමාලා සකස් කර ඇත.

**■ ආයතනික හා වෙනත් තොරතුරු තාක්ෂණ උපාය මාර්ග සංවර්ධනය පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් සහිත උපදේශකයින් ගණනාවක් පත් කිරීම**

වෘත්තිකයන් බිහි කිරීම සඳහා KCGI විසින් ඉහල පෙළේ සමාගම්වල ප්‍රධාන තනතුරු දරන්නන් ලෙස සේවය කරන අත්දැකීම් සහිත උපදේශකයන් වැනි ප්‍රායෝගික පළපුරුදු ගුරු භවතුන් රැසක් පත් කරනු ලබයි. අපගේ එම ගුරු කාර්ය මණ්ඩලය ඔවුන්ගේ සැබෑ අත්දැකීම් මත පදනම්ව පාඨමාලා තුලින් සිසුන්ගේ ප්‍රායෝගික කුසලතා බිහි කරන ලබයි ප්‍රායෝගික භාවිතයට සෘජුවම සම්බන්ධ වූ නවීන න්‍යායන් හා තාක්ෂණය පිළිබඳ ඔවුන්ගේ අවබෝධය වැඩි කර ගනිමින් සිසුන් විසින් පුළුල් වෘත්තීය නිපුණතා අත්කර ගනී.

## වෘත්තීය මාර්ග වෙනස් කර තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය තුළ ජය ගන්න.

**■ මානව ශාස්ත්‍ර හෝ විද්‍යා ආදී පුළුල් පරාසයක ක්ෂේත්‍රයන් වල සිසුන්ට ඇතුල් විය හැකිය**

KCGI හි එක් පරමාර්ථයක් වනුයේ පුළුල් පරාසයක පසුබිම් වලින් සන්නද්ධ උසස් තොරතුරු තාක්ෂණ වෘත්තිකයන් සංවර්ධනය කිරීමයි. ඔවුන් උපාධිය ලැබීමට අපේක්ෂා කරන දෙපාර්තමේන්තු හෝ ප්‍රධාන අධ්‍යයන අංශ වලට සීමා පැනවීමකින් තොරව මානව ශාස්ත්‍රයන් මෙන්ම විද්‍යා අංශ වලද විවිධ ක්ෂේත්‍රයන්ගෙන් විවිධ පරාසයක අයදුම්කරුවන් අපි බඳවා ගන්නෙමු. KCGI පුළුල් පරාසයක පසුබිම් සහිත සිසුන්ට සහාය වන්නේ දැනට ඔවුන් සතු දැනුම, කුසලතා සහ අවශ්‍යතාවන්ට සරිලන තෝරා ගත හැකි පාඨමාලා ඔවුන් වෙත පිරිනමමිනි. රැකියාවක නියුතු වැඩිහිටියන්ට රැකියාවේ යෙදී සිටියදී දිගටම ඉගෙනීමේ අවස්ථාව ලබා දීම සඳහා, KCGI විවිධාකාර ඉගෙනුම් විකල්පයන් වල පහසුකම ලබාදේ. මෙතෙක් ජපානයේ උපාධි පාසල් විසින් සාම්ප්‍රදායිකව නිසි අයුරින් ලබා නොදුන් වෘත්තීය මාර්ග වෙනස් කිරීම සඳහා මඟපාදන අවස්ථාවන් අපි නිර්මාණය කර දෙන්නේ අභිමානයෙනි.

**■ ඔබ KCGI වෙත ගෙන එන දැනුමට ගැළපෙන පාඨමාලා තෝරා ගන්න**

KCGI හි තොරතුරු තාක්ෂණ අධ්‍යයනයේ ශිෂ්‍යයින්ගේ කුසලතා මට්ටම් විවිධාකාර වන අතර, පරිගණක පිළිබඳ අල්ප දැනුමක් සහිත මානව ශාස්ත්‍ර උපාධිධාරීන් මෙන්ම තොරතුරු තාක්ෂණ අංශයේ සේවයේ නියුතු පද්ධති ඉංජිනේරුවන්ද ඒ අතර වේ. මේ එක් එක් ශිෂ්‍යයාට ඇති තොරතුරු තාක්ෂණ හැකියාවන් සහ අනාගත ඉලක්ක මත පදනම්ව KCGI විසින් ප්‍රශස්ත පඨමාලා රටාවන් පිරිනමනු ලබයි. ක්ෂේත්‍රය පිලිබඳ පසුබිමකින් තොර සිසුන් හටද මෙමගින් අදියර කිහිපයක් තුලදී ඉතා පහසුවෙන් ඔවුන්ගේ අරමුණු කරා ලඟා වීමට හැකියාව ඇත. දැනටමත් ක්ෂේත්‍රයේ මූලික දැනුමක් ඇති සිසුන්ට වඩාත් විශේෂිත පාඨමාලා සමඟින් සිය අධ්‍යයන කටයුතු ආරම්භ කළ හැකි අතර, ඔවුන්ගේ හැකියාවන් ඵලදායී ලෙස වර්ධනය කර ගැනීමට සහ ඒවා වැඩි දියුණු කරගැනීමට හැකියාව ලැබේ.

## අප ඉලක්ක කරන්නේ ගෝලීය මට්ටමේ සක්‍රිය භූමිකාවකි

**■ ලොව පුරා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ නායකයින් විසින් පවත්වනු ලබන පාඨමාලා**

තොරතුරු තාක්ෂණ ව්‍යාපාරය ගෝලීයව හා ජාතික මායිම් හරහා සංවර්ධනය වන ක්ෂේත්‍රයකි. KCGI විසින් සිසුන්ගේ ජාත්‍යන්තර අපේක්ෂාවන් අත්පත් කර ගැනීමට උපකාර කිරීමට උතුරු ඇමරිකාව හා ආසියාව ඇතුළු ලොව පුරා කලාපයන්ගෙන් උසස් තත්වයේ විශ්ව විද්‍යාලවල මහාචාර්යවරුන් හට ඇරයුම් කරනු ලබයි. KCGI ඇමෙරිකාවේ රෝචෙස්ටර් තාක්ෂණික ආයතනය හා තොරතුරු ආරක්ෂණය පිලිබඳ ලොව ඉහල පෙලේ වැඩසටහනක් වන කොරියානු විශ්ව විද්‍යාලයේ තොරතුරු ආරක්ෂාව පිළිබඳ උපාධිධාරී පාසල ඇතුළු ලොව පුරා විශ්ව විද්‍යාල සමඟ සහයෝගිතා ගිවිසුම් හා ව්‍යාපාර සහයෝගීතාවයන් නිමා කරයි. KCGI හවුල් පර්යේෂණ හා අන්තර්ජාතික දාර්ශනිකයින්ගේ සම්මන්ත්‍රණ වැනි ජාත්‍යන්තර සබඳතා වර්ධනයට ද සහභාගී වීම සඳහා අවධානය යොමු කොට ඇත.

### ඉංග්‍රීසි මාදිලියේ පරිපූර්ණ පන්ති මාලාවක් හරහා ගෝලීය භූමිකාවක් සහිත වෘත්තිකයින් වීමට අපි සිසුන් පුහුණු කරන්නෙමු.

KCGI විසින් ඉංග්‍රීසි මාදිලියෙන් පිරිනැමෙන බොහෝ පන්ති හරහා, සිසුන්ට තනිකරම ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් ඔවුන්ගේ පාඨමාලා සම්පූර්ණ කර ශාස්ත්‍රපති උපාධිය ලබා ගැනීමට අවස්ථාව ලබා දේ. මෙම පාඨමාලා ගණනාවක්ම උගන්වනු ලබන්නේ ඉතා කීර්තිමත් විදේශීය මහාචාර්යවරුන් විසිනි. උපාධි අපේක්ෂක හා උපාධිධාරී සිසුන් ඇතුළුව රටවල් 17 කට වැඩි ගණනක සිසුන් KCGI හි අධ්‍යාපනය ලබයි. බොහෝ දෙනෙක් ඉංග්‍රීසියෙන් උගන්වන පාඨමාලා තෝරා ගනියි. බොහෝ සිසුන් ඉංග්‍රීසි භාෂාවෙන් පැවැත්වෙන පන්ති තෝරා ගනී. අවශ්‍ය ඉංග්‍රීසි ප්‍රවීණතා මට්ටම් සපුරාලන්නේ නම් ජපන් සිසුන්ටද ඉංග්‍රීසි මාදිලියෙන් ඉගෙනීමේ හැකියාව ඇත. මෙම සාර්වභෞමික පරිසරයෙහි ප්‍රතිලාභ උපයෝගී කර ගනිමින් මෙම සිසුන් තොරතුරු තාක්ෂණය හදාරන අතරතුර ඔවුන්ගේ ඉංග්‍රීසි දැනුම වැඩි දියුණු කරගැනීම පමණක් නොව ජාත්‍යන්තර මනෝභාවයක් අත්කර ගැනීමද සිදුකරයි.



Premathilaka Shashikala Nimanthi (S)

Student enrolled in KCGI in April 2018, Graduate of Rajarata University



Koichi Hasegawa (H)

Professor of KCGI

*Student Interview*

Professor Hasegawa (H): Hi, how are you?
Premathilaka Shashikala Nimanthi (S): I'm very fine, thank you.
H : OK, let's talk about your life at KCGI. First, please relax (ha-ha).
S : Thank you.
H : How is your life in Japan?
S : Before I came to Japan, I really admired Japanese culture and life. I especially liked the self-discipline and self-control of Japanese people. The only difficult thing is Japanese language.
H : I see. How did you learn about our graduate school?
S : I wanted to do my Master's degree outside of Sri Lanka. So, I searched many universities. At that time, a Sri Lanka agency introduced me to KCGI. I learned that KCGI has Master courses that can be taken in English and Japanese. Then, I searched the KCGI's online website, where I found details about the school, courses and especially about job focus areas. I was really happy because I could come to Japan.
H : So, you are interested in Information Technology....
S : Yes, my undergraduate degree was in Information and Communication.
H : How are your studies going so far?
S : I am really enjoying my studies here. I have learned so much interesting and useful things across many IT fields. And the KCGI professors are teaching me a lot. They have much knowledge and experience to share. I have learned a lot of things from them, and also have done self-study using the class materials. It's been a really good experience.
H : What is your concentration?
S : My concentration is ERP.
H : Do you have any favorite courses?
S : Yes, I enjoy all courses especially, "International Accounting" and "Computer Organization Theory".
H : In the future, do you want to take a job related to ERP?
S : Yes, after I graduate, I want to start my career as an ERP consultant. Before I came to Japan, I worked as a project manager. While I am here, I wish to pursue a job as an ERP consultant.
H : Are you planning to take the test for ERP qualification?
S : Yes, my professor always recommends me to take extra examinations. I will register for the SAP ERP examinations soon.
H : After you graduate from KCGI, do you want to stay in Japan and find a job?
S : Yes, I would prefer to find a job here in Japan. I want to work in a company which has branches all over the world so I can get more work experience in different environments. One day I would like to return to Sri Lanka and give back to my country. That is my target. I have been given so many things from my country so I feel it is my responsibility to give back my knowledge.
H : I see. Thank you for your time and cooperation.

## සමාජය තුළ බැබලීමට ඔබ අධ්‍යයනයන්ගෙන් සන්නද්ධ වන්න.

**■ තනි මාර්ගෝපදේශයක් යටතේ ඔබට සුදුසු රැකියාව යථාර්තයක් බවට පත්කර ගැනීම උදෙසා**

KCGI හි අරමුණ වන්නේ සියලුම සිසුන්ට උපාධිය ලැබෙන අවස්ථාව වනවිට රැකියා සොයා ගැනීමට අවස්ථාව ලබා දීමයි. මේ සඳහා සිසුන් භාර උපදේශකයින් සිසුන් වෙනුවෙන් කාර්මික හා වෙනත් ප්‍රජාවන් තුළ තමන් සතු අත්දැකීම් සහ පුද්ගලික ජාලයන් උපයෝගී කරගනී. එක් එක් ශිෂ්‍යයා සමඟ වෙන වෙනම සාකච්ඡා කිරීමෙන් උපදේශකයින් සිසුන්ට ඔවුන්ගේ සිහින වෘත්තීන් සොයා ගැනීමට උපකාර කරයි. මීට අමතරව, KCGI ආයතනය තම ව්‍යාපාර ආරම්භ කිරීමට බලාපොරොත්තු වන සිසුන් සඳහා ව්‍යාපාරයක් ස්ථාපිත කිරීම, කළමනාකරණය කිරීම හා මෙහෙයවීම වැනි අංශ තුල අවශ්‍යය දැනුම ලබා දීම මගින් පුළුල් වූ සහයක් ලබා දෙයි.

**■ උපාධිධාරීන් අතර ව්‍යාපාරික ජාල වර්ධනය කිරීම**

සෑම වසරකම KCGI විසින් තොරතුරු තාක්ෂණයේ ප්‍රධාන අංගයන් කෙරෙහි අවධානය යොමු කරමින් බොහෝ සහ විවිධත්වයෙන් යුත් උපාධිධාරීන් බිහිකරනු ලබන අතර මෙම උපාධිධාරීන්ගෙන් සමන්විත ව්‍යාපාරික ජාලයක් වර්ධනය කිරීම කෙරෙහි KCGI අවධානය යොමු කරයි. ශිෂ්‍ය කාලය තුළදී කණ්ඩායම් කටයුතුවල නිරත වීමට සිසුන්ට අවස්ථා ගණනාවක් ලබා දීම මගින් උපාධි ලබා ගැනීමෙන් පසු එකිනෙකා සතු සුවිශේෂී නිපුණතා වර්ධනය කර ගැනීමටත්, ව්‍යාපාර සංවර්ධනය හා ව්‍යාප්තිය සඳහා සහය දැක්වීමටත් KCGI කටයුතු කරයි.



# පරිසරය

ලෝක මට්ටමේ ව්‍යාපාර පද්ධති ඇතුළත් අධ්‍යාපනික SAP පද්ධතිය ඇතුලත් ප්‍රායෝගික අධ්‍යාපන පරිසරයක්

## අධ්‍යාපනික SAP පද්ධතිය

**■ SAP හි ERP පැකේජය තුළින් සැබවින්ම ප්‍රායෝගික කුසලතා වර්ධනය කිරීම**

සාම්ප්‍රදායික විශ්ව විද්‍යාලවල හා උපාධිධාරී පාසැල්වල තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය බොහෝ විට එය ව්‍යාපාරය තුල භාවිතා කළ හැක්කේ කෙසේද? යන්න පිලිබඳව ඇති දැක්මෙන් තොර වෙයි. විශේෂයෙන් ම මේ වන විටද ව්‍යාපාර හා දෙපාර්තමේන්තු ඒකාබද්ධතාවය වැනි සැබෑ ව්‍යාපාරික කටයුතුවලදී සැබෑ ලෝකය තුළ ඇති තොරතුරු තාක්ෂණය යොදාගත හැකි ආකාරයේ පසුබිමක් නැත.

KCGI විසින් ව්‍යවසාය අධ්‍යාපන කටයුතු සඳහා සම්පත් සැලසුම්කරණය (ERP) මෘදුකාංගය, ලොව ප්‍රමුඛ පෙළේ ERP පැකේජ අලෙවිකරුවන්ගෙන් එකක් වන SAP AG වෙතින් මිලට ගෙන උසස් තත්වයේ තොරතුරු තාක්ෂණික මානව සම්පත වගා කිරීම වෙනුවෙන් භාවිත කරනු ලබයි. මෙම ව්‍යවසාය සම්පත් සැලසුම් (ERP) ක්‍රමය සමාගම් 437,000 ක් පමණ භාවිතා කරන්නේ එහි පර්යන්ත මෘදුකාංග භාවිතා කරන සමාගම් ද ඇතුළුවයි (2020 මාර්තු වන විට SAP සංඛ්‍යාංක). ප්‍රධාන සමාගම් අතර, ෆෝබ්ස් ග්ලෝබල් 2000 හි සමාගම් වලින් 92% ක් SAP ERP භාවිතා කරයි.

ව්‍යාපාර පරිපාලනය සහ තොරතුරු කළමනාකරණය පිළිබඳ අධ්‍යාපනය ලබා දීම සඳහා වෙනත් අධ්‍යාපනික ආයතන විසින් මෙම ක්‍රමය සම්ප්‍රදායිකව භාවිතා කර ඇත. කෙසේ වෙතත් KCGI හි එක් විශේෂ ලක්ෂණයක් වන්නේ, ජපානය තුල ප්‍රථම ජපන් තොරතුරු තාක්ෂණ වෘත්තීය උපාධිධාරී පාසලේ එනම් KCGI හි පමණක් පද්ධති සංවර්ධනය ඇතුළත් සැබෑ ERP වෘත්තීය අධ්‍යාපනයක් සැපයීමට මෙම මෘදුකාංගය භාවිතා කිරීමයි.

# ඊ-ඉගෙනුම් පද්ධතිය

කියෝඹතෝ හි ප්‍රධාන සරසවිය පරිවාර සරසවි සහ වෙනත් ස්ථාන සමඟ සම්බන්ධ කිරීම, දේශන තථ්‍ය කාලීනව විකාශනය කිරීම සහ සිසුන්ට පුළුල් දුරස්ථ ඉගෙනුම් පරිසරයක් ලබාදීම සඳහා KCGI අති නවීන ඊ-ඉගෙනුම් පද්ධතියක් භාවිතා කරයි.

KCGI විසින් නවතම ඉ-ඉගෙනුම් පද්ධතිය භාවිතා කරමින් කියෝතෝ සමඟ සප්පොරෝ හා තෝකියෝව සම්බන්ධ කරන රියල් ටයිම් පාඨමාලා සපයයි (සමමුහුර්ත ඊ-ඉගෙනුම). අප විසින් KING-LMS මත ගබඩා කර ඇති අධ්‍යයන අන්තර්ගතය භාවිත කරමින් සිසුන්ට ඕනෑම වේලාවක, ඕනෑම තැනක සිට අන්තර්ජාලය හරහා ඉගෙන ගත හැකිය. මෙම නවෝත්පාදනයන් උපකාරයෙන් KCGI සම්පූර්ණයෙන්ම අන්තර්ජාලය හරහා ලබාගත හැකි බොහෝ පාඨමාලා සිසුන් වෙත ඉදිරිපත් කරයි (අසමමුහුර්තක ඊ-ඉගෙනුම්).

*KING-LMS (KCG තොරතුරු ජාල ගැලැක්සි-ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය): KCGI විසින් හිමිකම් දරන අධ්‍යයන කළමණාකරණය හා ආධාරක පද්ධතිය අවශ්‍යය පරිදි නිදහස් ලෙස අන්තර්ගතය අධ්‍යයනය සිදු කිරීමට හැකියාව ලබා දේ.

**■ රැකියාවෙහි නියුතු කාර්යබහුල වැඩිහිටියන් සඳහා ඉගෙනීමට සහාය වීම**

මෑත වසරවලදී උපාධිධාරී පාසැල්වල අධ්‍යාපනය ලබන අතරතුර තම වෘත්තීය කුසලතා වර්ධනය කර ගැනීමට සහ රැකියා වෙනස් කිරීමට බලාපොරොත්තු වන වැඩිහිටියන් ප්‍රමාණය වැඩිවෙමින් පවතී. රැකියාවෙහි නියැලෙන අතරතුර අධ්‍යයන කටයුතු සිදුකරමින් ඉහළ මට්ටමේ තොරතුරු තාක්ෂණ වෘත්තිකයන් බවට පත්වීමට අපේක්ෂා කරන මෙවන් සිසුන් හට KCGI සහාය දක්වයි.




# ක්‍රියාකාරී ක්ෂේත්‍ර

සාම්ප්‍රදායික තොරතුරු තාක්ෂණයේ සංකීර්ණත්වය වැඩි වීමත් සමඟම (ICT) තොරතුරු තාක්ෂණ (IT) හඳුන්වාදීම (විශේෂයෙන් අන්තර්ජාල ව්‍යාපාර තාක්ෂණය ව්‍යාප්ත වීමත් සමඟ) මේ වන විට කර්මාන්ත ක්ෂේත්‍රය මුහුණ දෙන අභියෝගයක් වී ඇත. සාමාන්‍යය ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීමේ මාධ්‍යයක් ලෙස පමණක් භාවිතා කිරීමට වඩා, අද වන විට තොරතුරු තාක්ෂණය ඉහළ මට්ටමේ ව්‍යාපාරික උපාය මාර්ග නිර්මාණය කිරීම සඳහාද භාවිත කිරීමේ නැඹුරුවක් ඇත. මෙයින් අදහස් වන්නේ ව්‍යාපාර කළමනාකරණයෙහි ඉහළ මට්ටම් වලට තොරතුරු තාක්ෂණය හඳුන්වා දීමයි; මේ සඳහා සම්බන්ධ වන මානව සම්පත හට ඉහළ මට්ටමේ දැනුමක් හා නිපුණතාවයන් මෙන්ම ඉහළ මට්ටමේ කළමනාකරණ අවබෝධයක් ද අවශ්‍ය වේ. ක්ෂේත්‍රයට අවශ්‍ය උසස් මට්ටමේ තොරතුරු තාක්ෂණ හැකියන් බිහි කිරීම පිණිස KCGI විසින් විෂය මාලා නිර්මාණය කර ඇත. KCGI හි උපාධිධාරින් පහත වෘත්තීන් වැනි තොරතුරු තාක්ෂණ හා සම්බන්ධ රැකියාවන්හි නිරත වේවි කියා බලාපොරොත්තු වේ.

### CIO (ප්‍රධාන තොරතුරු නිලධාරී)

සමාගම්වල තොරතුරු තාක්ෂණ යෙදුම් වර්ධනය වෙමින් පවතින අතරතුර ව්‍යාපාර කළමණාකරණයෙහි පදනම හට තොරතුරු තාක්ෂණය වැඩි වැඩියෙන් උපයෝගී කරගැනීමට සිදුවන හෙයින්, සමාගම් විසින් කළමණාකරණ ක්‍රමෝපායන් සැලසුම් කිරීමෙහි හැකියාව ඇති සහ ව්‍යාපාර කළමණාකාරිත්වයේ කොටස්කරීත්වය ගත හැකි ප්‍රධාන තොරතුරු නිලධාරීන් ඉල්ලුම් කිරීමේ වර්ධනයක් දක්නට ඇත. ප්‍රධාන තොරතුරු නිලධාරීන් යනු සමාගම් කළමණාකරණ ක්‍රමෝපායන් සැලසුම් කිරීමෙහි ලා ඉහළ මට්ටමේ වෘත්තිකයන් වන අතර සමාගමේ කළමනාකාරිත්වයේ කොටසක් ලෙස කටයුතු කරනු ලබන, ඉහත කී කළමනාකරණ සැලසුම් සාක්ෂාත් කරගැනීමෙහිලා අවශ්‍යය පසුබිම් සකස් කරන්නාවූ මෙන්ම ආයතනයක් සතු ඇති විශාල වූ කළමනාකරණ දැනුම් සම්භාරය ඵලදායී තොරතුරු පද්ධතියක් බවට හරවනු ලබන පුද්ගලයින් වේ.

### ව්‍යාපෘති කළමනාකරු

තොරතුරු තාක්ෂණය හඳුන්වාදීම ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘති නායකයෙකු වශයෙන් ව්‍යාපෘති කළමනාකරුගේ කාර්යභාරය වැදගත් වේ. ව්‍යාපෘති කළමනාකරුවන් යනු අභ්‍යාන්තර කළමණාකරණ සම්පත් ඵලදායීව උපයෝගී කරගැනීම පිළිබඳව සැලකිලිමත් වන, කළමනාකරණය පුළුල් ලෙස සිදුකිරීමට මෙන්ම ප්‍රශස්තකරණයට හැකියාව ඇති සහ නවීන තොරතුරු තාක්ෂණය නිසි අයුරින් හඳුන්වා දෙන උසස් වෘත්තිකයන් වේ. එබැවින් තොරතුරු තාක්ෂණ සහ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳව ව්‍යාපෘති කළමනාකරුවන්ට පුළුල් දැනුමක් තිබිය යුතු වේ. මීට අමතරව, ව්‍යාපෘති කළමනාකරුවන් විශාල පුද්ගලයින් ප්‍රමාණයක් හා විවිධ තනතුරු ගණනාවක් හා සම්බන්ධ වන අන්තර්-දෙපාර්තමේන්තු ව්‍යාපෘතිවලට සහභාගී වන බැවින් ඔවුන් හට උසස් මට්ටමේ සන්නිවේදනය සහ නායකත්ව හැකියාවන් ද අවශ්‍යය වේ.

### ජොෂ්ය එස්.ඊ, වෙබ් පද්ධති නිර්මාණ ශිල්පියා

ජොෂ්ය එස්.ඊ යනු ව්‍යාපෘති කළමණාකරුවන්ට සහ ඔවුන්ගේම ව්‍යාපෘති කළමනාකරණය සිදු කරගන්නා ඉංජිනේරුවන්ය. ජොෂ්ය එස්.ඊ වරුන් තාක්ෂණික දැනුම පමණක් නොව, පිරිවැය සහ කාර්ය ප්‍රවාහය වැනි කළමනාකරණ සාධක පිළිබඳවද ගැඹුරු අවබෝධයක් තිබිය යුතුය. වෙබ් පද්ධති නිර්මාණ ශිල්පීන් ව්‍යාපෘති කළමනාකරුවන්ගේ සහ ජොෂ්ය එස්.ඊ වරුන්ගේ විධිවිධාන පිළිපදින අතරතුර නවීන තාක්ෂණික නිපුණතාවන් උපයෝගී කරගනිමින් පද්ධතිවල සැබෑ සංවර්ධනය සඳහා කටයුතු කරයි.

### පද්ධති ඒකාබද්ධ කිරීමේ උපදේශක

ගෘහස්ථ තොරතුරු තාක්ෂණ කුසලතා නොමැති වීම නිසා ජපන් සමාගම්වල තොරතුරු තාක්ෂණය හඳුන්වාදීම සඳහා බාහිර උපදේශකයන්ගේ ඉල්ලුම වැඩිවෙමින් පවතී. පද්ධති ඒකාබද්ධ කිරීමේ උපදේශක යනු සේවාලාභී සමාගමේ කළමනාකරණ සැලසුම් වලට අනුව ව්‍යාපාරික පද්ධති සැලසුම් කිරීම සම්බන්ධව උපදේශනය සපයන සහ වර්තමානයේ දැඩි තරඟකාරීත්වයකින් යුතු ජාත්‍යන්තර ව්‍යාපාර පරිසරය තුල සාර්ථකත්වයට පත් වීමට උර දෙන ආයතන අතර ඵලදායී ලෙස සබඳතා ඇති කිරීමට අවශ්‍ය කුසලතා වලින් හෙබි උසස් වෘත්තිකයන් වේ. පද්ධති ඒකාබද්ධ කිරීමේ උපදේශකවරුන් විසින් සේවාලාභීන්ගේ අවශ්‍යතා හොඳින් තේරුම්ගෙන ඒවාට ප්‍රතිචාර දැක්විය යුතු බැවින් ඔවුන් හට ශක්තිමත් තොරතුරු තාක්ෂණ, කළමනාකරණ සහ සන්නිවේදන කුසලතා තිබිය යුතුය.

### වෙබ් අලෙවිකරණ වෘත්තිකයන්

වෙබ් අලෙවිකරණ වෘත්තිකයන් යනු ඉ-ව්‍යාපාර ක්‍රියාත්මක කිරීමට, ඉ-ව්‍යාපාර වෙබ් අඩවි නිර්මාණය, වෙබ් නිපුනතාවයන් ලබා ගැනීම, අන්තර්ජාලය හරහා සේවා සැපයීම සඳහා උපක්‍රම සම්පාදනය කිරීමේ හැකියාව ඇති, පාරිභෝගිකයන්ගේ අන්තර්ජාල හැසිරීම අවබෝධ කර ගැනීම සඳහා අවශ්‍යය වන අලෙවිකරණ ශිල්පීය හැකියාවන් ඇති උසස් වෘත්තිකයින් වේ. වෙබ් අලෙවිකරණ වෘත්තිකයන් හට ව්‍යාපාර ගනුදෙනු සම්බන්ධයෙන් පුළුල් දැනුම මෙන්ම බෙදාහැරීම් පද්ධති හා වෙබ් ආරක්ෂාව වැනි ජාල සම්බන්ධයෙන් උසස් දැනුමක් හා නිපුණතාවයන් තිබිය යුතුය.

### පද්ධති නිර්මාණ ශිල්පීන්

පද්ධති නිර්මාණ ශිල්පීන් යනු සමාගම්වල තොරතුරු තාක්ෂණ සැලසුම් කෙටුම්පත් සැකසීමේ ගැටළු විශ්ලේෂණය කරන, විසඳුම් සොයා ගැනීම සඳහා රාමු නිර්මාණය කිරීම සිදු කරන, සංකීර්ණ වෙමින් පවතින ක්‍රමවේදයන් ඒකාබද්ධ කරන නව පද්ධති ව්‍යුහය නිර්මාණය කිරීම සිදු කරන උසස් මට්ටමේ වෘත්තිකයන් වේ. පද්ධති නිර්මාණ ශිල්පීන්ගේ ක්‍රමෝපායික කෙටුම්පත් සැබෑ පද්ධති සංවර්ධනය සමඟ සම්බන්ධ කිරීම මගින් ඔවුහු කේන්ද්‍රීය භූමිකාවක් රඟ දක්වයි. ඒ අනුව ඔවුන් හට තොරතුරු තාක්ෂණ කුසලතා පමණක් නොව ව්‍යාපාර පරිපාලනය සහ කළමනාකරණය පිළිබඳ පුළුල් දැනුමක් අවශ්‍ය වේ.

### තොරතුරු ආරක්ෂක උපදේශක

තොරතුරු තාක්ෂණ ජාලයන් ඉ-වාණිජය හා අයි.ඕ.ටී. යථාර්ථයක් කිරීම සඳහා අත්‍යවශ්‍ය යටිතල පහසුකම් වේ. කෙසේ වෙතත්, මෙම ජාල සඳහා ආරක්ෂක අවදානම තවදුරටත් පුළුල් වෙමින් පවතී. තොරතුරු ආරක්ෂණ උපදේශකයකු විසින් තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්ති සැකසීම සහ තොරතුරු වත්කම් සුරක්ෂිත කිරීම සඳහා පාරිභෝගිකයින්ට උපදෙස් සහ සහාය ලබා දෙයි. පාරිභෝගිකයා මුහුන දී ඇති තත්වයන් තේරුම් ගැනීමට සහ ඒවාට සුදුසු පරිදි ප්‍රතිචාර දැක්වීම සඳහා තොරතුරු ආරක්ෂක උපදේශක හට කළමනාකරණ හා සන්නිවේදන හැකියාවන් අවශ්‍ය වේ.

### අන්තර්ගත නිෂ්පාදන කළමනාකරු

අන්තර්ගත නිෂ්පාදන කළමනාකරුවන් විසින් චිත්‍රපට කණ්ඩායම්, සජීවිකරණය සහ ක්‍රීඩා මෘදුකාංග වැනි මාධ්‍ය අන්තර්ගත නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘති කණ්ඩායම් අධීක්ෂණය කරයි. පළමුව, යෝජනාවක් කෙටුම්පත් කරන අතර, කණ්ඩායමේ සහයෝගිත්වය ඇතිව සමාගම සමඟ නිෂ්පාදන සාකච්ඡා ඇරඹීමත්, සංයුක්ත අයවැය සුරක්ෂිත කිරීමත් සිදු කරයි. එසේම, නිෂ්පාදන කළමනාකරුවන් විසින් නිසි නිෂ්පාදන භාවිතා කිරීමෙන් මෙම අරමුදල් ආපසු ලබාගත හැකි වන පරිදි මෙම සැලැස්ම ක්‍රියාත්මක කළ යුතු ය. අතීත ව්‍යාපෘති කාර්ය සාධනය සහ වත්මන් වෙළඳපල තත්ත්වයන් විශ්ලේෂණය කිරීමටත්, සැලැස්ම ක්‍රියාත්මක කිරීමට කණ්ඩායමක් සංවිධානය කිරීමටත් මේ සඳහා හැකියාව අවශ්‍යය වේ.

### දත්ත විශ්ලේෂක

දත්ත විශ්ලේෂකයින් විසින් ව්‍යාපාරික ක්‍රියාකාරකම් හරහා එක්රැස් කරගත් ගනුදෙනුකරුවන් සහ නිෂ්පාදන පිළිබඳ පුළුල් පරාසයක දත්තවල ලාක්ෂණික මුහුණුවර සහ ප්‍රවණතා සොයා ගැනීම සඳහා එම දත්ත විෂයාබද්ධ විශ්ලේෂණයකට ලක් කරයි. ඉන්පසු ඔවුන් කළමනාකරණය හා පද්ධති සංවර්ධනය ආශ්‍රිත ගැටළු වලට යෝජිත විසඳුම් ඉදිරිපත් කරයි.

කෘෂිකර්මාන්තය හා වෛද්‍ය විද්‍යාව ආදී ක්ෂේත්‍රවල විශාල දත්ත භාවිතය මෑත කාලයේදී ප්‍රගතියක් ලබා ඇති අතර, එය භාවිතයට ගැනෙන ක්ෂේත්‍ර පරාසය අඛණ්ඩව පුළුල් වෙමින් පවතී. දත්ත විශ්ලේෂණය සඳහා අලෙවිකරණය සහ කළමනාකරණය පිළිබඳ දැනුම, සංඛ්‍යාන විශ්ලේෂණය සහ දත්ත කැණීම වැනි තොරතුරු තාක්ෂණ කුසලතා සහ උපකල්පන සැකසීම හා පරීක්ෂා කිරීම මත පදනම් වූ තාර්කික චින්තන හැකියාව අවශ්‍ය වේ.

# අධ්‍යාපනික අරමුණු

සිසුන්ට අධ්‍යාපනය ලබා දීම පිළිබඳ අප පාසල සතු මෙහෙවර හා අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා, වෙබ් ව්‍යාපාර තාක්‍ෂණය පිළිබඳ උසස් උපාධිය සඳහා වන අපගේ අධ්‍යාපන ඉලක්ක පහත සඳහන් පරිදි සකසා ඇත.

**1) මූලික සාක්ෂරතාවය ලබා ගැනීම**

සිසුන් විසින් ව්‍යාපාර ප්‍රවර්ධනය සඳහා පදනම් ලෙස ක්‍රියා කරන සමාජ හා සන්නිවේදන කුසලතා ඉගෙනගනු ඇතැයි අපේක්ෂා කෙරේ. සිසුන් විසින් තොරතුරු තාක්ෂණය / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයෙහි මූලිකාංග ලෙස ක්‍රියා කරන මෘදුකාංග හා දෘඪාංග ජාල වැනි ප්‍රධාන තාක්ෂණයන් පිළිබඳ අවබෝධයක් ලබාගනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.

**2) සැලසුම් හා නිර්මාණ හැකියාව වැඩි දියුණු කරගැනීම**

සිසුන් විසින්: 1) ව්‍යාපාර ක්ෂේත්‍රයේ වර්තමාන සහ අනාගත ප්‍රවණතා සහ එයට ආධාර වන තොරතුරු තාක්ෂණය / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පුළුල් ලෙස පර්යේෂණය සහ විශ්ලේෂණය කිරීම; සහ 2) වැදගත් ආයතනික හා සමාජීය අභියෝගයන්ට තාර්කික විසඳුම් සැලසුම් කිරීම සහ යෝජනා කිරීම ආදිය සම්බන්ධ නිපුණතාවන් වැඩිදියුණු කරගනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, යෝජිත සැලසුම් ක්‍රියාවට නංවන විවිධ පද්ධති සහ අන්තර්ගතයන් සැලසුම් කිරීමේ හැකියාව සිසුන් විසින් ඉහළ නංවාගනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.

**3) වැඩිදියුණු කිරීමේ හා ක්‍රියාවට නැංවීමේ හැකියාව දියුණු කරගැනීම**

සිසුන් විසින් මෘදුකාංග යොදාගැනීම හරහා සැලසුම් කර නිර්මාණය කරන ලද පද්ධති සහ අන්තර්ගතයන් පුද්ගලිකව භාවිතයට ගැනීමේ හැකියාව හෝ ඒවා අවසන් පරිශීලකයින් වෙත ලබා දීමේ හැකියාව දියුණු කරගනු ඇතැයි අපේක්ෂා කරයි. මෙම ක්‍රියාවලියේදී, සිසුන් විසින් මෙම පද්ධති සහ අන්තර්ගතයන් වැඩිදියුණු කිරීම හා ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය කරන විවිධ මෙවලම් සහ කේතීකරණ නීතිවලට අදාළ ප්‍රායෝගික දැනුම ගැඹුරින් ගවේෂණය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**4) වෘත්තීය දැනුවත්භාවය සහ ආචාරධර්ම පෝෂණය කරගැනීම**

සිසුන් විසින් ව්‍යාපාරික ක්‍රියාවලීන් වගකීමෙන් යුතුව හැසිරවීමේ හැකියාව වර්ධනය කරගනු ඇතැයි අපේක්ෂා කෙරේ. ව්‍යාපාර ක්‍රියාවලීන් අඛණ්ඩව වඩා වර්ධනය කිරීම සඳහා, ඔවුන් ඉහළ වෘත්තීය දැනුමකින් සහ සදාචාරාත්මක ඉදිරිදර්ශනයකින් සන්නද්ධ වනු ඇතැයි ද අපේක්ෂා කෙරේ. මෙම කරුණු දෙක සංයෝජනයෙන් සිසුන් තමන් තුළ ප්‍රායෝගික නායකත්ව කුසලතා සහ සංවිධාන කළමනාකරණ ක්‍රම වර්ධනය කරගනු ඇතැයි අපි අපේක්ෂා කරමු.

# විෂයමාලා ප්‍රතිපත්ති

අපගේ මෙහෙවර හා අරමුණු වලට අනුකූලව වෙමින්, තොරතුරු තාක්ෂණ / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කළමනාකරණ කුසලතා වලින් අනූන මෙන්ම ඔවුන් විසින් තෝරාගනු ලබන තොරතුරු තාක්ෂණ ව්‍යාපාර ක්ෂේත්‍රයක් සක්‍රියව වැඩිදියුණු කළහැකි විශේෂඥ වෘත්තිකයින් පුහුණු කිරීම සඳහා අපි විෂය මාලාවක් පිරිනමන්නෙමු.

**1. විෂයමාලා වැඩසටහන් පහත කාණ්ඩවලට වර්ග කර ඇත:**

• සංකේන්ද්‍රණ ක්ෂේත්‍ර - විශේෂිත අධ්‍යන ක්ෂේත්‍ර පිළිබඳ ගැඹුරු දැනුමක් ලබාගැනීම සඳහා ක්‍රමානුකූලව පෙළගැස්වූ පාඨමාලා.
• කර්මාන්ත - සිද්ධි අධ්‍යයන සහ ව්‍යාපෘති පදනම් කරගත් ඉගෙනුම් භාවිතා කරමින් ව්‍යාපාර හා තොරතුරු තාක්ෂණ විශේෂඥයින් සමඟ නිශ්චිත කර්මාන්තයක තාක්‍ෂණය හා කුසලතා ප්‍රායෝගිකව භාවිතා කිරීම කෙරෙහි අවධානය යොමු කෙරෙන පාඨමාලා.
• ආධාරක වරණීය පාඨමාලා - තාක්‍ෂණික ප්‍රවණතා, ඉහළ මට්ටමේ න්‍යායාත්මක පාඨමාලා මෙන්ම සංකේන්ද්‍රණ හා කර්මාන්ත ක්ෂේත්‍රයන්ට ඌනපූරණය කරන කුසලතා දියුණු කරන වැඩසටහන් ඇතුළත් පාඨමාලා.

**2. පාඨමාලා ලියාපදිංචි කිරීමේ මාදිළි සහ ක්‍රමය ස්ථාපිත කිරීම**

තම ඉගෙනීම් අරමුණු හා රුචිකත්වයන්ට අනුකූලව, සිසුන් විසින් එක් "සංකේන්ද්‍රණයක්", එනම් මූලික පදනම් දැනුම ලබාගැනීමේ සිට එම දැනුම පුළුල් පරාසයක් තුළ විහිදුණු විශේෂිත තොරතුරු තාක්ෂණ ආශ්‍රිත ක්ෂේත්‍රයක් තුළ යොදා ගැනීමට හා පුහුණු වීමට උපකාරී වන පුළුල් හා ගැඹුරු විශේෂඥතාව පිළිබඳ අවධාරණය කෙරෙන පාඨමාලා කට්ටලයක් තෝරාගනු ලබයි.මීට අමතරව, බෙස්පෝක් විෂයමාලාව මඟින් සිසුන්ට ඔවුන්ගේ විවිධ වූ අවශ්‍යතා මෙන්ම පුද්ගලික අධ්‍යයන හා පර්යේෂණ අරමුණු වලට අනුකූල වන පරිදි පාඨමාලා තෝරා ගැනීමට ඉඩ සලසයි. ඔවුන් ඉගෙනගත් දේ වෘත්තීය මට්ටමින් යෙදවීම දක්වා පුළුල් කිරීමට, විෂය මාලාව මඟින් පුළුල් කාර්මික ක්ෂේත්‍ර පරාසයක් පුරා විහිදෙන තාක්‍ෂණය ප්‍රායෝගිකව යෙදවීම පිළිබඳ අවධානය යොමු කෙරෙන කර්මාන්ත පාඨමාලා ද ඉදිරිපත් කරයි. ශිෂ්‍යයන් තම දැනුම විශේෂිත ගැටළු නිරාකරණය කිරීමට ප්‍රායෝගිකව යොදවන අතරම විවිධ කර්මාන්තවලට අදාල සැලසුම් නිර්මාණය ද සිදු කරයි. කර්මාන්ත පාඨමාලා සකසා ඇත්තේ සිසුන්ගේ ප්‍රධාන සංකේන්ද්‍රණ පාඨමාලා සඳහා අනුපූරකයක් වශයෙනි.

**3. ප්‍රධාන ව්‍යාපෘතිය**

පාඨාලාවේ කටයුතු සමඟම, පීඨයේ මඟ පෙන්වීම යටතේ ප්‍රධාන ව්‍යාපෘතියක් නිම කිරීම හරහා ඔවුන්ගේම අභිලාෂයන් හඹා යාමෙන් සිසුන්ගේ ප්‍රායෝගික හා ව්‍යවහාරික හැකියාවන් වර්ධනය කිරීම සඳහා අපගේ විෂය මාලාව සැලසුම් කර ඇත.

**4. වෙනස්වීම් වලට ප්‍රතිචාර**

අපගේ විෂය මාලාව තොරතුරු තාක්ෂණ / තොරතුරු සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රය තුළ සිදුවන ශීඝ්‍ර වෙනස්කම් වලට ඉක්මන් ප්‍රතිචාර දක්වයි. ජපානයේ සහ විදේශයන්හි ඉහළ නිපුණතා සහිත වෘත්තිකයින් සඳහා අවශ්‍ය වන කර්මාන්ත හා සමාජීය වෙනස්කම් වලට අනුකූලව පාසල් විෂය මාලාව නිරන්තර සමාලෝචනයට හා වෙනස්කම් වලට බඳුන් කෙරේ.

# ඩිප්ලෝමා ප්‍රතිපත්ති

පහත සඳහන් අවශ්‍යතා සපුරාලන පුද්ගලයන්ට පාසල විසින් ශාස්ත්‍රපති උපාධියක් ප්‍රදානය කෙරේ.

**1) නියම කළ කාල සීමාව තුළ පූර්වනිශ්චිත පාඨමාලා කටයුතු නිම කිරීම (උදා: සමාසික 4)**

**2) උපාධිය සඳහා වන පූර්වනිශ්චිත සම්මාන ප්‍රමාණය සම්පූර්ණ කිරීම**

සිසුන් තමා තුල පහත ගුණාංග ඇතිකරගනු ඇතැයි පාසල අපේක්ෂා කරයි:

**අ. ලබාගත් මූලික දැනුම තම වෘත්තියට ආධාර කරගනු පිණිස පුළුල් කරගැනීම.**

**ආ. උසස් මට්ටමේ නිපුණතා සහිත වෘත්තිකයන් බවට පත්වීම සඳහා සිසුන් තමා විසින් තෝරාගත් ක්ෂේත්‍රය තුළ මෙම දැනුම යෙදවීම.**

තම වෘත්තිය තුළ ගෞරවනීය සාමාජිකයන් බවට පත්වීම සඳහා උසස් ආචාරධර්ම සහිතව කටයුතු කිරීම.

# ඉහළ සුදුසුකම් සහිත තොරතුරු තාක්ෂණ වෘත්තිකයින් සංවර්ධනය සඳහා ඒකාබද්ධ වැඩසටහන්

KCGI හි පාසල් දර්ශනය තුළ ඇති එක් ඉලක්කයක් වන්නේ ඉහළ සුදුසුකම් සහිත තොරතුරු තාක්‍ෂණ වෘත්තිකයින්ගේ සංවර්ධනය කර උපාධිධාරීන් බිහි කිරීමයි. මෙම ඉලක්කය සපුරා ගැනීම සඳහා, KCGI විසින් සිසුන්ගේ විවිධ අධ්‍යාපනික අරමුණු වලට සරිලන අයුරින් පාඨමාලා ලියාපදිංචි කිරීමේ මාදිලි රාශියක් ඒකාබද්ධ කරමින් ඒකාබද්ධ විෂයමාලාවන් සිසුන් වෙත ලබා දේ.




**■ විශේෂීකරණය ලබා ගැනීම**

ඉහළ සුදුසුකම් ලත් තොරතුරු තාක්‍ෂණ වෘත්තිකයෙකු ලෙස තොරතුරු තාක්‍ෂණ ක්ෂේත්‍රය තුල ඇති සමස්ත දැනුම පරාසය ආවරණය කිරීමට අපේක්‍ෂා කිරීම තාත්වික නොවේ. සිසුන්ට විශේෂීකරණය ලබාගැනීම සඳහා, KCGI විසින් විශේෂිත ක්ෂේත්‍ර ගණනාවක් හඳුනාගෙන එම ක්ෂේත්‍ර සඳහාම වැඩිදියුණු කළ විෂයමාලා හඳුන්වා දෙයි. මෙම සංකේන්ද්‍රණ ක්ෂේත්‍ර හරහා සිසුන්ට තමා තෝරාගත් ක්ෂේත්‍රවල මූලික දැනුමේ පටන් ව්‍යවහාරික තාක්‍ෂණයන් සහ ප්‍රායෝගික කුසලතා දක්වා වන පුළුල් හා ගැඹුරු දැනුමක් ලබා ගත හැකිය.

**■ සමාජයීය අවශ්‍යතා වලට අනුකූල වීම**

අතිවිශාල වපසරියකින් යුත් නවීන කර්මාන්ත ක්ෂේත්‍රය පුරා, කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට, දැනුම රැස් කිරීමට සහ නැතහොත් ගැටළු වලට පිළියම් සෙවීම සඳහා ව්‍යවහාරික තොරතුරු තාක්ෂණයේ අවශ්‍යතාවය ක්‍රමයෙන් ඉහළ යමින් පවතී. මෙම අවශ්‍යතාවයන්ට KCGI විසින් ප්‍රතිචාර දක්වන්නේ කර්මාන්ත පාඨමාලා සංවිධානය කර, සිසුන්ට කර්මාන්ත ක්ෂේත්‍රයක් තෝරාගෙන එම ක්ෂේත්‍රයේ තොරතුරු තාක්ෂණය ආශ්‍රිත පුහුණුව ලැබීමටත්, සිද්ධි අධ්‍යයනයන් තුළින් ඉගෙනීමටත්, ගැටලු විසඳීමටත් ඉඩහසර ලබා දීමෙනි.

**■ නිර්මාණාත්මක සහ ප්‍රායෝගික කුසලතා නිරූපනය කිරීම**

ඉහළ සුදුසුකම් ලත් තොරතුරු තාක්‍ෂණ වෘත්තිකයෙකුටම තමා හැදෑරූ සෑම පාඨමාලාවක් තුළම ලබා ගත් දැනුම ප්‍රායෝගිකව යොදාගනිමින් සැබෑ ලෝකයේ ගැටළු සඳහා විසඳුම් ලබා දීමට හැකි විය යුතුය. වෘත්තිකයන් තමාගේම මුලපිරීමෙන් අදාළ ගැටලුව සඳහා ගතයුතු ක්‍රියාමාර්ග මාලාව සැලසුම් කර නිර්මාණය කිරීමටත්, එම විසඳුම්වල ප්‍රතිලාභ අන් අයට ලැබීමට සැළැස්වීමටත් හැකිවිය යුතුය. සිසුන් අවශ්‍ය දැනුම ලබාගැනීම සහතික කිරීම සඳහා, ඔවුන් ව්‍යාපෘති අනුග්‍රාහකයකුගේ මඟ පෙන්වීම යටතේ ඕනෑම පුළුල් පරාසයක තේමාවන්ගෙන් එකක් මෙන්ම ඒ පිළිබඳ පරීක්ෂණ ව්‍යාපෘති/ස්වාධීන අධ්‍යයනයක් ඇතුළත් ප්‍රධාන ව්‍යාපෘතියකින් සමන්විත විෂය මාලාවක් අනුගමනය කරයි.

**■ වෘත්තිමය හැඩගැස්වීම**

ඉහළ සුදුසුකම් ලත් තොරතුරු තාක්‍ෂණ වෘත්තිකයන් සැබෑ ගැටළු විසඳීමට සහ සැබෑ කාර්මික ක්‍ෂේත්‍රයන්හි ප්‍රායෝගික විසඳුම් ලබා දීමට හැකියාව ඇති ඉහළ පුහුණුව ලත් වෘත්තිකයන් ලෙස ඔවුන්ගේ කාර්යභාරයන් ඉටු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම සීමාවාසික පුහුණු මගින් ප්‍රායෝගික අත්දැකීම් හරහා සිසුන්ගේ තාක්ෂණික කුසලතාවන් ඉහල නංවමින් ඒ ඔස්සේ ගැටළු නිරාකරණය කිරීමේ කුසලතාවන් ඇතිකර ගැනීමට අවස්ථා සලසා දේ.

කාර්මික ආකෘතියක් තෝරා ගැනීම, ව්‍යාපෘති පැවරුම් වැනි දෑ සියල්ලම සිසුන්ට එකම අකාරයෙන් සිදු කල යුතු නැත. තම තමන් කැමති ක්ෂේත්‍ර යටතේ, ඔවුන්ගේ රුචිකත්වය මත සහ කෙතරම් දුරකට එය හැදෑරීමට අවශ්‍යද යන කාරනා මත පුළුල් පරාසයක් ඔස්සේ මෙම තෝරාගැනීම් සිදු කල හැක. KCGI විසින් ඉහළ සුදුසුකම් ලත් තොරතුරු තාක්‍ෂණ වෘත්තිකයෙකු තුල තිබිය යුතු හා සුදුසු දැනුම හා ශිල්පීය ක්‍රම ගවේෂණය සහතික කරන අතරම, සිසුන්ට සිය අභිමතය පරිදි තමා තෝරාගත් ක්ෂේත්‍රයක අධ්‍යයන කටයුතු සිදු කිරීමට ඇති නිදහසට ගරු කරමින් විෂයමාලා නිර්මාණය කරයි.







# KCGI හි විෂයමාලා ව්‍යූහය

KCGI මඟින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රය තුළ සිසුන්ට අවශ්‍ය වන මූලික ක්‍රමවේදයන් සහ දැනුම ලබාදීමේ හැකියාව ඇති විෂයමාලා නිර්මාණය කරයි. අනිවාර්ය පාඨමාලා වලට ව්‍යාපාරික වල නියුතු අයට අවශ්‍ය වන මූලික කුසලතා මෙන්ම වෘත්තීය ක්ෂේත්‍රවල භාවිතයට ගැනෙන ප්‍රායෝගික කුසලතා ඉගැන්වීමේ පාඨමාලා ඇතුළත් වේ. සංකේන්ද්‍රණ පාඨමාලා යනු විශේෂිත වෘත්තීය ක්ෂේත්‍රයක් පිළිබඳ විවිධ අන්තර්ගතයන් ඇතුලත් වන පාඨමාලා වේ. කාර්මික පාඨමාලා ඉහළ ඉල්ලුමක් ඇති ප්‍රධාන ක්ෂේත්‍රවලට අදාළ පාඨමාලා වලින් සමන්විත වේ.

කෙසේ වෙතත්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයෙහි පවතින ශීඝ්‍රයෙන් වර්ධනය වන ස්වභාවය හේතුවෙන්, සමහර අවස්ථාවලදී සිසුන් විසින් සාම්ප්‍රදායික නොවන ආකාරයෙන් විෂයමාලා සකස් කරගැනීමත් අධ්‍යයනය කිරීමත් කළ යුතුය. මෙම අවශ්‍යතාවය සපුරාලීම සඳහා සිසුන්ට තම උපදේශකයින්ගේ මඟපෙන්වීම සහිතව, ඔවුන්ගේ පුද්ගලික අධ්‍යාපන අරමුණු වලට ගැලපෙන පරිදි අනිවාර්ය නොවන පාඨමාලා වලින් විෂයයන් තෝරාගෙන තමන්ගේම විෂය මාලාවක් නිර්මාණය කරගැනීමේ හැකියාව ඇත. එවැනි විෂය මාලාවක් බෙස්පෝක් විෂයමාලාවක් ලෙස හඳුන්වයි.

**ඇතුළත් වීම**

**අනිවාර්ය පාඨමාලා**

- තොරතුරු සහ සංනිවේදන තාක්ෂණ කර්මාන්තයේ වෘත්තීය සංනිවේදනය
- නායකත්ව න්‍යාය
- ව්‍යාපෘති පදනම්

**සංකේන්ද්‍රීය පාඨමාලා**

- ව්‍යවසාය සම්පත් සැලසුම්කරණය
- ව්‍යාපාර දත්ත විශ්ලේෂ
- ගෝලීය ව්‍යවසායකත්වය
- වෙබ් පද්ධති සංවර්ධනය
- ජාලකරණ පරිපාලනය
- IT මැංගා සහ සජීවිකරණය
- සංචාරක තොරතුරු තාක්ෂණය
- කෘතිම බුද්ධිය (AI)

ඉහත සංකේන්ද්‍රණ ක්ෂේත්‍රයන්ගෙන් එකක් තෝරන්න

හෝ

**බෙස්පෝක් විෂයමාලාව**

ඔබේ පුද්ගලික අධ්‍යාපන අරමුණු වලට ගැලපෙන පරිදි අනිවාර්ය නොවන පාඨමාලා වලින් විෂයයන් තෝරා ගනිමින් ඔබේම විෂය මාලාවක් ගොඩනගාගන්න.

**කර්මාන්ත පාඨමාලා**

- මූල්‍ය තාක්ෂණය
- සාමුද්‍රික
- අන්තර්ගත අලෙවිකරණය
- කෘෂිකර්මය
- සෞඛ්‍ය සහ වෛද්‍ය
- අධ්‍යාපනය

**ආධාරක වරණීය පාඨමාලා**

**ප්‍රධාන ව්‍යාපෘතිය**

**තොරතුරු තාක්ෂණය පිළිබඳ ශාස්ත්‍රපති (වෘත්තීය උපාධිය)**

### ◆ අනිවාර්ය පාඨමාලා

KCGI ආයතනය, සිසුන්ගේ ප්‍රථම උපාධියේ ප්‍රධාන විෂයන් කුමක් වුවත් එය නොසලකමින් පුළුල් පසුබිම් පරාසයක සිසු පිරිසක් බඳවා ගනී. මෙම විවෘතභාවය, හැකි තරම් අභියෝගාත්මක වෘත්තීය අවස්ථාවන් පුද්ගලයන් වෙත ලබාදීමේ අපගේ සමාජ මෙහෙවර සම්පූර්ණ කිරීමේ එක් ප්‍රවේශයකි. KCGI හි අනිවාර්ය පාඨමාලා යනු එක් එක් ශිෂ්‍යයාගේ විශේෂීකරණ ක්ෂේත්‍රය නොසලකා, ඉහළ මට්ටමේ වෘත්තිකයෙකු වෙතින් අපේක්ෂා කෙරෙන ඵලදායී හා තාර්කික සන්නිවේදනය පිළිබඳ වන මූලික කුසලතා ඔප්නංවන පාඨමාලා වේ.

**අවශ්‍යතා**
- තොරතුරු සහ සංනිවේදන තාක්ෂණ කර්මාන්තයේ වෘත්තීය සංනිවේදනය
- නායකත්ව න්‍යාය
- ව්‍යාපෘති පදනම්

### ◆ පරීක්ෂණ ව්‍යාපෘති/ස්වාධීන අධ්‍යයනය

පරීක්ෂණ ව්‍යාපෘති/ස්වයං අධ්‍යයනය යනු අධ්‍යයන උපදේශක වරයෙකුගේ මඟ පෙන්වීම යටතේ KCGI හි පාඨමාලාවන්හි සීමාකිරීම් වලින් තොරව සිය අභිමතය පරිදි පර්යේෂණ කටයුතු සිදුකිරීමයි. මෙම අධ්‍යයන් රාමුව තුළ, සිසුන් තම පර්යේෂණ ප්‍රතිඵල වලින් පර්යේෂණ වාර්තාවක් සකස් කොට එය වාචිකව ඉදිරිපත් කරයි. ඉදිරිපත් කෙරෙන ප්‍රතිඵල ප්‍රමාණවත් තරම් ශක්තිමත් නම්, සිසුන්ට එයට අදාල විෂය ලකුණ (credit) ලැබේ. ඇතැම් ප්‍රධාන ව්‍යාපෘති, පර්යේෂණ ව්‍යාපෘතියක් හෝ ස්වාධීන අධ්‍යයනයක් සමඟ ඒකාබද්ධ විය හැකිය.

### ◆ පාඨමාලාව තෝරාගැනීම

ශාස්ත්‍රීය සම්බන්ධීකාරකයෙකුගේ මඟපෙන්වීම යටතේ, සිසුන් තම පුද්ගලික අධ්‍යයන පටිපාටීන් සැලසුම් කරගැනීම සඳහා සංකේන්ද්‍රණ, කාර්මික සහ උපකාරක වරණීය පාඨමාලා අතුරින් ඔවුන් එක් එක් අධ්‍යයන වාරයේදී අධ්‍යයනය කරන පාඨමාලා තෝරාගනු ලබයි.
මෙම පාඨමාලා, පූර්ව දැනුමක් අවශ්‍ය නොවන මූලික පාඨමාලා සහ යම් පූර්ව දැනුම් මට්ටමක් අවශ්‍ය වන ව්‍යවහාරික පාඨමාලා වශයෙන් කොටස් දෙකකට බෙදේ. සිසුන්ට ප්‍රමාණවත් අධ්‍යයන ප්‍රතිඵල ලබාගත හැකි බව සහතික කිරීම සඳහා, පාඨමාලා මාර්ග පථයක් (නිර්දේශිත අධ්‍යයන රටාව) පැහැදිලිව දක්වනු ලබයි. ඒ අතරම, ශිෂ්‍යයෙකුට එක් වාරයකදී සම්පූර්ණ කළ හැකි පාඨමාලා ඒකක ගණනට පිළිබඳ සීමාවක් පනවා ඇත. මෙම විධිවිධානය මඟින් සිසුන්ට පුද්ගලික අධ්‍යයන කටයුතු සඳහා ප්‍රමාණවත් කාලයක් ලබාදෙන අධ්‍යයන සැලැස්මක් සකස් කරගත හැකිවන බව සනාථ කරයි.

### ◆ සීමාවාසික පුහුණුව

KCGI සීමාවාසික පුහුණු වැඩසටහන මඟින් සිසුන්ගේ අධ්‍යයන ක්ෂේත්‍රය අනුව වෘත්තීය පුහුණුව ලබාගැනීම උදෙසා කිසියම් කාලයක් සඳහා ආයතනයක පුහුණුවක් ලබාගැනීමට හැකියාව පවතී. KCGI හි ඉගෙනුම තුලින් ලබාගත් වෘත්තීය දැනුම සහ සන්නිවේදන හැකියාවන් සැබෑ ලෝකයේ රැකියා පරිසරයක් තුල යොදා ගැනීම තුලින් සිසුන් හට තමන් හැදෑරූ දේ ප්‍රායෝගික භාවිතයට ගනු ඇතැයි අපේක්ෂා කෙරේ. සීමාවාසික පුහුණු කාලය අවසන් කළ පසු සිසුන් විසින් සහභාගිවීම පිළිබඳ වාර්තාවක් සහ වාචික නිබන්ධනයක් ඉදිරිපත් කර විෂය ඒකකයට අදාල ලකුණ (credit) ලබාගනී.

## ප්‍රධාන ව්‍යාපෘතිය

KCGI හි සිටින බොහෝ උපදේශකයින්ට කියෝතෝ විශ්ව විද්‍යාලයේ සහ අනෙකුත් කීර්තිමත් ජපන් විශ්ව විද්‍යාල වල සිසුන්ට උපදේශනය සැපයීම පිළිබඳ පුළුල් අත්දැකීම් ඇති අතර, නැතහොත් ඔවුන් ගෝලීයව මෙම ව්‍යාපාරයන්ගේ ඉදිරි පෙළ ක්‍රියාකාරීන් ලෙස කටයුතු කර ඇත. KCGI සිසුන්ට ඔවුන්ගේ ප්‍රධාන ව්‍යාපෘති පිළිබඳව මෙම උපදේශකයින්ගෙන් සෘජුවම මග පෙන්වීම ලබාගැනීමේ හැකියාව ඇත.

### ◆ සමාලෝචනය

තොරතුරු තාක්‍ෂණයේ ප්‍රායෝගික යෙදීම් සහ තාක්‍ෂණයන් කෙරෙහි අවධානය යොමු කරන KCGI හි ප්‍රධාන ව්‍යාපෘති යනු, අනිවාර්යයෙන් ගත යුතු පාඨමාලා වන අතර, ගැටලුවලට අදාළ තම අවබෝධය මත පදනම්ව ගැටලු ගලපා ගැනීම, විශ්ලේෂණය කිරීම සහ විසඳීම සඳහා සිසුන් යොමුකිරීම මෙහි මූලික අරමුණයි. පර්යේෂණ මත පදනම්ව සිදු කෙරෙන අනෙකුත් සාම්ප්‍රදායික විශ්වවිද්‍යාල ශාස්ත්‍රපති උපාධි ව්‍යාපෘති සමඟ සැසඳීමේ දී, නව සොයා ගැනීම් සිදු කිරීමට අමතරව යම් ආකාරයකින් දැනට පවත්නා මෙවලම්, රාමු සහ වෙනත් දේ භාවිතා කර, සිසුන්ගේ සමාජීය හෝ පුද්ගලික ජීවිතය සාර්ථක කර ගැනීමට අවස්ථා ලබා දීම KCGI ප්‍රධාන ව්‍යාපෘතිවල අරමුණු වේ.

### ◆ අරමුණු

KCGI ප්‍රධාන ව්‍යාපෘති වල දී, සිසුන් තම අධ්‍යයන කටයුතු තුලින් ඉගෙනගත් ක්ෂේත්‍ර හා කර්මාන්ත පිළිබඳ විශේෂඥ දැනුමක් ලබා ගනිමින්, (වේදිකා, මෘදුකාංග, සේවා, රාමු සහ ව්‍යාපාර මොඩල ඇතුළු) විශේෂිත මෙවලම් වෙත අවධානය යොමු කිරීම මඟින්, ගැටළු විශ්ලේෂණය කර ඒවාට විසඳුම් ඉදිරිපත් කරයි.

### ◆ ක්‍රියාත්මක කිරීමේ ක්‍රම

ව්‍යාපෘති අනුග්‍රාහකයෙකුගේ (ප්‍රධාන ව්‍යාපෘතිය භාරව සිටින උපදේශකගේ) මග පෙන්වීම යටතේ, ශිෂ්‍යයා ස්වකීය මූලිකත්වයෙන් ප්‍රධාන ව්‍යාපෘතිය කරගෙන යයි. එක් එක් අධ්‍යයන වාරයේ දී ගනු ලබන පියවර පහත පරිදි වේ. අධ්‍යාපන ක්ෂේත්‍රයේ ලොව ප්‍රමුඛයා වන කොලොම්බියා විශ්වවිද්‍යාලය ආදර්ශයට ගෙන, KCGI විසින් නම්‍යශීලී ප්‍රවේශයක් අනුගමනය කරයි. අධ්‍යයන කාලය සහ අන්තර්ගතය අනුව, සෑම සිසුවෙක්ම පහත සඳහන් වර්ග හතරෙන් එකක් තෝරා ගනී:
1) ප්‍රධාන වාර්තාව 2) ප්‍රධාන ව්‍යාපෘතිය
3) ගෞරව ප්‍රධාන ව්‍යාපෘතිය 4) ගෞරව ප්‍රධාන නිබන්ධනය

#### ප්‍රධාන ව්‍යාපෘතියක සිදුවීම්වල ගැලීම් නිදසුන (දළ විශ්ලේෂණය)

**2 වන සමාසිකය**

ශිෂ්‍යයා ප්‍රධාන ව්‍යාපෘතිය සඳහා වන ව්‍යාපෘති පදනම් (අනිවාර්ය පාඨමාලාව) සඳහා සහභාගී වන අතර මෙහිදී සාමාන්‍යයෙන් ව්‍යාපෘති නිර්මාණය හා ක්‍රියාවට නැංවීමේ ක්‍රමය පිළිබඳව ඉගෙනගනී.
ප්‍රධාන ව්‍යාපෘතියක් කිරීමට අදහස් කරන සිසුන් විසින් පර්යේෂණ සැලැස්මක් සකස් කර ඉදිරිපත් කළ යුතු වේ.

**3 වන සහ 4 වන සමාසික**

ව්‍යාපෘතියේ ප්‍රගතිය සහ ප්‍රතිඵල පිළිබඳව ශිෂ්‍යයා තම ව්‍යාපෘති අනුග්‍රාහකයාට නිතිපතා වාර්තා කරයි. ව්‍යාපෘතිය නිම කිරීමට පෙර, ශිෂ්‍යයා විසින් නිබන්ධනයක් යනාදිය ඉදිරිපත් කරනු ලබන අතර, උපදේශකයින් විසින් එය වාචික නිබන්ධනයක් ආකාරයෙන් සම්මුඛ සාකච්ඡාවට බඳුන් කරනු ලබයි.









## සංචාරක තොරතුරු තාක්ෂණය

**ඉතාලියේ ප්‍රමුඛ පෙලේ විශ්ව විද්‍යාලයක් වන භාෂා සහ මාධ්‍ය ජාත්‍යන්තර විශ්ව විද්‍යාලය (IULM). හරහා ඉතාලියේදී සංචාරක කර්මාන්තය පිළිබඳව හැදෑරීමට කියෝතෝ තොරතුරු තාක්ෂණ උපාධි අධ්‍යන ආයතනය මගින් අවස්ථාව උදා කර දී තිබේ.**

ඉතාලියේ මිලානෝ පිහිටි ප්‍රමුඛ පෙලේ විශ්ව විද්‍යාලයක් වන භාෂා හා මාධ්‍ය ජාත්‍යන්තර විශ්වවිද්‍යාලය සමග කියෝතෝ තොරතුරු තාක්ෂණ උපාධි අධ්‍යන ආයතනය අත්වැල් බැඳගෙන සිටී. IULM උපාධි පාඨමාලාව සමග සම්බන්ද වීමෙන් පශ්චාත් උපාධි දෙකක් ලබා ගැනීමේ අවස්ථාව ඔබට ලබා දී තිබේ.
IULM ඉතාලියේ මිලානෝහි 1968 වසරේදී අරඹන ලද පෞද්ගලික විශ්ව විද්‍යාලයකි. කලා හා සංස්කෘතික උරුමයන්, සංචාරක, භාෂා සහ සන්නිවේදන සහ මහජන සම්බන්ධතා සහ වෙළෙඳ ප්‍රචාරණ යනාදී වශයෙන් පීඨ සතරකින් එය සමන්විතවේ. IULM හි දැනට 6,300 පමණ උපාධි ලාභීන් සහ උපාධි අපේක්ෂකයන් ප්‍රමාණයක් සිටී. IULM යනු ව්‍යාපාරික මානසිකත්වයත්, ප්‍රායෝගික අධ්‍යාපනයක් ලබා දෙන ඒකාබද්ධ ප්‍රවේශයක් සිසුනට ලබාදෙන්නට කැපවුන පුරෝගාමී විශ්වවිද්‍යාලයකි. යුනෙස්කෝ පර්යේෂණ ආයතනය සමග මෙන්ම ලොව පුරා ඇති අනෙකුත් අධ්‍යන සමාජ සමගද සබදතා පවත්වමින් වත්මන් ඉල්ලුම් සපුරාලීමට ෂඔබළ නිබදවම ක්‍රියා කරයි.
කියෝතෝ තොරතුරු තාක්ෂණ උපාධි අධ්‍යන අයතනයේ සිසුන් පිටරට විශ්ව විද්‍යාලයක කෙටි සංචාරයක් සහ පුහුණුවක් ඇතුලත් සති දෙකක අධ්‍යන වැඩසටහනක් ද ඔවුන් ලබා දේ.

**International University of Languages and Media** https://www.iulm.it/en/home

IULM UNIVERSITY





# ඔබේ පාඨමාලා නිර්මාණය කරගැනීම

KCGI හි තොරතුරු තාක්‍ෂණ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (MS in IT) ලබා ගැනීම සඳහා, සියලුම සිසුන් විසින් නිශ්චිත ලකුණු (credits) සංඛ්‍යාවක් සාර්ථකව සම්පූර්ණ කර ප්‍රධාන ව්‍යාපෘතියක් සම්පූර්ණ කළ යුතුය.
KCGI මඟින් පිරිනැමෙන පාඨමාලා පහත සඳහන් පරිදි සංකේන්ද්‍රණ ක්ෂේත්‍ර, කර්මාන්ත පාඨමාලා සහ උපකාරක වරණීය පාඨමාලා ලෙස කොටස් තුනකට බෙදා ඇත. වෙබ් පාදක ව්‍යාපාරයට අදාළ පුළුල් පරාසයක පාඨමාලා අතරින්, KCGI විසින් කර්මාන්ත අංශයන් තුළ වැඩි අවධානයක් යොමු කෙරෙන පාඨමාලා සහ කර්මාන්ත වලට අදාල දැනුම හා කුසලතා සඳහා ඉහළ මට්ටමක ඉල්ලුමක් පවතින පාඨමාලා තෝරාගනී. ඉන්පසු අප විසින් මෙම පාඨමාලා විෂයමාලා වලට කාණ්ඩගත කර සිසුන්ට ඔවුන්ගේ අධ්‍යයන කටයුතු කාර්යක්ෂමව කේන්ද්‍රගත කරගත හැකිවන පරිදි සකසනු ලබයි. ශිෂ්‍යයන්ට තමන්ගේම ආකාරයකට හැදෑරීමේ නිදහස ලබාදීම සඳහා, විෂයමාලා සැලසුම තුළ යමෙකුගේ විශේෂිත ක්ෂේත්‍රයට සම්බන්ධ නොවන පාඨමාලා තෝරා ගැනීමේ අවසරය ලබා දේ.

## සංකේන්ද්‍රණ ක්ෂේත්‍ර

පුළුල් පරාසයක් පුරා පැතිරුණු තොරතුරු තාක්ෂණය ආශ්‍රිත දැනුමින් එක් නිශ්චිත විශේෂ ක්ෂේත්‍රයක් තෝරාගෙන ඒ විෂය පථය අදාත් ගැඹුරින් අධ්‍යනය කිරීම මෙමගින් සිදුවේ. විශේෂිත එමෙන්ම වඩාත් පුළුල් පරාසයක දැනුම ලබාගැනීමට සිසුන්ට පහසුවන ලෙස පාඨමාලා විවිධ ක්ෂේත්‍ර වලට වර්ග කර තිබේ.

| | |
|---|---|
| ව්‍යයවසාය සම්පත් සැලසුම්කරණය | මේ යටතේ ශිෂ්‍යයන් විසින් විවිධ සමාගම් පුද්ගල තොරතුරු, භාණ්ඩ සහ මුදල්, කළමනාකරණය කරගැනීමටත්, ව්‍යාපාර තීරණ ගැනීම සඳහාත් ව්‍යවසායික සම්පත් සැලසුම්කරණ පද්ධතීන් යොදා ගන්නා ආකාරය පිළිබඳ අධ්‍යනය කරනු ලැබේ. |
| ව්‍යාපාර දත්ත විශ්ලේෂ | ක්ලවුඩ් සහ දත්ත සමුදායන්හි රැස් කර ඇති තොරතුරු විශ්ලේෂණය කිරීමටත් එම විශ්ලේෂණ යන් උපයෝගී කරගනිමින් වඩාත් ඵලදායී තීරණ වලට එළඹීමටත් සිසුන් ඉගෙන ගනී. |
| ගෝලීය ව්‍යවසායකත්වය | තොරතුරු තාක්ෂණ ව්‍යාපාර ක්ෂේත්‍රයෙහි ව්‍යවසාය කයකු ලෙස සාර්ථක වීමට අවශ්‍ය දැනුම සහ කුසලතා ලබාදීමම විෂය මාලාව තුල සිදුවේ.ව්‍යවසායික මානසිකත්වය, නායකත්ව පුහුණුව, දත්ත විශ්ලේෂණය හා භාවිතය වැනි කරුණුද මේ යටතේ අධ්‍යනය කරනු ලැබේ. |
| වෙබ් පද්ධති සංවර්ධනය | ක්ලවුඩ් සහ දත්ත සමුදායන් වැනි සම්පත් සමග සම්බන්ධිත වෙබ් අඩවි සැලසුම් කිරීම, නිර්මාණය මෙන්ම පරිගණක සහ ස්මාර්ට්ෆෝන් සඳහා වෙබ් යෙදවුම් නිර්මාණය කිරීම මෙම විෂය මාලාව යටතේ සිසුන් ඉගෙන ගනු ඇත. |
| ජාලකරණ පරිපාලනය | මෙම පාඨමාලාව හදාරන සිසුන් ජාලවල අපේක්ෂිත යෙදීමට අනුකූලව ජාල ගොඩනඟන ආකාරය, ක්ලවුඩ් පරිගණකකරණය සහ ආරක්ෂක කළමනාකරණය පිළිබඳ අධ්‍යයනය සහ විවිධ සේවාදායක / සර්වර් පද්ධති සංවර්ධනය කර ක්‍රියාවට නංවන ආකාරය ඉගෙනගනී. |
| IT මැංගා සහ සජීවිකරණය | සජීවිකරණ හා වෙනත් දෘශ්‍ය අන්තර්ගත සැලසුම් කිරීමට සහ නිර්මාණය කිරීමට ඩිජිටල් මෙවලම් භාවිත කරන ආකාරයත්, එවැනි අන්තර්ගතයන් ව්‍යාපාරයකට යොදවාගන්නා ආකාරයත් මෙහිදී හදාරනු ලැබේ. |
| සංචාරක තොරතුරු තාක්ෂණය | මෙම විෂය මාලාව තුළ සිසුන් සංචාරක ව්‍යාපාරය තුල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යෙදීම, සංචාරක ව්‍යාපාරය තුල තොරතුරු තාක්ෂණය යොදාගැනීම, සංචාර කළමනාකරණය, නවාතැන් සැපයීම හා වෙනත් තොරතුරු සහ සංචාරක අන්තර්ගතයන් සැලසුම් කිරීම සහ නිර්මාණය පිළිබඳව ඉගෙන ගනී. |
| කෘතිම බුද්ධිය | මෙම පාඨමාලාවේ සිසුන් විසින් විවිධ ක්ෂේත්‍රවල තාත්වික සිද්ධි අධ්‍යයනයන් සිදු කරමින්, කෘතිම බුද්ධිය (AI) සහ ඒ ආශ්‍රිත තාක්ෂණයන්හි මූලික න්‍යාය සහ යෙදුම් ඉගෙන ගනී. සහභාගිවන්නන් AI ආශ්‍රිත මෘදුකාංග පිළිබඳ ප්‍රවීණතාවය ද ලබා ගන්නා අතර, විවිධ AI ක්ෂේත්‍රයන්හි එය භාවිතා කරන ආකාරය සහ යොදන ආකාරය ඉගෙන ගනී. |

## කර්මාන්ත පාඨමාලා

මෙම පාඨමාලා මඟින් විශේෂිත ක්ෂේත්‍රයන් තුළ වෘත්තීය දැනුම හා තාක්‍ෂණය ප්‍රායෝගිකව භාවිතා කිරීම කෙරෙහි අවධානය යොමු කෙරේ. පාඨමාලා එක් එක් කර්මාන්තය සඳහා විශේෂිත වේ. මෙම දේශන පවත්වනු ලබන්නේ එක් එක් කර්මාන්ත ක්ෂේත්‍රයෙහි සිටින විශිෂ්ට ඉදිරි පෙළ ක්‍රියාකාරීන් විසිනි. මෙම පාඨමාලා ඇතුළු වෙනත් පාඨමාලා, අධ්‍යයනය කරනු ලබන සෑම අදාල කර්මාන්තයකම නවීන ප්‍රවණතා පිළිබිඹු කිරීම සඳහා නිරන්තරයෙන් යාවත්කාලීන කෙරේ.

| | |
|---|---|
| මූල්‍ය තාක්ෂණය | මූල්‍ය ක්ෂේත්‍රය තුල තොරතුරු තාක්ෂණයේ උපයෝගිතාව මෙමගින් අධ්‍යනය කෙරේ. මෙම පාඨමාලා මගින් බැංකුවල සිදුවන මූලික මෙහෙයුම් කටයුතු මෙන්ම ඉලෙක්ට්‍රොනික මුදල් වල වත්මන් තත්වය, අතත්‍ය මුදල් සහ අනෙකුත් මූල්‍ය තාක්ෂණයන් පිළිබඳව සිසුන්ව දැනුවත් කරයි. |
| කෘෂිකර්මය | කෘෂිකර්මාන්තයේදී තොරතුරු තාක්ෂණයේ භාවිතය පිළිබඳව මෙහිදී සිසුන් අධ්‍යනය කරනු ලැබේ. වගා කිරීමේදී අවශ්‍ය පරිසර තත්ත්ව පාලනය කිරීම (පැල සැකසුම් කර්මන්තශාලා වල මෙන්), ඵලදාව බෙදාහැරීම වැනි මාතෘකා මේ යටතේ සිසුන් ඉගෙන ගනියි. |
| සාමුද්‍රික | නැව් තැනීම හා සාමුද්‍රික ප්‍රවාහනයෙහිලා තොරතුරු තාක්ෂණයේ උපයෝගීතාව මේ විෂයමාලාව යටතේ අධ්‍යනය කෙරේ. නැව් යාත්‍රණය පාලනය කිරීම, මෙන්ම මුහුදු ජලජීවී වගාව පිළිබඳවද මෙහිදී අවධානයට ලක් කරයි. |
| සෞඛ්‍ය සහ වෛද්‍ය | වෛද්‍ය ක්ෂේත්‍රය තුල තොරතුරු තාක්ෂණයේ උපයෝගිතාව පිළිබඳව සිසුන් මෙහිදී අධ්‍යනය කරයි. විද්‍යුත් වෛද්‍ය වාර්ථා වල දත්ත කළමනාකරණය, රෝග විනිශ්චය සඳහා කෘතිම බුද්ධිය සහ දත්ත දෘෂ්‍යකරණය උපකාර කරගැනීම යන මාතෘකා මේ යටතේ සිසුන් ඉගෙන ගනී. |
| අන්තර්ගත අලෙවිකරණය | මන්ගා, ඇනිම්, වීඩියෝ, සංගීතය සහ අනෙකුත් මාධ්‍ය වල තොරතුරු තාක්ෂණික යෙදවුම් පිළිබඳව සිසුන් අධ්‍යනය කරයි. මේ යටතේ අධ්‍යනය කරන මාතෘකා අතර නිෂ්පාදන ක්‍රියාවලිය ඩිජිටල්කරණය කිරීම, බුද්ධිමය දේපළ හිමිකම් කළමනාකරණය, ප්‍රවර්ධන උපායමාර්ග යන විෂයන්ද වේ. |
| අධ්‍යාපනය | මෙම පාඨමාලාව යටතේ අධ්‍යාපන ක්ෂේත්‍රය තිළ තොරතුරු තාක්ෂණයේ භාවිතය පිළිබඳව සිසුන් අධ්‍යනය කරයි. මෙහිදී, ඉ-ඉගෙනුම් ක්‍රියාවලි සඳහා අවශ්‍ය අන්තර්ගතයන් නිර්මාණය කිරීම සහ නිෂ්පාදනය කිරීම, පුළුල් පරාසයක විහිදුනු සන්නිවේදන පද්ධති ඇතුළු තවත් බොහෝ දෑ පිළිබඳව සිසුන් ඉගෙනුම ලබයි. |

## ආධාරක වරණීය පාඨමාලා

මෙම විෂය මාලාව සමන්විත වන්නේ, කර්මාන්ත හෝ සංකේන්ද්‍රණ ක්ෂේත්‍ර ලෙස විශේෂණය නොකර, පොදුවේ වෘත්තිකයන් ලෙස සිසුන්ට අවශ්‍ය වන මූලික කුසලතා වන සන්නිවේදනය හෝ කළමනාකරණය ආදිය ඉගැන්වෙන පාඨමාලා වලින් සහ ප්‍රමුඛ පෙළේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ යෙදුම් සහ තාක්‍ෂණික ප්‍රවණතා පිළිබඳ සිද්ධි අධ්‍යයනයන් ආවරණය කෙරෙන පාඨමාලා වලිනි. මන්දයත් මෙමඟින් මූලික දැනුමේ සිට ව්‍යවහාරික භාවිතය දක්වා පුළුල් පරාසයක ඉදිරිදැක්මක් සහිත පාඨමාලා එකට සංයෝජනය කරන හෙයින්, මෙම විෂය මාලාව සිසුන්ගේ ඉගෙනීමේ පෘථුල බව ඉහළ නංවයි.

| | |
|---|---|
| සන්නිවේදනය | සිසුන් තුල ස්වයං ප්‍රකාශන කුසලතා, සංවාද කුසලතා ආදිය දියුණු කරමින් තොරතුරු තාක්ෂණ හා ව්‍යාපාර ක්ෂේත්‍රයන් හි වඩාත් න්‍යායනුකූලව සහ නිරවුල්ව සන්නිවේදනය කරන ආකාරය පිළිබඳව ඔවුනට දැනුම ලබා දේ. |
| කළමනාකරණය | සිසුන් විසින් ව්‍යවසායික පරිසරයක් තුළ කළමනාකරණය සඳහා අවශ්‍ය පොදු ප්‍රවේශයන් වටහා ගැනීමේ හා ක්‍රියාත්මක කිරීමේ හැකියාව ලබා ගනී. |
| නිෂ්පාදනය | නිෂ්පාදන ක්‍රියාවලිය නව්‍යකරණය කර ප්‍රාණවත් කිරීම සඳහා ගුණාත්මකභාවය සහ අන්තර්ගතය දියුණු කිරීම සම්බන්දයෙන් දීර්ඝ වශයෙන්, සිද්ධි අධ්‍යනයන් ද සමග මෙම පාඨමාලාව යටතේ විස්තර කෙරෙනු ඇත. |
| තොරතුරු තාක්ෂණයේ නවීනතම යෙදවුම් හා තාක්ෂණික ප්‍රවණතා | තොරතුරු තාක්ෂණයේ නවීනතම යෙදවුම් පිළිබඳ අධ්‍යනයන් සහ තාක්ෂණික ප්‍රවණතා පිළිබඳව ඇති විස්තරාත්මක සිද්ධි අධ්‍යනයන් පිළිබඳව මෙම පාඨමාලාව හදාරන ශිෂ්‍යයන් ට අධ්‍යනයට අවස්ථාව ලැබෙනු ඇත. |



## සංකේන්ද්‍රණ ක්ෂේත්‍ර

### ERP (ව්‍යයවසාය සම්පත් සැලසුම්කරණය)

ව්‍යවසාය සම්පත් සැලසුම් කිරීම (ERP) යනු තොරතුරු තාක්ෂණය භාවිතා කරමින්, මිනිසුන්, භාණ්ඩ, යන්ත්‍රෝපකරණ, මුදල් සහ තොරතුරු යන සමාගමේ සියලුම සම්පත් පුළුල් ලෙස කළමනාකරණය කිරීම සඳහා වූ ප්‍රවේශයකි. මෙම ප්‍රවේශය ඉෂ්ඨ කර ගත හැකි ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධති (ERP පද්ධති) අවබෝධ කර ගැනීම ERP පද්ධති ක්‍රියාත්මක කිරීමේ පළමු පියවර වන අතර, එමඟින් සමාගමේ ව්‍යාපාර ක්‍රියාවලිය වැඩිදියුණු කළ හැකිය. මෙම විශේෂඥ ක්ෂේත්‍රය තුළ, ව්‍යාපාර ඒකාබද්ධ කිරීම, මූල්‍ය ගිණුම්කරණ පද්ධති, විකුණුම් සහ බෙදා හැරීමේ පද්ධති ඇතුළුව SAP ERP අධ්‍යාපන පද්ධති (SAP S/4 HANA) යොදා ගනිමින් සිසුන් ප්‍රායෝගික අධ්‍යයනයක නිරත වේ. සමාගම් පරාසයක ගැටළු විශ්ලේෂණය සහ ERP ක්‍රියාත්මක කිරීම පිළිබඳ සිද්ධි අධ්‍යයනයන් ද සිසුන් විසින් සමීක්ෂණය කරනු ලැබේ. මීට අමතරව, ඉන්-මෙමොරි දත්ත සමුදායන් සහ IoT වැනි නවතම ව්‍යවසාය යටිතල පහසුකම් සමඟ ERP සම්බන්ධ කිරීම පිළිබඳ පර්යේෂණ සිසුන් විසින් පවත්වයි.

| පාඨමාලා | | |
|---|---|---|
| දත්ත පද්ධති තාක්ෂණ මූලිකාංග | පද්ධති එක්කිරීම සහ ඉ-ව්‍යාපාර | මානව සම්පත් කළමනාකරණ පද්ධති සංවර්ධනය |
| තොරතුරු තාක්ෂණය සඳහා සංඛ්‍යානය | ජාත්‍යන්තර ගිණුම්කරණය | ව්‍යවසාය සම්පත් සැලසුම්කරණ ව්‍යාපාර යෙදවුම් සංවර්ධනය |
| ව්‍යවහාරික තොරතුරු විද්‍යාව සඳහා මූලික ගණිතය | මූල්‍ය ගණකාධිකරණ පද්ධති සංවර්ධනය 1,2 | ERP ව්‍යාපාර යෙදුම් සංවර්ධනය |
| වෙබ් වැඩසටහන්කරණය 1,2 | විකුණුම් සහ බෙදාහැරීම් පද්ධති සංවර්ධනය 1,2 | ERP උපදේශනයේ උසස් මාතෘකා |
| ව්‍යාපාර සඳහා තොරතුරු පද්ධති | නිෂ්පාදන පාලන පද්ධති සංවර්ධනය | ඔබ්ජෙක්ට් ඔරියන්ටඩ් ක්‍රමයට පරිගණක ප්‍රෝග්‍රෑම් සැදීම |

### ව්‍යාපාර දත්ත විශ්ලේෂ

ව්‍යාපාර දත්ත විශ්ලේෂණය යනු, මෑත වසරවල කර්මාන්තයේ විවිධ ක්ෂේත්‍රයන්ගෙන් වැඩි අවධානයක් ලබා ගන්නා ව්‍යාපාරික තාක්‍ෂණයකි. ව්‍යාපාර දත්ත විශ්ලේෂණයේ ප්‍රධාන අරමුණ වනුයේ, සමාගම්වලට තම ව්‍යාපාර සංවර්ධනය කිරීමට අවශ්‍ය ඵලදායී තීරණ ගැනීමේ අවස්ථාව ලබා දීමයි. සමාගම් පුළුල් පරාසයක දත්ත රැස් කර ගන්නා බැවින්, පුළුල් පරාසයක දුෂ්කර අභියෝගවලට සමාගම් ඇද දමමින්, දත්ත කළමනාකරණය වඩ වඩාත් සංකීර්ණ වේ. මෙම විශේෂඥ ක්ෂේත්‍රයේ පරමාර්ථය වන්නේ, මෙම ගැටළුවලට විසඳුම් සෙවිය හැකි ක්‍රම පිළිබඳ අවබෝධයක් සිසුන් තුළ වර්ධනය කිරීමයි. දත්ත විශ්ලේෂණය කිරීම හා සැකසීම, සහ ව්‍යවසාය ගැටලු රාශියක් විසඳීම සඳහා එම විශ්ලේෂණයන් භාවිතා කිරීමට සිසුන් ඉගෙන ගනී. අලෙවිකරණය සහ සංඛ්‍යාන විශ්ලේෂණ ක්‍රම සම්බන්ධ අවබෝධය මත පදනම් වූ උපායමාර්ගික පාරිභෝගික සම්බන්ධතා කළමනාකරණය (CRM) වැනි වැදගත් සංකල්ප; සහ සැපයුම් යටිතල පහසුකම් සහ මිලදී ගැනීම් අන්තර්ගත වූ ව්‍යාපාර ආකෘති හැසිරවීමට භාවිතා කරන සැපයුම් දාම කළමනාකරණය (SCM) ද අධ්‍යයනය කෙරේ.

| පාඨමාලා | | |
|---|---|---|
| දත්ත පද්ධති තාක්ෂණ මූලිකාංග | AI 1, 2 සඳහා මෘදුකාංග යදෙුම් | දත්ත මිනිතය න්‍යායන් |
| තොරතුරු තාක්ෂණය සඳහා සංඛ්‍යානය | පරිගණක ප්‍රෝග්‍රෑම් කිරීම (පයිතන්) | යන්ත්‍ර ඉගනෙුම් සහ එහි යදෙවුම් |
| ව්‍යවහාරික තොරතුරු විද්‍යාව සඳහා මූලික ගණිතය | වෙබ් සම්බන්ධ ව්‍යාපාර හඳුන්වාදීම | දත්ත පද්ධති තාක්ෂණයෙ උසස් මාතෘකා |
| පරිගණක සැකසුම් න්‍යාය | දත්ත විද්‍යාව | පාරිසර තරොතුරු පද්ධති |
| වෙබ් වැඩසටහන්කරණය 1, 2 | ගුණාත්මක දත්ත: විශ්ලේෂණය සහ පරිණාමනය | සැලසුම් නිර්මාණ චින්තනය |
| AI සඳහා ගණිතය | ගවේෂණාත්මක දත්ත විශ්ලේෂණය සහ දෘෂ්ටිකල්පනය | අන්තර්ජාල වළෙඳාමෙ උපායමාර්ග සහ අලවේිකරණය |

### ගෝලීය ව්‍යවසායකත්වය

ගෝලීය ව්‍යවසායකයින් තමන්ගේම සහ වෙනත් අයගේ වෙන්චර් ව්‍යාපාර ආරම්භ කිරීම, සංවර්ධනය කිරීම සහ කළමනාකරණය කිරීම, සහ වෙනත් කර්මාන්තවල ව්‍යාපාර සංවර්ධනය සඳහා සහාය වීම වෙනුවෙන් ඔවුන්ගේ විශේෂඥ දැනුම යොදා ගනී. මෙම විශේෂඥ ක්ෂේත්‍රයේ පරමාර්ථය වනුයේ, ගෝලීය ව්‍යාපාර ක්ෂේත්‍රයේ ව්‍යවසායක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය දැනුම හා නිපුනතා ලබා දෙන අතරම, ව්‍යවසායකත්ව මානසිකත්වයක් සහ නායකත්වයක් සිසුන් තුළ වර්ධනය කිරීමයි. ඊ-වාණිජ්‍යත්වය සහ අන්තර්ජාලය මත පදනම් වූ ව්‍යාපාර ඇතුළුව ගෝලීය ව්‍යාපාර කෙරෙහි අවධානය යොමු කරන අතරම, සිසුන් විසින් මූල්‍ය, අලෙවිකරණය සහ කළමනාකරණය පිළිබඳ මූලික සංකල්ප අධ්‍යයනය කරයි.

| පාඨමාලා | | |
|---|---|---|
| තොරතුරු තාක්ෂණය සඳහා සංඛ්‍යානය | බුද්ධිමය දේපල හිමිකම් නීතිය | තොරතුරු තාක්ෂණ ව්‍යාපාරයේ කතිකාව |
| ව්‍යවහාරික තොරතුරු විද්‍යාව සඳහා මූලික ගණිතය | ව්‍යාපාර පරිපාලනය උසස් මාතෘකා | පරිගණක ක්‍රීඩා න්‍යාය සහ කතිකාව |
| වෙබ් වැඩසටහන්කරණය 1 | ව්‍යාපාර කළමනාකරණය ප්‍රායෝගික හැදෑරීම් | සැලසුම් නිර්මාණ චින්තනය |
| තිරසාර සංවර්ධනය උදෙසා නිවැරදිව කටයුතු කිරීම | තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ වත්මන් ගැටළු | ප්‍රායෝගික ක්ලවුඩ් පරිගණනය |
| ආයතනික හැසිරීම | වෙලඳ නාම නිර්මාණය සහ ව්‍යාපාර කළමනාකරණය | ව්‍යවසායකයා සඳහා නව නීති |
| තොරතුරු සදාචාරය උසස් මාතෘකා | අන්තර්ජාල වෙළඳාමේ උපායමාර්ග සහ අලෙවිකරණය | ව්‍යාපෘති කළමනාකරණය |
| වෙබ් සම්බන්ධ ව්‍යාපාර හඳුන්වාදීම | ඉ-වාණිජ ක්‍රමවේද | ගෝලීය මානව සම්පත් සංවර්ධනය |
| ව්‍යාපාර ආර්ථික විද්‍යාව 1, 2 | ව්‍යවසාය කත්වය සහ ව්‍යාපාර ආකෘති | |







## වෙබ් පද්ධති සංවර්ධනය

රීතියක් ලෙස වෙබ් පද්ධති සංවර්ධනයට, සමාගම්වල අභ්‍යන්තර භාවිතය සඳහා අන්තර්ගතයන් තබා ගැනීම සඳහා වූ ආයතන ඇතුලත ජාලයන්හි වෙබ් අඩවි නිෂ්පාදනය කිරීම සහ බාහිර භාවිතය සඳහා ප්‍රදර්ශනය කෙරෙන අන්තර්ජාලයේ වෙබ් අඩවි නිෂ්පාදනය කිරීම යන දෙකම ඇතුළත් වේ. සාමාන්‍යයෙන්, වෙබ් පද්ධති සංවර්ධකයින් ප්‍රෝග්‍රෑම් භාෂා සහ HTML5 වැනි මාර්ක්-අප් භාෂා භාවිතා කරමින් වෙබ් අඩවි කෝඩින් කරයි. කෙසේ වෙතත්, අන්තර්ගතයන් කළමනාකරණ පද්ධති (CMS) භාවිතය ද ඔවුන්ගේ රාජකාරිවලට ඇතුළත් වේ. මෙම විශේෂඥ ක්ෂේත්‍රය තුළ, සිසුන් විසින් වෙබ් පද්ධති ප්‍රෝග්‍රෑම් කරන්නේ කෙසේද සහ කෝඩින් කරන්නේ කෙසේදැයි ඉගෙන ගන්නා අතර, ජාල වල මූලික කරුණු අධ්‍යයනය කරයි.

| පාඨමාලා | | |
|---|---|---|
| දත්ත පද්ධති තාක්ෂණ මූලිකාංග | වෙබ් සම්බන්ධ ව්‍යාපාර හඳුන්වාදීම | වෙබ් වැඩසටහන්කරණය 3 |
| තොරතුරු තාක්ෂණය සඳහා සංඛ්‍යානය | දත්ත පද්ධති තාක්ෂණයේ උසස් මාතෘකා | ඔබ්ජෙක්ට් ඔරියන්ටඩ් ක්‍රමයට පරිගණක ප්‍රෝග්‍රෑම් සැදීම |
| පරිගණක ප්‍රෝග්‍රෑම් කිරීම (පයිතන්) | පරිගණක සැකසුම් න්‍යාය | ඔබ්ජෙක්ට් ඔරියන්ටඩ් ක්‍රමයට පද්ධති සැලසුම් නිර්මාණය |
| ව්‍යවහාරික තොරතුරු විද්‍යාව සඳහා මූලික ගණිතය | ජාලගතකරණ මූලිකාංග | මෘදුකාංග ඉංජිනේරුවේදය |
| වෙබ් වැඩසටහන්කරණය 1, 2 | වෙබ් තාක්ෂණය හඳුන්වාදීම | සැලසුම් නිර්මාණ චින්තනය |
| AI 1 සඳහා මෘදුකාංග යෙදුම් | වෙබ් සේවා ප්‍රවර්ධනය | ජංගම දුරකතන යෙදුම් සංවර්ධනය |

## ජාලකරණ පරිපාලනය

ජාල සේවා යනු වර්තමාන තොරතුරු පද්ධතිවල තීරණාත්මක අංගයකි. ජාල පරිපාලකයින් විසින් පරිගණක ජාල සහ සර්වර් පද්ධති ගොඩනගයි, ගැටළු නිරාකරණය කරයි, එමෙන්ම මෙම ජාල සහ පද්ධති කළමනාකරණය කිරීම සහ සහාය දැක්වීම සිදු කරයි. ජාලයක ගැටළුවක් ඇති වූ විට, ජාල පරිපාලක විසින් ගැටලුවෙන් අත්මිදීමට කටයුතු කරන අතර, ජාලයේ දත්ත ආරක්ෂා කරගනී. මෙම විශේෂඥ ක්ෂේත්‍රය තුළ, ජාල පද්ධතිවල ක්‍රියාකාරිත්වය සහ තොරතුරු ආරක්ෂාව පිළිබඳ දැනුම සිසුන් විසින් ලබා ගනී.

| පාඨමාලා | | |
|---|---|---|
| **දත්ත පද්ධති තාක්ෂණ මූලිකාංග** | AI 1 සඳහා මෘදුකාංග යෙදුම් | තොරතුරු ආරක්ෂණය |
| **තොරතුරු තාක්ෂණය සඳහා සංඛ්‍යානය** | පද්ධති පරිපාලනය | රවුටින් කිරීම සහ ස්විචනය |
| **ව්‍යවහාරික තොරතුරු විද්‍යාව සඳහා මූලික ගණිතය** | ව්‍යවසායකයා සඳහා නව නීති | ජාලකරණය උසස් අධ්‍යයන |
| **වෙබ් වැඩසටහන්කරණය 1** | උසස් රවුටින් කිරීම සහ ස්විචයනය | වෙබ් තාක්ෂණය හඳුන්වාදීම |
| **පරිගණක සැකසුම් න්‍යාය** | ක්ලවුඩ් ජාලකරණය සහ අථත්‍යකරණය | වෙබ් සේවා ප්‍රවර්ධනය |
| **පරිගණක ප්‍රෝග්‍රෑම් කිරීම (පයිතන්)** | IoT සහ රැහැන් රහිත ජාලකරණය | සයිබර් ආරක්ෂණය |
| **ජාලගතකරණ මූලිකාංග** | IoT යෙදුම් පද්ධති | උසස් රවුටින් කිරීම සහ ස්විචයනය |

## IT මැංගා සහ සජීවිකරණය

ජපානයේ අන්තර්ගත-නිර්මාණාත්මක කර්මාන්ත, මංගා සහ ඇනිමෙ මගින් මෙහෙයවනු ලබන අතර, එය ලොව පුරා අවධානය දිනාගෙන ඇත. KCGI හි දී, අන්තර්ගත-නිර්මාණාත්මක කර්මාන්තවල පැරණි ව්‍යාපාරික ආකෘති පර්යේෂණ මත පදනම්ව නව ව්‍යාපාර ආකෘති නිර්මාණය කිරීම මෙන්ම, සැලසුම් කිරීම හා සජීවිකරණ සැලසුම් කිරීම වැනි, නිර්මාණාත්මක කර්මාන්තවල දී මුහුණ දෙන විවිධාකාර තත්වයන් සිසුන් විසින් අත්විඳියි. මෙම විෂය මාලාව මගින්, සිසුන්ට අන්තර්ගත-නිර්මාණය කිරීමේදී, තම තමන්ට ඇති වන ගැටලුවලට විසඳුම් සෙවීමට පුහුණුව ලබා දෙයි. අන්තර්ගත සහ නිර්මාණාත්මක කර්මාන්ත සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ බලය අත්‍යවශ්‍ය වේ, එබැවින් සිසුන් විසින් ඩිජිටල් මෙවලම් භාවිතය ප්‍රගුණ කිරීමට ඉගෙන ගනී. විෂය මාලාව මගින්, විවිධාකාර අවස්ථාවන්හිදී උපක්‍රමශීලි විසඳුම් යෙදීමේ කුසලතාවය ද වර්ධනය කරයි.

| පාඨමාලා | | |
|---|---|---|
| ව්‍යවහාරික තොරතුරු විද්‍යාව සඳහා මූලික ගණිතය | ඩිජිටල් හඬ නිපැයුම | දෘශ්‍ය කථා ඉදිරිපත්කිරීම සහ සන්නිවේදනය |
| පරිගණක සැකසුම් න්‍යාය | උසස් විශේෂ දෘශ්‍ය ප්‍රයෝග | සජීවිකරණය, සැලසුම්, නිෂ්පාදනය, ප්‍රවර්ධනය පිළිබඳ විශේෂ මාතෘකා |
| සජීවිකරණ නිර්මාණය මූලිකාංග - A, B | අන්තර්ගත කර්මාන්තයේ විශේෂ මාතෘකා | පරිගණක චිත්‍රක |
| වෙබ් වැඩසටහන්කරණය 1 | ඩිජිටල් සජීවිකරණ නිර්මාණය | ප්‍රායෝගික සජීවිකරණ නිෂ්පාදනය |
| විශේෂ දෘශ්‍ය ප්‍රායෝග | තිර රචනය සහ කතන්දර | විනෝදාස්වාදය සහ තොරතුරු තාක්ෂණය |
| දෘශ්‍ය ඡයා සැකසුම් | අනර්ඝ, රසවත් මාධ්‍ය අන්තර්ගතයන් නිර්මාණය කිරීම | සන්නාම සැලසුම් නිර්මාණය සහ ව්‍යාපාර කළමනාකරණය |

## සංචාරක තොරතුරු තාක්ෂණය

ජපාන රජයේ සංචාරක ප්‍රවර්ධන සැලැස්ම මෑත වසරවලදී ප්‍රබල බලපෑමක් ඇති කර තිබේ. ජපානයට පැමිණෙන විදේශීය සංචාරකයින්ගේ සංඛ්‍යාව ශ්‍රීඝ්‍රයෙන් ඉහළ යමින් ඇති අතර, 2019 දී මෙතෙක් වාර්තා වූ උපරිමය වන මිලියන 31.88 ක් දක්වා ඉහළ ගොස් ඇත (මූලාශ්‍රය: ජපාන ජාතික සංචාරක සංවිධානයේ සමීක්ෂණය). කියෝතෝ, සප්පොරො සහ තෝකියෝ යන KCGI හි කැම්පස් ඇති සෑම නගරයක්ම සංචාරකයින් අතර බෙහෙවින් ජනප්‍රිය වී ඇත. මෙමගින් සංචාරක සේවාවලට අදාළ එක් අවශ්‍යතාවයක් හා ගැටළුවක් නිරන්තරයෙන් මතක් කරවන වාතාවරණයක් නිර්මාණය කරයි. විශේෂයෙන් සිසුන් හුවමාරු කර ගැනීම සඳහා අවධානය යොමු වී ඇති මෙම විශේෂඥ ක්ෂේත්‍රය මගින්, තොරතුරු තාක්ෂණය භාවිතා කරන නව සංචාරක සේවා සහ ව්‍යාපාරික ආකෘතීන් ගවේෂණය කිරීම සඳහා වූ මෙම වාසි වැඩි කරයි. විවිධ භාෂාවලින් සහ මාධ්‍යවලින් සංචාරක තොරතුරු සැපයීම සහ ඩිජිටල්කරණය, විශ්ලේෂණය සහ පාරිභෝගික ක්‍රියාකාරකම් පුරෝකථනය කිරීම වැනි ක්‍රියාකාරකම් තුළින්, සැබෑ ලෝකයේ ගැටලු විසඳීමට KCGI මිනිසුන්ට උගන්වයි.

| පාඨමාලා | | |
|---|---|---|
| තොරතුරු තාක්ෂණය සඳහා සංඛ්‍යානය | සජීවිකරණය, සැලසුම්, නිෂ්පාදනය, ප්‍රවර්ධනය පිළිබඳ විශේෂ මාතෘකා | ජපන් සමාජය අවබෝධ කර ගැනීම |
| පරිගණක ප්‍රෝග්‍රෑම් කිරීම (පයිතන්) | දත්ත විද්‍යාව | සංචාරක ගමනාන්ත කළමනාකරණය |
| ව්‍යවහාරික තොරතුරු විද්‍යාව සඳහා මූලික ගණිතය | ව්‍යාපාර ආර්ථික විද්‍යාව 1 | සංචාරක දත්ත විශ්ලේෂණය |
| වෙබ් වැඩසටහන්කරණය 1,2 | සන්නාම සැලසුම් නිර්මාණය සහ ව්‍යාපාර කළමනාකරණය | සංචාරක තොරතුරු තාක්ෂණයේ උසස් මාතෘකා |
| ඔබ්ජෙක්ට් ඔරියන්ටඩ් ක්‍රමයට පද්ධති සැලසුම් නිර්මාණය | මාධ්‍ය සන්නිවේදනය | සංචාරක ව්‍යාපාර සැලසුම් නිර්මාණය |
| අනර්ඝ, රසවත් මාධ්‍ය අන්තර්ගතයන් නිර්මාණය කිරීම | ව්‍යාපෘති කළමනාකරණය | සංචාරක තොරතුරු තාක්ෂණ සීමාවාසික පුහුණුව |
| දෘශ්‍ය කථා ඉදිරිපත්කිරීම සහ සන්නිවේදනය | සංචාරක තොරතුරු තාක්ෂණයේ මූලධර්ම | ගෝලීය මානව සම්පත් සංවර්ධනය |
| විශේෂ දෘශ්‍ය ප්‍රායෝග | සංචාරක ව්‍යාපාරයේ මූලධර්ම | ජංගම දුරකතන යෙදුම් සංවර්ධනය |



## කෘතිම බුද්ධිය

21 වන ශතවර්ෂයේ ආරම්භයේ සිටම, සමාජය පරිවර්තනය කිරීම සඳහා නියම කරන ලද මූලික තාක්‍ෂණයක් ලෙස AI ඉස්මතු විය. ගැඹුරු ඉගෙනීමේ න්‍යාය වේගයෙන් ඉදිරියට යද්දී, අන්තර්ජාලය භාවිතයෙන් විශාල දත්ත ලබා ගැනීම පහසු වූ අතර, මයික්‍රොප්‍රොසෙසර සහ අනෙකුත් පරිගණක පද්ධති වේගය සහ ධාරිතාව අතින් විශාල පිම්මක් ඉදිරියට ගියේය. AI සඳහා වන යෙදුම්වල විෂය පථය මහත් වේගයෙන් පුළුල් වෙමින් පවතින අතර, වර්තමානයේ සමීප වී ඇති යාන්ත්‍රික භාෂා පරිවර්තනය, ස්වයං රිය පැදවීමේ වාහන, වෛද්‍ය තොරතුරු සැකසීම, හෙද සත්කාර සේවා සඳහා වූ රොබෝවරු යනාදිය, සහ ඊ-ක්‍රීඩා මෙන්ම ආයතනික උපාය මාර්ග යෝජනා කිරීම, කෘෂිකාර්මික කළමනාකරණය සඳහා නව ප්‍රවේශ සහ වෙනත් ව්‍යාපාරික යෙදුම් මේ සඳහා ඇතුළත් වේ.
KCGI හි AI සඳහා කැපවූ අධ්‍යයන ක්ෂේත්‍රය තුළ, AI න්‍යාය පිළිබඳව මූලික පදනමක් ලබා ගැනීමෙන් සහ එය ක්‍රියාත්මක වන ක්ෂේත්‍ර පිළිබඳ සැබෑ ලෝක උදාහරණ හරහා ඉගෙනීමෙන් සිසුන් මෙය ආරම්භ කරයි. AI තාක්‍ෂණය භාවිතා කිරීම හා යෙදවීමට හැකියාව ඇති වෘත්තිකයන් බිහිකිරීම අරමුණු කරගත් අදාළ බොහෝ මෘදුකාංග වැඩසටහන් අධ්‍යයනය කිරීම සඳහා විෂයමාලාව මීළඟට පිවිසෙයි.

| පාඨමාලා | | |
|---|---|---|
| තොරතුරු තාක්ෂණය සඳහා සංඛ්‍යානය | යන්ත්‍ර ඉගෙනුම් සහ එහි යෙදවුම් | වෛද්‍ය තොරතුරු විද්‍යාව |
| AI පිළිබඳ හැඳින්වීම | සංයෝජන ප්‍රශස්තකරණය | රොබෝ තාක්ෂණය සහ AI |
| ඇල්ගොරිතම හඳුන්වාදීම | AI 1, 2 සඳහා මෘදුකාංග යෙදුම් | දත්ත විද්‍යාව |
| පරිගණක ප්‍රෝග්‍රෑම් කිරීම (පයිතන්) | දත්ත මිනිතය න්‍යායන් | සමාජය සහ AI 1, 2 |
| දත්ත පද්ධති තාක්ෂණ මූලිකාංග | දත්ත පද්ධති තාක්ෂණයේ උසස් මාතෘකා | පරිගණක ප්‍රෝග්‍රෑම් කිරීම (ජාවා) |
| පරිගණක සැකසුම් න්‍යාය | පරිගණක ක්‍රීඩා සහ AI | AI සඳහා ගණිතය |
| ව්‍යවහාරික තොරතුරු විද්‍යාව සඳහා මූලික ගණිතය | ස්වාභාවික භාෂා අවබෝධය / හඬ අවබෝධය | |





## කර්මාන්ත පාඨමාලා

### මූල්‍ය තාක්ෂණය

- මුදල් සහ බැංකුකරණය
- මූල්‍ය තාක්ෂණ මූලිකාංග
- මූල්‍ය තාක්ෂණ පද්ධති සැලසුම් නිර්මාණය

### කෘෂිකර්මය

- නූතන යුගයේ කෘෂිකාර්මික තොරතුරු විද්‍යාව
- කෘෂිකාර්මික ආර්ථිකය
- කෘෂිකාර්මික තොරතුරු පද්ධති නිර්මාණය

### සාමුද්‍රික

- සාමුද්‍රික කර්මාන්තවල මූලිකාංග
- සාමුද්‍රික තොරතුරු පද්ධති නිර්මාණය

### සෞඛ්‍ය සහ වෛද්‍ය

- වෛද්‍ය තොරතුරු සහ නීතිය
- වෛද්‍ය තොරතුරු විද්‍යාව
- වෛද්‍ය තොරතුරු පද්ධති නිර්මාණය

### අන්තර්ගත අලෙවිකරණය

- අන්තර්ගත කර්මාන්තයේ විශේෂ මාතෘකා
- සංගීතය සහ තොරතුරු තාක්ෂණය
- විනෝදාස්වාදය සහ තොරතුරු තාක්ෂණය
- අන්තර්ගත ප්‍රවර්ධන උපායමාර්ග

### අධ්‍යාපනයය

- ඉ-ඉගෙනුම් ක්‍රමයේ මූලිකාංග
- ඉ-ඉගෙනුම් ව්‍යාපාරවල උපදෙස් නිර්මාණය
- ඉ-ඉගෙනුම් පාඨමාලා සටහන් සංවර්ධනය
- පුස්තකාල තොරතුරු විද්‍යාව
- පාසැල් හා ආයතනික අධ්‍යාපනය පිළිබඳ ජාත්‍යන්තර සංසන්දනාත්මක අධ්‍යයනය

## ආධාරක වරණීය පාඨමාලා

| | | |
|---|---|---|
| ව්යවහාරික තොරතුරු විද්‍යාව සඳහා මූලික ගණිතය | මාධ්‍ය සන්නිවේදනය | ව්‍යවහාරික තොරතුරු තාක්ෂණවේදය වැදගත් සාධක A |
| තොරතුරු තාක්ෂණය සඳහා සංඛ්‍යානය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ ව්‍යාපාර සන්නිවේදනය | ව්‍යවහාරික තොරතුරු තාක්ෂණවේදය වැදගත් සාධක B |
| තාක්ෂණික සංනිවේදන හැකියාවන් | පද්ධති නිර්මාණය උසස් මාතෘකා | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ ව්‍යාපාර සන්නිවේදනය-ගැඹුරින් අධ්‍යනය |
| ව්යාපාර විස්තර ඉදිරිපත් කිරීම | පද්ධති න්‍යාය උසස් මාතෘකා | තාක්ෂණික ඉංග්‍රීසි සන්නිවේදන කුසලතා |
| ව්යාපාර සන්නිවේදනය 1, 2 | නිෂ්පාදන පද්ධති ඉංජිනේරුවේදය | |
| තාර්කික චින්තනය | රොබෝ ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය | |

## අනිවාර්ය

| | | |
|---|---|---|
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කර්මාන්තයේ වෘත්තීය සංනිවේදනය | නායකත්ව න්‍යාය | ව්‍යාපෘති පදනම් |

## ප්‍රධාන ව්‍යාපෘතිය

| | | | |
|---|---|---|---|
| ප්‍රධාන වාර්තාව | ප්‍රධාන ව්‍යාපෘතිය | ගෞරව ප්‍රධාන ව්‍යාපෘතිය | ගෞරව ප්‍රධාන නිබන්ධනය |

# වෘත්තීය උපාධියක් ලබා ගැනීමේ පියවර

## පළමු වසර සිසුන් පළමු සමාසිකය 1

### මූලික දැනුම පිළිබඳ තීව්‍ර අධ්‍යයනය

- පාසලට ඇතුලත් වීමේ උත්සවය / නවක ශිෂ්‍ය දිශානතිය / අධ්‍යයන උපදේශනය
- වසන්ත සමයේ අඛණ්ඩ විභාග
- ගිම්හාන සමයේ තීව්‍ර ඉගැන්වීම් පන්ති

**ඉසුරුමත් ශිෂ්‍ය ජීවිතයක්**

- නවක සිසුන් පිළිගැනීමේ උත්සවය
- විදේශීය හවුල්කාර විශ්ව විද්‍යාලයක සීමාවාසික පුහුණුව (ආගන්තුක කථිකාචාර්ය)
- පුද්ගලික සමාගමක ව්‍යාපාර සීමාවාසික පුහුණුව
- ප්‍රසංග
- වෘත්තීය උපදේශනය


පාසලට ඇතුලත් වීමේ උත්සවය

## පළමු වසර සිසුන් දෙවන සමාසිකය 2

### ඉහළ විශේෂඥ දැනුමක් ලබා ගැනීම
### ඔබේ ප්‍රධාන ව්‍යාපෘතිය සකස් කිරීම ආරම්භ කිරීම

- ප්‍රධාන ව්‍යාපෘතිය සඳහා සූදානම් වීම ආරම්භ කිරීම
- සරත් සමයේ අඛණ්ඩ විභාග
- වසන්ත සමයේ තීව්‍ර පන්ති
- කීර්තිමත් ජපන් හා විදේශීය උපදේශකයින්ගේ විශේෂ දේශන

**ඉසුරුමත් ශිෂ්‍ය ජීවිතයක්**

- වෘත්තීය මාර්ගෝපදේශනය
- විවිධ රැකියා-සෙවුම් ආධාරක පන්ති
- නොවැම්බර් මස උත්සවය


පන්ති කාමරයක දර්ශනයක්

## දෙවන වසර සිසුන් තෙවන සමාසිකය 3

### ප්‍රායෝගික හා වඩාත් උසස් විෂයයන් අධ්‍යයනය කිරීම
### ඔබේ ප්‍රධාන ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කිරීම

- ඔබේ ප්‍රධාන ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කිරීම
- වසන්ත සමයේ අඛණ්ඩ විභාග
- ගිම්හාන සමයේ තීව්‍ර ඉගැන්වුම් පන්ති

**ඉසුරුමත් ශිෂ්‍ය ජීවිතයක්**

- පුද්ගලික සමාගම් විසින් සරසවිය තුළ කෙරෙන ඉදිරිපත් කිරීම්
- විවිධ සුදුසුකම් ලබා ගැනීම
- විදේශීය හවුල්කාර විශ්ව විද්‍යාලයක සීමාවාසික පුහුණුව (ආගන්තුක කථිකාචාර්ය)
- ප්‍රසංග
- විවිධ තරඟ වලට සහභාගී වීම


වසන්ත සෘතුවේ තීව්‍ර පන්ති.
තේපැන් හෝරාව හරහා ගුරුවරුන් සමඟ ගැඹුරු දැනුම් හුවමාරුව.

## දෙවන වසර සිසුන් සිව්වන සමාසිකය 4

### විශේෂීකරණය වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාකාරකම් සහ අධ්‍යයනය
### ප්‍රධාන ව්‍යාපෘතිය සඳහා තේමාව සම්පූර්ණ කිරීම

- වාචික ඉදිරිපත් කිරීමක් හරහා කෙරෙන ප්‍රධාන ව්‍යාපෘතිය පිළිබඳ සම්මුඛ සාකච්ඡාව
- කීර්තිමත් ජපන් හා විදේශීය උපදේශකයින්ගේ විශේෂ දේශන
- KCG සම්මාන (KCG සහ KCGI හි වඩාත්ම කැපී පෙනෙන ව්‍යාපෘති නිවේදනය කිරීම)
- උපාධි ප්‍රදානෝත්සවය

**ඉසුරුමත් ශිෂ්‍ය ජීවිතයක්**

- උපාධිය නිම කිරීමේ සැමරුම්



KCG සම්මාන



සමාරම්භය


ප්‍රධාන ව්‍යාපෘතියේ අවසාන පරීක්ෂණය



### සයිරයිල් කොෂක් Cyryl Koshyk මහාචාර්ය

තොරතුරු තාක්ෂණය (විද්‍යාවේදී) උපාධිය, ක්‍රකොව් ආර්ථික විශ්ව විද්‍යාලය, පෝලන්තය
සිනේමැට් ශබ්දාගාරයේ නිර්මාතෘ; ඩාර්ක් හොරයිසන් ශබ්දාගාරයේ නිර්මාතෘ.
රූපවාහිනී කර්මාන්තයේ සංකීර්ණ විශේෂ ප්‍රායෝගයන්හි නිෂ්පාදනය සහ සංස්කරණයේ දෘශ්‍ය ප්‍රායෝග අධීක්ෂකයකු ලෙස කටයුතු කිරීම
ඔහු, ‘300’, ‘එලයිසියම්’, ‘නව් යූ සී මී’, ‘ආෆ්ටර් අර්ත්’, ‘සයිලන්ට් හිල්: රෙවලේෂන්’, ‘ප්‍රොමිතියස්’ ඇතුළු ව්‍යාපෘති ගණනාවකට සම්බන්ධව කටයුතු කර ඇත.



### මසාෂි කුරතානි Masashi Kuratani මහාචාර්ය

විද්‍යා හා තාක්ෂණවේදී උපාධිය, මෙහෙයුම් පර්යේෂණ උපාධි පාඨමාලාවක් සම්පූර්ණ කිරීම (විද්‍යා හා තාක්ෂණවේදය පශ්චාත් උපාධියකට සමාන)
ජපාන ජාතික ආරක්ෂක ඇකඩමිය, ජපාන සමුද්‍රීය ස්වයං ආරක්ෂක බලකාය (JMSDF)
හිටපු ප්‍රධාන යාත්‍රික - JDS Hatsuyuki ප්‍රහාරක නෞකාව හිටපු කපිතාන් - JDS Umigiri ප්‍රහාරක නෞකාව හිටපු ප්‍රධාන නිලධාරි - JDS Yudachi, ප්‍රහාරක නෞකාව JMSDF
හිටපු ප්‍රධාන උපදේශක (යුධ ඉතිහාසය), නිලධාරි පුහුණු පාඨමාලාව, 1වැනි සේවා පාසල, JMSDF
හිටපු උපදේශක (උපාය), නිලධාරි පුහුණු පාඨමාලාව, 1වැනි සේවා පාසල, JMSDF
බුක්යෝ විශ්ව විද්‍යාලයේ උපාධි පාසලේ පශ්චාත් උපාධි පාඨමාලාව (ප්‍රධාන විෂය නැගෙනහිර ආසියානු ඉතිහාසය)
හිටපු උපදේශක (උපාය මාර්ග හා යුධ කටයුතු), යුද ඉතිහාස සම්මන්ත්‍රණය, ආරක්ෂක ක්‍රමෝපාය අධ්‍යයන හා පර්යේෂණ අංශය, මාණ්ඩලික විද්‍යාලය, JMSDF



### හොං හොං සංග් Hong Seung Ko මහාචාර්ය

ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය - කොරියාවේ ටොන්ග් ගොක් විශ්ව විද්‍යාලය
ඉංජිනේරු ආචාර්ය උපාධිය - කියොතෝ විශ්ව විද්‍යාලය
තොරතුරු උපායමාර්ග පිළිබඳ හිටපු කළමනාකරු - සැම්සුන් ඉලෙක්ට්‍රොනික්ස් සමාගම
හිටපු ප්‍රධාන විධායක නිලධාරි - Harmony Navigation, Co., Ltd.
තාක්ෂණික කමිටු සාමාජික, CALS/EC සංගමය, කොරියාව



### ටඩාෂි කොන්ඩෝ Tadashi Kondo මහාචාර්ය

ටොකුෂිමා විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු උපාධිය
ඔසාකා විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති සහ ආචාර්ය උපාධිය
ටොෂිබා සංස්ථාවේ පාලන පර්යේෂණ, විදුලිබල හා කාර්මික පද්ධති පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ හිටපු ප්‍රධානී
වෛද්‍ය පීඨයේ හිටපු මහාචාර්ය; සෞඛ්‍ය විද්‍යා උපාධි පාසලේ හිටපු මහාචාර්ය; වාචික විද්‍යා උපාධි පාසලේ හිටපු මහාචාර්ය; සහ ටොකුෂිමා විශ්ව විද්‍යාලයේ විශ්‍රාමලත් මහාචාර්ය



### කසුයුකි සක්ක Kazuyuki Sakka මහාචාර්ය

විද්‍යාවේදී උපාධිය - කියොතෝ විශ්ව විද්‍යාලය
විද්‍යා ආචාර්ය උපාධිය - කියොතෝ විශ්ව විද්‍යාලය
හිටපු අර්ධකාලීන කථිකාචාර්ය, කියෝතෝ විශ්ව විද්‍යාලය



### ටකාෂි සාටෝ Takashi Sato මහාචාර්ය

නගෝයා තාක්‍ෂණ ආයතනයේ ඉංජිනේරු පීඨයේ පරිගණක විද්‍යා උපාධිය
ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය (යටිතල පහසුකම් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විශේෂීකරණය), තොත්තොරි විශ්ව විද්‍යාලය
NEC සංස්ථාවේ හිටපු සාමාන්‍යාධිකාරී



### අයිකි සැටෝමි Eiki Satomi මහාචාර්ය

ව්‍යාපාර පරිපාලනය පශ්චාත් උපාධිය - ඔටාරු වාණිජ විශ්වවිද්‍යාලය
Nanko Building Ltd. සමාගමෙහි සහ DATT, Ltd. සමාගමෙහි (වත්මනෙහි DATT JAPAN INC., සේවය කර පසුව 1996 දී Media Magic Co., Ltd සමාගම ස්ථාපිත කළේය.
මෙම සමාගමේ සභාපති මෙන්ම අධ්‍යක්ෂද මෙතුමන්ය. උප සභාපති - හොකයිඩෝ තොරතුරු පද්ධති කර්මාන්ත සංගමය
නියෝජිත - හොකයිඩෝ ජංගම දුරකථන අන්තර්ගතයන් ප්‍රවර්ධන සභාව
පළමු සාමාජික - සපෝරෝ වාණිජ හා කර්මාන්ත මණ්ඩලය 2වැනි හොකයිඩෝ තොරතුරු තාක්ෂණ උපායමාර්ග ඇගයීම් කමිටුව



### සැන්ෆර්ඩ් ගෝල්ඩ් Sanford Gold මහාචාර්ය

ශාස්ත්‍රවේදී උපාධිය මිචිගන් විශ්ව විද්‍යාලය (ඇමරිකා එක්සත් ජනපදය)
ශාස්ත්‍රපති උපාධිය, ආචාර්ය උපාධිය, කොලොම්බියා විශ්ව විද්‍යාලය (ඇමරිකා එක්සත් ජනපදය)
ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ, අධ්‍යයන වැඩසටහන ADP, LLC.ආයතනය
අධ්‍යයන අධ්‍යක්ෂ, Prudential Financial, Inc.
අධ්‍යාපන උපදේශක, EY ආයතනය



### පෙයියන් ෂෝ Peiyan Zhou මහාචාර්ය

පීකිං විශ්ව විද්‍යාලයේ චීන භාෂා හා සාහිත්‍ය දෙපාර්තමේන්තුවේ කලා උපාධිය,
කියෝතෝ ප්‍රාන්ත විශ්ව විද්‍යාලයේ ජීව හා පාරිසරික විද්‍යා පීඨයේ කලා හා විද්‍යා ශාස්ත්‍රපති උපාධිය
සීමාසහිත හුයිටායි සංස්කෘතික සංවර්ධන සමාගමෙහි (චීනය) අධ්‍යක්ෂ



### යුවෙක්සින් සන් Yuexin Sun මහාචාර්ය

ටියැන්ජින් විදේශ අධ්‍යයන විශ්ව විද්‍යාලයේ ජපන් අධ්‍යයන පාසලේ ශාස්ත්‍රවේදී උපාධිය
කියෝතෝ ප්‍රාන්ත විශ්ව විද්‍යාලයේ ජීව හා පාරිසරික විද්‍යා පීඨයේ කලා හා විද්‍යා ශාස්ත්‍රපති උපාධිය
කියෝතෝ විශ්ව විද්‍යාලයේ වාස්තු විද්‍යා දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය
සීමාසහිත හුයිටායි සංස්කෘතික සංවර්ධන සමාගමෙහි (චීනය) සභාපති



### යුතක තකහෂි Yutaka Takahashi මහාචාර්ය

ඉංජිනේරු (විද්‍යාවේදී) උපාධිය, කියෝතෝ විශ්ව විද්‍යාලය ඉංජිනේරු (විද්‍යාපති) උපාධිය, (ව්‍යවහාරික ගණිතය හා භෞතික විද්‍යාව ප්‍රධාන) කියෝතෝ විශ්ව විද්‍යාලයේ උපාධි පාසල
පර්යේෂණ මගපෙන්වීම අනුමත කිරීම සහිත ආචාර්ය උපාධි පාඨමාලාවෙන් ආපසු ගැනීම, කියෝතෝ විශ්ව විද්‍යාලයේ උපාධි පාසල (ව්‍යවහාරික ගණිතය හා භෞතික විද්‍යාව ප්‍රධාන)
ඉංජිනේරු ආචර්ය උපාධිය, කියෝතෝ විශ්ව විද්‍යාලය ගෞරවණීය මහාචාර්ය, කියෝතෝ විශ්ව විද්‍යාලය
තොරතුරු තාක්ෂණ විද්‍යාව පිළිබඳ හිටපු මහාචාර්ය, කියෝතෝ විශ්ව විද්‍යාලය හිටපු බාහිර මහාචාර්ය, පැරිස්- සුඩ් විශ්ව විද්‍යාලය (ප්‍රංශය)
හිටපු බාහිර මහාචාර්ය, පැරිස් සුඩ් විශ්ව විද්‍යාලය (ප්‍රංශය) හිටපු බාහිර මහාචාර්ය, පරිගණක විද්‍යාව හා ස්වයංක්‍රියකරණය පිළිබඳ පර්යේෂණ සඳහා වූ ප්‍රංශ ආයතනය
මෙහෙයුම් පර්යේෂණ ජපාන ව්‍යාපෘති සංගමයේ නායක, විවිධ මට්ටමේ සම්බන්ධිත කේබල් භාවිතයෙන් ඒකාබද්ධ සන්නිවේදනය සහ විකාශන තාක්ෂණය දියුණු කිරීම සඳහා
R&D ව්‍යාපෘතිය, ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය



### රියොඑයි තකහෂී Ryoei Takahashi මහාචාර්ය

විද්‍යා (විද්‍යාවේදී) උපාධිය, විද්‍යා (විද්‍යාපති) උපාධිය (ගණිතය ප්‍රධාන), ආචාර්ය උපාධිය (ඉංජිනේරු), වසෙද විශ්ව විද්‍යාලය
පද්ධති තොරතුරු ඉංජිනේරු පිළිබඳ හිටපු මහාචාර්ය, හචිනොහෙ තාක්ෂණික ආයතනය
ආචාර්ය උපාධි පාඨමාලාවේ හිටපු පර්යේෂණ උපදේශක, හචිනොහෙ තාක්ෂණික ආයතනය
හිටපු සේවක NTT යොකොසුක R&D මධ්‍යස්ථානය
හිටපු සේවකයෙකු, NTT සුරක්ෂිත මට්ටමේ විද්‍යාගාරය



### යෂුහිරෝ ටැකීඩා Yasuhiro Takeda මහාචාර්ය

ප්‍රධාන විධායක නිලධාරී, සීමාසහිත ගයිනැක්ස් කියෝතෝ සමාගම
ජපානයේ විද්‍යා ප්‍රබන්ධ සහ ෆැන්ටසි ලේඛකයින්ගේ (SFWJ) සහ ජපානයේ අභ්‍යවකාශ කතුවරුන්ගේ සමාජයේ (SACJ) සාමාජික
ගයිනැක්ස් හි ආදිකතෘ සාමාජික. නාඩියා, ද සීක්‍රට් ඔෆ් බ්ලූ වෝටර් සහ ටෙන්ගන් ටෝපා ගුරෙන් ලාගන් ඇතුළු ජපානයේ බොහෝ ප්‍රසිද්ධ සජීවිකරණ කෘතිවල නිෂ්පාදකයා



### තොෂිඅකි තතෙඉෂි Toshiaki Tateishi මහාචාර්ය

වාණිජවේදී උපාධිය, වසෙද විශ්ව විද්‍යාලයේ නියෝජිත අධ්‍යක්ෂක, මැන්ඩෙලානෙට් සමාගම
ජපන් අන්තර්ජාල සේවා සපයන්නන්ගේ සංගමයේ කළමනාකාර අධ්‍යක්ෂක සහ උප සභාපති
අන්තර් ප්‍රාදේශීය අධිවේගී ජාලකරණ සංවිධානයේ ප්‍රධාන විධායක අධ්‍යක්ෂක
නියෝජිත අධ්‍යක්ෂක, අන්තර්ජාල බුද්ධි අංශය, ඔකිනවා සමාගම
ප්‍රවර්ධන කළමණාකරු, විද්‍යුත් තැපැල් අන්තර්ජාල නිසි භාවිතය භාවිතය



### මසයෝෂි තෙසුක Masayoshi Tezuka මහාචාර්ය

ඉංජිනේරු (විද්‍යාවේදී) උපාධිය, ඔසාකා විශ්ව විද්‍යාලය
ඉංජිනේරු (විද්‍යාපති) උපාධිය, ඔසාකා විශ්ව විද්‍යාලය
හිටපු ජ්‍යෙෂ්ඨ පර්යේෂක, ෆුජිත්සු රසායනාගාරය
හිටපු ජ්‍යෙෂ්ඨ කළමනාකරු, ෆුජිත්සු කළමනාකරණ ආයතනය
හිටපු මහාචාර්ය, තොරතුරු තාක්ෂණ ඉංජිනේරු විද්‍යාව, කනසව තාක්ෂණික ආයතනය



### ෂොසො නයිතො Shozo Naito මහාචාර්ය

කියෝතෝ විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු උපාධිය
කියෝතෝ විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු ශාස්ත්‍රපති උපාධිය
කියෝතෝ කොම්පියුටර් ගකුඉන් කමොගාවා සරසවියේ විදුහල්පති
NTT තොරතුරු හුවමාරු වේදිකා විද්‍යාගාර හිටපු ප්‍රධාන පර්යේෂක
කොරියාවේ තොරතුරු ආරක්ෂණ ඒජන්සියේ උපදේශක මහාචාර්ය



### යුකිහිරෝ නකමුරා Yukihiro Nakamura මහාචාර්ය

ඉංජිනේරු උපාධිධාරී, ක්යෝතෝ විශ්ව විද්‍යාලය; ඉංජිනේරු විද්‍යාපති උපාධිය, කියෝතෝ විශ්ව විද්‍යාලයේ උපාධි පාසල (ගණිත ඉංජිනේරු ප්‍රධාන)
ඉංජිනේරු ආචර්ය උපාධි ගෞරවණීය මහාචාර්ය,කියෝතෝ විශ්ව විද්‍යාලය; මහාචාර්ය, තොරතුරු තාක්ෂණ උපාධි පාසල, කියෝතෝ විශ්ව විද්‍යාලය
හිටපු මහාචාර්ය, පොදු ඉංජිනේරු පර්යේෂණ ආයතනය, රිත්සුමෙකන් විශ්ව විද්‍යාලය
හිටපු කළමනාකරු, දැනුම සැකසුම් පර්යේෂණ දෙපාර්තමේන්තුව, තොරතුරු සම්ප්‍රේෂණ ජාල පර්යේෂණ මධ්‍යස්ථානය
NTT සංස්ථාව; කළමනාකරු, අධි-වේග සම්ප්‍රේෂණ සැකසුම් පර්යේෂණ මධ්‍යස්ථානය තොරතුරු සම්ප්‍රේෂණ ජාල පර්යේෂණ මධ්‍යස්ථානය
NTT සංස්ථාව; පළමුවන කණ්ඩායම් නායක, පර්තනොන් සභාපති, පර්තනොන් පර්යේෂණ සංගමයේ විශේෂිත ලාභ නොලබන සංස්ථාව
හිටපු සභාපති, උසස් විද්‍යාව කියෝතෝ තාක්ෂණ හා කළමනාකරණ පර්යේෂණ ආයතනය



### නිට්සා මෙලස් Nitza Melas මහාචාර්ය

“සර්ක්යු ඩු සොලෙයිල්” (Cirque du Soleil) හි ප්‍රධාන ගායක ගායක සහ ගීත රචක
හිටපු කථිකාචාර්ය, ඇමරිකා එක්සත් ජනපදයේ කැලිෆෝනියා සංගීත ආයතනය
ඇය ලෝක සංගීත සඳහා ලොස් ඇන්ජලීස් සංගීත සම්මානයෙන් පිදුම් ලැබීය.
ලෝක සංගීත සඳහා හොලිවුඩ් සංගීත සම්මානය, ඩෙකා සම්මානය සහ තවත් බොහෝ සම්මාන



### යසුහිරෝ නොයිෂිකි Yasuhiro Noishiki මහාචාර්ය

විද්‍යා හා ඉංජිනේරු (විද්‍යාවේදී) උපාධි රිත්සුමෙකන් විශ්ව විද්‍යාලය
පෙර හැව්ලෙට්- පැකාර්ඩ් සංවර්ධන සමාගම, L.P.



### අකිර හසෙගව Akira Hasegawa මහාචාර්ය

විද්‍යා (විද්‍යාවේදී) උපාධිය,ඇමරිකා එක්සත් ජනපදයේ රොචෙස්ටර් තාක්ෂණික ආයතනය
විද්‍යා (විද්‍යාපති) උපාධිය,ඇමරිකා එක්සත් ජනපදයේ රොචෙස්ටර් තාක්ෂණික ආයතනය
සැලසුම් කළමණාකරු: පරිගණක අධ්‍යාපනය පිළිබඳ ජාත්‍යන්තර සංවර්ධනය (NPO)



### කොයිචි හසෙගව Koichi Hasegawa මහාචාර්ය

ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය, හොකයිදෝ විශ්ව විද්‍යාලය
ශාස්ත්‍රපති උපාධිය, පෙන්සිල්වේනියා රාජ්‍ය විශ්ව විද්‍යාලය
දර්ශනය පිළිබඳ ආචාර්ය උපාධිය, හොකයිදෝ විශ්ව විද්‍යාලය
NHK (ජපාන විකාශන සංස්ථාව) හි හිටපු ප්‍රවෘත්ති කැමරා ශිල්පියා



### පීටර් ජී ඇන්ඩර්සන් Peter G. Anderson මහාචාර්ය

විද්‍යා (විද්‍යාවේදී) උපාධිය, ඇමරිකා එක්සත් ජනපදයේ මැසචුසෙට්ස් තාක්ෂණ ආයතනය
දර්ශනය පිළිබඳ ආචාර්ය උපාධිය, මැසචුසෙට්ස් තාක්ෂණ ආයතනය
හිටපු ජ්‍යෙෂ්ඨ වැඩසටහන් සම්පාදක, RCA හි පරිගණක අංශය
ගෞරවණීය මහාචාර්ය, ඇමරිකා එක්සත් ජනපදයේ රොචෙස්ටර් තාක්ෂණික ආයතනය



### මසාඕ ෆුකුෂිමා Masao Fukushima මහාචාර්ය

තොරතුරු හා ගණිත විද්‍යා දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු උපාධිය හා ඉංජිනේරු ශාස්ත්‍රපති උපාධිය සහ කියෝතෝ විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය
විශ්‍රාමික මහාචාර්ය; කියෝතෝ විශ්ව විද්‍යාලයේ තොරතුරු තාක්ෂණය පිළිබඳ හිටපු මහාචාර්ය
නාරා විද්‍යා හා තාක්ෂණ ආයතනයේ තොරතුරු විද්‍යා අංශයේ හිටපු මහාචාර්ය
නැන්සාන් විශ්ව විද්‍යාලයේ විද්‍යා හා ඉංජිනේරු පීඨය සහ උපාධි පාසලේ හිටපු මහාචාර්ය
ජපානයේ මෙහෙයුම් පර්යේෂණ සංගමයේ සාමාජික



### ටකාඕ ෆුජිවරා Takao Fujiwara මහාචාර්ය

කියෝතෝ විශ්ව විද්‍යාලයේ විද්‍යාවේදී උපාධිය, කියෝතෝ විශ්වවිද්‍යාලයේ උපාධි පාසලේ ආචාර්ය උපාධිය (තාරකා භෞතික විද්‍යාව ප්‍රධාන කොටගත්),
විද්‍යා ආචාර්ය උපාධිය
කලාව පිළිබඳ කියෝතෝ නාගරික විශ්ව විද්‍යාලයේ විශ්‍රාමික ගරු මහාචාර්ය, කලාව පිළිබඳ කියෝතෝ නාගරික විශ්වවිද්‍යාලයේ සෞන්දර්ය කලා
දෙපාර්තමේන්තුවේ හිටපු මහාචාර්ය සහ අංශ ප්‍රධානී
කියෝතෝ කොම්පියුටර් ගකුයින් හි හිටපු අර්ධ-කාලීන උපදේශක



### මසකි ෆුජිවාරා Masaki Fujiwara මහාචාර්ය

ශාස්ත්‍රපති උපාධිය, නිර්මාණාත්මක නගර සඳහා උපාධි පාසල, ඔසාකා නගර විශ්වවිද්‍යාලය; පී.එච්.ඩී, කළමනාකරණ තොරතුරු විද්‍යාව,
සෙට්සුනන් විශ්ව විද්‍යාලය; සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර උපදේශක
කළමනාකරණ සැලසුම් දෙපාර්තමේන්තුවේ හිටපු කළමනාකරු සහ ප්‍රධාන උපදේශක, කේ.එස්.ආර්. ආයතනය
හිටපු මහාචාර්ය, ව්‍යාපාර සංකල්ප දෙපාර්තමේන්තුව, මියාගි විශ්ව විද්‍යාලය; අධ්‍යක්ෂ, ව්‍යාපාර සැලසුම් අධ්‍යයනාංශය, මියාගි විශ්ව විද්‍යාලය; සහකාර පර්යේෂණ අධ්‍යක්ෂ, ව්‍යාපාර සැලසුම් පර්යේෂණ අධ්‍යයනාංශය, මියාගි විශ්ව විද්‍යාලය; හිටපු කථිකාචාර්ය, බොන්ඩ් ව්‍යාපාරික පාසල, බොන්ඩ් විශ්ව විද්‍යාලය (BBT MBA);
ආරාධිත මහාචාර්ය, මියාගි විශ්ව විද්‍යාලය



### මසහිරෝ ෆුරුසාවා Masahiro Furusawa මහාචාර්ය

කේඕ විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු උපාධිය සහ ඉංජිනේරු ශාස්ත්‍රපති උපාධිය (පාලන ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විශේෂීකරණය)
සීමාසහිත නොමුරා පර්යේෂණ ආයතනයේ හිටපු පද්ධති ඉංජිනේරු
කර්මාන්ත තක්සේරු ඉංජිනේරු, සීමාසහිත SAP ජැපෑන් සමාගම
අර්ධකාලීන මහාචාර්ය, මියාගි විශ්ව විද්‍යාලය



### ෆ්‍රෙඩ්රික් ජොන් ලෝරන්ටයින් Fredric Jon Laurentine මහාචාර්ය

ශාස්ත්‍රපති උපාධිය, බ්‍රවුන් විශ්ව විද්‍යාලය, ඇමරිකා එක්සත් ජනපදය
ව්‍යාපාර පරිපාලන විද්‍යාපති උපාධිය, හාර්වර්ඩ් විශ්ව විද්‍යාලය, ඇමරිකා එක්සත් ජනපදය
පෙරාතුව ඇමරිකා එක්සත් ජනපදයේ, ප්‍රොක්ටර් ඇන්ඩ් ගැම්බල් හි සේවය කළේය
පෙරාතුව ඇමරිකා එක්සත් ජනපදයේ සන් මයික්‍රොසිස්ටස්, ඉන්කෝපරේටඩ් හිදී සේවය කළේය
නිර්මාතෘ සහ සභාපති, ටු අයිස් ටු ඉයර්ස්, ඇමරිකා එක්සත් ජනපදය



### නඕයා බෙස්ෂෝ Naoya Bessho මහාචාර්ය

කියෝ විශ්වවිද්‍යාලයේ නීතිය පිළිබඳ කලාවේදී උපාධිය
යාහූ ජපන් සංස්ථාවේ විවිධ තනතුරු, නීති අංශයේ කළමනාකරු; විධායක අධ්‍යක්ෂක; ප්‍රතිපත්ති සැලසුම් අංශයේ කළමනාකරු සහ ජොෂ්ය අනුකූලතා නිලධාරී;
සභාපති කාර්යාලයේ කළමනාකරු; ප්‍රචාරණය, නීතිය, ප්‍රතිපත්ති සැලසුම් සහ පොදු සේවා පිළිබඳ ප්‍රධාන නිලධාරී; සහ බුද්ධි අංශ ප්‍රධාන නිලධාරී;
දැනට Yahoo Japan Corporation හි ජොෂ්ය උපදේශක ඇතුළු Yahoo Japan Corporation හි විවිධ තනතුරු Luke Consultants Co., Ltd හි නියෝජිත අධ්‍යක්ෂක.
Kioicho Strategy Institute, Inc. හි අධ්‍යක්ෂක, ජපානයේ නීති සහ පරිගණක සංවිධානයේ අධ්‍යක්ෂක, ජාන තොරතුරු සංවිධානයේ අධ්‍යක්ෂක,
ජපානයේ තොරතුරු තාක්ෂණ එකමුතුවේ අධ්‍යක්ෂක



### මාර්ක් හසේගව-ජොන්සන් Mark Hasegawa-Johnson මහාචාර්ය

විද්‍යා (විද්‍යාවේදී) උපාධිය, විද්‍යා (විද්‍යාපති) උපාධිය, විද්‍යා ආචාර්ය උපාධිය (විදුලි හා පරිගණක ඉංජිනේරු), මැසචුසෙට්ස් තාක්ෂණික ආයතනය (ඇමරිකා එක්සත් ජනපදය)
මහාචාර්ය, ඉලිනොයිස් විශ්ව විද්‍යාලය (ඇමරිකා එක්සත් ජනපදය) පර්යේෂක, උසස් ඩිජිටල් විද්‍යා මධ්‍යස්ථානය (සිංගප්පූරුව)
හිටපු සහායක මහාචාර්ය, ඉලිනොයිස් විශ්ව විද්‍යාලය (ඇමරිකා එක්සත් ජනපදය)
හිටපු පශ්චාත් ආචාර්ය උපාධිධාරි, කැලිෆෝනියා විශ්ව විද්‍යාලය ලොස් ඇන්ජලීස් (ඇමරිකා එක්සත් ජනපදය)
හිටපු පර්යේෂණ සහකාර, මැසචුසෙට්ස් තාක්ෂණික ආයතනය (ඇමරිකා එක්සත් ජනපදය) හිටපු ඉංජිනේරු, ෆුජිත්සු රසායනාගාර සමාගම
හිටපු තාක්ෂණික ශිල්පි, මෝටරෝලා පර්යේෂණ විද්‍යාගාර (ඇමරිකා එක්සත් ජනපදය)



### මසනොබු මත්සුඔ Masanobu Matsuo මහාචාර්ය

ඉංජිනේරු (විද්‍යාවේදී) උපාධිය, කියෝතෝ විශ්ව විද්‍යාලය
විද්‍යා (විද්‍යාපති) උපාධිය,කැලිෆෝනියා විශ්ව විද්‍යාල ය, සැන්ටා බාබාරා
දර්ශනය පිළිබඳ ආචාර්ය උපාධිය, කැලිෆෝනියා විශ්ව විද්‍යාලය, සැන්ටා බාබාරා
මෘදුකාංග පර්යේෂණ අංශයේ ප්‍රථම නියෝජිත, සුමිටෝමෝ විද්‍යුත් කර්මාන්ත සමාගම ඇමරිකා එක්සත් ජනපදය
සමාගමෙන් විශ්‍රාම ගැනීමෙන් පසු ඔහු ටුවින් සන් ඉන්ක් (වත්මන් නම ඔපන් ඇක්සිස් සංස්ථාව) ඇමරිකාවේ ස්ථාපිත කළේය.
ප්‍රධාන විධායක නිලධාරියෙක් ලෙස ඔහු වෛද්‍ය තොරතුරු හා උපදේශන ක්ෂේත්‍රවල විශාල පරිමාණ මෘදුකාංග සංවර්ධනය හා සැලසුම්කරණ සිදුකර ඇත.



### හිරොකො මනෝ Hiroko Mano මහාචාර්ය

වසෙදා විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධිය හා කලා ආචාර්ය උපාධිය (කලා ඉතිහාස ක්ෂේත්‍රය), සාහිත්‍ය මහාචාර්ය
බර්ලිනයේ හුම්බෝල්ට් විශ්වවිද්‍යාලයෙන් කලා ඉතිහාස ක්ෂේත්‍රයේ දර්ශනය පිළිබඳ ආචාර්ය උපාධිය



### මායා බෙන්ට්ස් Maya Bentz මහාචාර්ය

ශාස්ත්‍රවේදී උපාධිය, බිලිසි රාජ්‍ය විශ්ව විද්‍යාලය, ජෝර්ජියාව
ගුරු විද්‍යාලයෙන් අධ්‍යාපනය පිළිබඳ ආචාර්ය උපාධිය, කොලොම්බියා විශ්ව විද්‍යාලය, ඇමරිකා එක්සත් ජනපදය
බාහිර ශිෂ්‍ය, පෘජු විශ්ව විද්‍යාලය, ඇමරිකා එක්සත් ජනපදය
හිටපු ජාත්‍යන්තර ව්‍යාපෘති සම්බන්ධීකාරක, දුරස්ථ ඉගෙනුම් ව්‍යාපෘතිය, කොලොම්බියා විශ්ව විද්‍යාලය



### කෝසෝ මයුමි Kozo Mayumi මහාචාර්ය

නගෝයා තාක්ෂණ ආයතනයේ කළමනාකරණ ඉංජිනේරු උපාධිය කියෝතෝ විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු ශාස්ත්‍රපති උපාධිය සහ ඉංජිනේරු ආචාර්ය උපාධිය
(සංඛ්‍යාත්මක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විශේෂීකරණය) වැන්ඩර්බිල්ට් විශ්ව විද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය අර්ධ වශයෙන් පූර්ණය, ආර්ථික
විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබාගෙන ඉවත් වීම
ටොයෝ ඇලුමිනියම් K.K. හි හිටපු සේවක කියෝතෝ කොම්පියුටර් ගකුඉන් හි හිටපු අර්ධ කාලීන උපදේශක ටොකුෂිමා විශ්ව විද්‍යාලයේ හිටපු මහාචාර්ය
පාරිසරික ආර්ථික විද්‍යාව, පරිසර පද්ධති සේවා සහ ආර්ථික ව්‍යුහයන් පිළිබඳ ජර්නලය ඇතුළු විශේෂඥ සඟරා කිහිපයක කර්තෘ කමිටුවල සාමාජික



### මිලන් විලච් Milan Vlach මහාචාර්ය

විද්‍යාවේදී උපාධිය, චාර්ල්ස් විශ්ව විද්‍යාලය, චෙක් ජනරජය
ස්වභාවික විද්‍යා ආචාර්ය උපාධිය, චාර්ල්ස් විශ්ව විද්‍යාලය, චෙක් ජනරජය දර්ශනය පිළිබඳ ආචාර්ය උපාධිය, චාර්ල්ස් විශ්ව විද්‍යාලය, චෙක් ජනරජය
විද්‍යා ආචාර්ය උපාධිය, චෙකොස්ලෝවැකියානු විද්‍යා ඇකඩමිය
හිටපු මහාචාර්ය, චාර්ල්ස් විශ්ව විද්‍යාලය, චෙක් ජනරජය
තොරතුරු විද්‍යාව පිළිබඳ හිටපු මහාචාර්ය, ජපන් උසස් විද්‍යා හා තාක්ෂණික ආයතනය (JAIST)



### සොනොයො මුකයි Sonoyo Mukai මහාචාර්ය

විද්‍යාවේදී උපාධිය හා තාරකා භෞතික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය,කියෝතෝ විශ්ව විද්‍යාලය
හිටපු මහාචාර්ය, කනසාවා තාක්ෂණික ආයතනය හිටපු මහාචාර්ය, විද්‍යා හා තාක්ෂණ දෙපාර්තමේන්තුව, කින්කි විශ්ව විද්‍යාලය
අධ්‍යක්ෂ හා සභාපති, ජපානයේ දුරස්ථ සංවේදන සංගමය
විගණකාධිපති සහ නිත්‍ය අධ්‍යක්ෂ, ජපාන වායු විද්‍යා හා තාක්ෂණ සංගමය විද්‍යාව ප්‍රවර්ධනය සඳහා ජපන් සමාජ විශේෂඥ කමිටුව
ආසියා-පැසිෆික් දුරස්ථ සංවේදී කමිටුව ජපාන විද්‍යා ශාඛාවේ උපාධිධාරී කාන්තාවන්ගේ කමිටුව



### තදෂි මුකයි Tadashi Mukai මහාචාර්ය

විද්‍යාවේදී උපාධිය භෞතික විද්‍යා විද්‍යාපති උපාධිය සහ භෞතික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය, කියෝතෝ විශ්ව විද්‍යාලය ගෞරවණීය මහාචාර්ය, කෝබෙ විශ්ව විද්‍යාලය
ජාත්‍යන්තර තාරකා විද්‍යා සංගමයේ සාමාජික, ජපානයේ තාරකා විද්‍යා සංගමයේ විශේෂ සාමාජික (ශාඛා කාර්යාලයේ හිටපු අධ්‍යක්ෂක)
ග්‍රහලෝක විද්‍යාව පිළිබඳ ජපන් සමාජයේ සාමාජික (හිටපු සභාපති) කළමනාකරණ මණ්ඩලයේ සභාපති, නිෂි-හරිම තාරකා නිරීක්ෂණ උද්‍යානය
හිටපු මහාචාර්ය, කනසාවා තාක්ෂණික ආයතනය හිටපු මහාචාර්ය, කෝබෙ විශ්ව විද්‍යාලය
හිටපු බාහිර මහාචාර්ය, ජපාන අභ්‍යාවකාශ ගවේෂණ ආයතනය හිටපු ප්‍රධානි, කෝබෙ විශ්වවිද්‍යාලයේ ග්‍රහලෝක විද්‍යාව පිළිබඳ මධ්‍යස්ථානය



### ෂිසුකා මොදිකා Shizuka Modica මහාචාර්ය

ශාස්ත්‍රවේදී උපාධිය, ඩොෂිෂා විශ්ව විද්‍යාලය, අධ්‍යාපන ශාස්ත්‍රපති උපාධිය, හාර්වර්ඩ් විශ්ව විද්‍යාලය, ඇමරිකා එක්සත් ජනපදය දර්ශනය පිළිබඳ ආචාර්ය උපාධිය, වර්ජිනියා විශ්ව විද්‍යාලය, ඇමරිකා එක්සත් ජනපදය
සම-නිර්මාතෘ සහ හවුල්කරු, i.m.i ආයතනය LLC, ඇමරිකා එක්සත් ජනපදය හිටපු ශිෂ්‍ය සේවා සම්බන්ධීකාරක සහ රාජ්‍ය සේවය සඳහා වූ වෙල්ඩන් කූපර් මධ්‍යස්ථානයේ කථිකාචාර්ය, වර්ජිනියා විශ්ව විද්‍යාලය,
ඇමරිකා එක්සත් ජනපදය හිටපු පර්යේෂණ සහායක, ඩාර්ඩන් ව්‍යාපාර පරිපාලන පාසල, වර්ජිනියා විශ්ව විද්‍යාලය, ඇමරිකා එක්සත් ජනපදය
හිටපු ව්‍යාපාරික කළමනාකරු, හෘද අනුරූපන මධ්‍යස්ථානය, වර්ජිනියා විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පාසල, ඇමරිකා එක්සත් ජනපදය
හිටපු විශ්ව විද්‍යාල ආයතනික මහජන සම්බන්ධතා නිලධාරි සාමාජික, උප සභාපතිගේ විශේෂ වැඩසටහන් සහකාර
සහකාර කළමණාකරු, MBA පාඨමාලාව, ජපාන ජාත්‍යන්තර විශ්ව විද්‍යාලය හිටපු නීති ලේකම්, පැසිපික් සම්පත්, ඇමරිකා එක්සත් ජනපදය
හිටපු ලේකම්, සුමිටෝමෝ ෆොරෙස්ට්‍රි ඇමරිකා සංස්ථාපිත ආයතනය, ඇමරිකා එක්සත් ජනපදය ෆුල්බ්‍රයිට් කොමිසමේ ජාත්‍යන්තර අධ්‍යාපන පරිපාලන වැඩසටහන් සම්මානය



### මසායසු මොරිටා Masayasu Morita මහාචාර්ය

ශාස්ත්‍රවේදී, බර්ක්ලි විශ්වවිද්‍යාලය, ඇමරිකා එක්සත් ජනපදය
අධ්‍යාපනපති, හාවඩ් විශ්වවිද්‍යාලය ඇමරිකා එක්සත් ජනපදය
දර්ශනපති, කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලය, එක්සත් රාජධානිය
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ALC PRESS සංස්ථාපිත ප්‍රධාන විධායක නිලධාරී හිටෝමිඩියා ඉන්කෝපරේෂන්



### යි ලි Yi Li මහාචාර්ය

ශාස්ත්‍රපති උපාධිය, බීජිං භාෂා සහ සංස්කෘතික විශ්ව විද්‍යාලය
තොරතුරු තාක්ෂණ විද්‍යාපති උපාධිය, කියෝතෝ තොරතුරු විද්‍යා උපාධි අධ්‍යයන විද්‍යාලය
SAP සහතික කරන ලද උපදේශක (මූල්‍ය ගිණුම්කරණය, කළමනාකරණ ගණකාධිකරණය, නිෂ්පාදන සැලසුම්කරණය, නිෂ්පාදන, යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීම, විකුණුම් හා බෙදාහැරීම)
හිටපු කථිකාචාර්ය, ඩලියන් විදේශ භාෂා විශ්ව විද්‍යාලය සීමාසහිත AD රසායනාගාර සමාගමේ හිටපු අධ්‍යක්ෂ



### මෙයිහුයි ලි Meihui Li මහාචාර්ය

උපාධිධාරී, පෙර පාසැල් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ෂෙන්යන්ග් සාමාන්‍ය විශ්ව විද්‍යාලය හිටපු ළදරු පාසල් විදුහල්පති, ඩාලියන් නැව් තැනීමේ කර්මාන්ත සමාගම
හිටපු සාමාජික, විද්‍යා හා තාක්ෂණ සංගමය, ඩාලියන් නැව් තැනීමේ කර්මාන්ත සමාගම
හිටපු කළමනාකරු, විදේශීය අධ්‍යාපන සේවා මධ්‍යස්ථානයේ අංක 2 ජපන් අංශය, ඩාලියන් විදේශීය භාෂා විශ්ව විද්‍යාලය
හිටපු විධායක උප සභාපති, ඩාලියන් ෂිෂුආ විදේශීය අධ්‍යාපන සේවා සමාගම
ඩාලියන් කාර්යාලයෙහි හිටපු ප්‍රධාන කළමනාකරු, කියෝතෝ තොරතුරු විද්‍යා උපාධි අධ්‍යයන විද්‍යාලය
ඩාලියන් කාර්යාලයෙහි හිටපු ප්‍රධාන කළමනාකරු, සුබරු මෝටර් රථ ඉංජිනේරු විද්‍යාල අධ්‍යක්ෂක, කියෝතෝ තොරතුරු විද්‍යා උපාධි අධ්‍යයන විද්‍යාලය
චීන ස්වාධීන ආයතනයේ තොරතුරු කළමනාකරණය පිළිබඳ සංගමයේ සාමාජික



### ෆෙයි ලියු Fei Liu මහාචාර්ය

ඉංජිනේරු විද්‍යාපති උපාධිය, කියෝතෝ තාක්ෂණික ආයතනය (තොරතුරු විද්‍යාව)
උප විදුහල්පති, කියෝතෝ කොම්පියුටර් ගැකුයින්, කමොගාවා සරසවිය බාහිර මහාචාර්ය, කාර්මික සම්බන්ධතා පිළිබඳ චීන ආයතනය
බාහිර මහාචාර්ය, ලලිත කලා පිළිබඳ චීන මධ්‍යම ඇකඩමිය බාහිර මහාචාර්ය, බීජිං පොලිටෙක්නික් විද්‍යාලය
බාහිර මහාචාර්ය, බීජිං සිටි විශ්ව විද්‍යාලය බාහිර මහාචාර්ය, චීනයේ වෘත්තීය අධ්‍යාපන සංගමය
බාහිර මහාචාර්ය, වෘත්තීය අධ්‍යාපනය සඳහා නව ඉගැන්වීමේ උපකරණ ද්‍රව්‍ය සපාදනය සහ ඇගයීම් කමිටුව, චීනය



### අකියෝෂි වතනබේ Akiyoshi Watanabe මහාචාර්ය

ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය, හොකයිදෝ විශ්ව විද්‍යාලය
ඉංජිනේරු (විද්‍යාපති) උපාධිය, (ව්‍යවහාරික පද්ධති විද්‍යාව) කියොතෝ විශ්ව විද්‍යාලය
හිටපු සාමාජික, නකමිචි සමාගම



### කත්සුමස වතනබේ Katsumasa Watanabe මහාචාර්ය

ඉංජිනේරු විද්‍යාවේදී, කියෝතෝ විශ්වවිද්‍යාලය ඉංජිනේරු ආචාර්ය උපාධිය - කියොතෝ විශ්ව විද්‍යාලය
හිටපු සහායක මහාචාර්ය, කියොතෝ විශ්ව විද්‍යාලය හිටපු මහාචාර්ය, ෆුකුයි විශ්ව විද්‍යාලය
හිටපු බාහිර මහාචාර්ය, පැරිස්- සුඩ් විශ්ව විද්‍යාලය (ප්‍රංශය)
ජපාන තොරතුරු සැකසුම් සමිතියේ සාමාජිකයෙක්

## ◆ සහකාර මහාචාර්යවරු



### සෙයිඉචිරෝ අඔකි Seiichiro Aoki සහායක මහාචාර්ය

විද්‍යා (විද්‍යාවේදී) උපාධිය ඔසාකා විශ්ව විද්‍යාලය, විද්‍යාපති / ආචාර්ය උපාධි තෝකියෝ විශ්ව විද්‍යාලය පූර්ණ සාමාජික, ජපානයේ තාරකා විද්‍යා සංගමය
තාරකා විද්‍යා ප්‍රවර්ධන ව්‍යාපෘතියේ සාමාන්‍යධිකාරී, කියොතෝ විශ්ව විද්‍යාලය (අර්ධ-කාලීන උපදේශක)
අර්ධ කාලීන උපදේශක, කන්සායි විශ්ව විද්‍යාලය අර්ධ-කාලීන උපදේශක,ඔසාකා ආර්ථික විද්‍යා විශ්ව විද්‍යාලය
හිටපු ව්‍යාපෘති පර්යේෂකයා, විද්‍යා උපාධි විද්‍යාලය, ඔසාකා විශ්ව විද්‍යාලය
හිටපු උපදේශක සහකාර, විද්‍යා උපාධි විද්‍යාලය, කියෝතෝ විශ්ව විද්‍යාලය හිටපු අර්ධ කාලීන උපදේශක, ෂීගා විශ්ව විද්‍යාලය



### අමිත් ප්‍රියාර් Amit Pariyar සහායක මහාචාර්ය

තායිලන්තයේ ආසියානු තාක්ෂණ ආයතනයේ පරිගණක විද්‍යා හා තොරතුරු කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු ශාස්ත්‍රපති උපාධිය
කියෝතෝ විශ්ව විද්‍යාලයේ තොරතුරු විද්‍යා පාසලේ පරිගණක විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය හා ආචාර්ය උපාධිය
පශ්චාත් ආචාර්ය උපාධි පර්යේෂක, සමාජ තොරතුරු විද්‍යා හා තාක්ෂණ නවෝත්පාදන ආයතනය (ISITI), යුනිවර්සිටි මැලේෂියා සරවක් (මැලේසියාව)



### වොලොඩිමීර් මිග්ඩල්ස්කි Volodymyr Mygdalskyy සහායක මහාචාර්ය

විද්‍යා හා ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, ඔඩෙස්සා I.I. මෙක්නිකොව් ජාතික විශ්ව විද්‍යාලය කියෝතෝ විශ්ව විද්‍යාලයේ පරිගණක විද්‍යා ආචාර්ය උපාධිය
හිටපු පරිගණක විද්‍යා සහකාර ඔඩෙස්සා I.I. මෙක්නිකොව් ජාතික විශ්ව විද්‍යාලය
කියෝතෝ විශ්ව විද්‍යාලයේ හිටපු විශේෂ කථිකාචාර්ය හිටපු තාවකාලික කථිකාචාර්ය, ඩොෂිෂා විශ්ව විද්‍යාලය
කන්සායි විශ්ව විද්‍යාලයේ හිටපු අර්ධකාලීන කථිකාචාර්ය



### කෙන්ගෝ ඔනිෂි Kengo Onishi සහායක මහාචාර්ය

වාස්තු විද්‍යා (විද්‍යාවේදී) උපාධිය, කන්සායි විශ්ව විද්‍යාලයෙ ඔනිෂි බිල්ඩිං සමාගම් අධ්‍යක්ෂක, පළමු පන්තියේ සුදුසුකම්ලත් ගෘහ නිර්මාණ ශිල්පි
හදිසි අවදානම් විචාරක, කියොතෝ ප්‍රාන්තය, භූචලන ප්‍රතිරෝධක ගොඩනැගිලි ඇගයුම්කරු, කියොතෝ ප්‍රාන්තය
22 වන පොදු සම්මේලන සංගමයේ සභාපති හා විගණක, කියොතෝ යෞවන අංශය
ආරම්භක සහ පළමු උප ප්‍රධාන,කියොතෝ කෙයිකන් සංසදයේ (NPO) අධ්‍යක්ෂක,කියොතෝ ජූනියර් චැම්බර් ඉන්ටර්නැෂනල්
ආරම්භකයා සහ පළමු නියෝජිත, කිනොමචිදුකුරි සම්මේලනය (NPO)
31 වැනි සභාපති, ජපාන ඉදිකිරීම් කියොතෝ ඉදිකිරීම් සමාජය මිත්සුයි හෝම් සමාගමේ පෙර සේවය කරන ලදී



### මින්ග් හු Ming Hu සහායක මහාචාර්ය

විද්‍යා (විද්‍යාවේදී) උපාධිය, කිංඩාඕ විශ්ව විද්‍යාලය. ගුයිශු විශ්ව විද්‍යාලයේ විද්‍යාපති උපාධිය (ගණිතය ප්‍රධාන) සම්පූර්ණ කරන ලදී
කියොතෝ විශ්ව විද්‍යාලයේ තොරතුරු තාක්ෂණ උපාධි පාසලේ ආචාර්ය උපාධිය සම්පූර්ණ කරන ලදී
තොරතුරු තාක්ෂණය පිළිබඳ මහාචාර්ය
තොරතුරු තාක්ෂණ විද්‍යාව පිළිබඳ හිටපු විදේශීය ජාතික පර්යේෂකයක, කියොතෝ විශ්ව විද්‍යාලයේ තොරතුරු තාක්ෂණ උපාධි පාසල
හිටපු විශේෂ පර්යේෂක,විද්‍යා ප්‍රවර්ධනය සඳහා ජපන් සංගමය



### හිරනෝරි සකමොටෝ Hironori Sakamoto සහායක මහාචාර්ය

ටෝකියෝ තාක්ෂණ ආයතනයේ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය, ටෝකියෝ විශ්වවිද්‍යාලයේ ගණිත විද්‍යා උපාධි පාසලේ ගණිත විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
නිහොන් යුනිසිස් තාක්ෂණ පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ සේවා නියුක්තිකයෙකි



### රියොකෝ තකහෂි Ryoko Takahashi සහායක මහාචාර්ය

කලා ශාස්ත්‍රවේදී සහ ශාස්ත්‍රපති උපාධි, ඩොෂිෂා විශ්ව විද්‍යාලය
උපාධිධාරි, කියෝතෝ පරිගණක ගැකුයින්
තොරතුරු තාක්ෂණ (විද්‍යාපති) උපාධිය, කියෝතෝ තොරතුරු විද්‍යා උපාධි අධ්‍යයන විද්‍යාලය



### අකිහිකෝ තකේද Akihiko Takeda සහායක මහාචාර්ය

පශු වෛද්‍ය විද්‍යා (විද්‍යාපති) උපාධිය, නිහොන් විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
පශු වෛද්‍ය විද්‍යා පද්ධතියේ ඉංජිනේරු, හිතාචි සංස්ථා කණ්ඩායම
ඉ-ජපානය (ඉ-රජයේ) ව්‍යාපෘති සාමාජික
ප්‍රාථමික ප්‍රධානි, කියෝටෝ පරිගණක ගැකුයින් හි තොරතුරු පද්ධති අංශය
නියෝජිත අධ්‍යක්ෂක, ඉන්ටෙල්ක් සැපයුම් සමාගම



### අත්සුෂි ටබුෂි Atsushi Tabuchi සහායක මහාචාර්ය

ඉංජිනේරු (විද්‍යාවේදී) උපාධිය, විදුලි ඉංජිනේරු විද්‍යා (විද්‍යාපති) උපාධිය කියොතෝ විශ්ව විද්‍යාලය
හිටපු සාමාජික, NEC මධ්‍යම පර්යේෂණාගාරය



### තකඕ නකගුචි Takao Nakaguchi සහායක මහාචාර්ය

උපාධිධාරී, කියොතෝ පරිගණක ගැකුයින් කියෝතෝ තොරතුරු විද්‍යා උපාධි අධ්‍යයන විද්‍යාලය ව්‍යවහාරික තොරතුරු විද්‍යාව පිළිබඳ උපාධි පාඨමාලාව හඳාරා ඇත,
තොරතුරු තාක්ෂණ (විශේෂඥ) විද්‍යාපති උපාධිය පන්තියේ ඉහළම ලෙස සමත් වී ඇත.
පරිගණක විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය ලබා ගනිමින් කියෝතෝ විශ්ව විද්‍යාලයේ තොරතුරු තාක්ෂණ උපාධි පාසලේ ආචාර්ය උපාධි පාඨමාලාව හඳාරා ඇත.
හිටපු අධ්‍යක්ෂක සහ කළමණාකරු, පද්ධති සංවර්ධන දෙපාර්තමේන්තුව, ඇඩ්මැක්ස්; හිටපු ආරාධිත පර්යේෂණ ශිල්පී, මානව තොරතුරු ව්‍යාපෘතිය (HIP)
ජාත්‍යන්තර උසස් විදුලි සංදේශ පර්යේෂණ ආයතනය (ATRI); හිටපු ප්‍රධාන තාක්ෂණ නිළධාරී, අන්ට්‍රාන්ඩ් කෝපරේෂන්; හිටපු ප්‍රධාන තාක්ෂණ නිලධාරි
@ඉසුමි හිටපු ප්‍රධාන පරීක්ෂක හිටපු විශේෂ පර්යේෂක, NTT උසස් තාක්ෂණ සංස්ථාව; තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධි පාසල, කියොතෝ විශ්ව විද්‍යාලය සාමාජික: ඉලෙක්ට්‍රොනික් ආයතනය,
තොරතුරු හා සන්නිවේදන ඉංජිනේරු;මෘදුකාංග විද්‍යා හා තාක්ෂණ ජපන් සමාජය; සහ ජපානයේ තොරතුරු සැකසුම් සමිතිය.



### බෙන්ජමින් නුවෙල් Benjamin Nouvel සහායක මහාචාර්ය

ටූලූස් විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රවේදී උපාධිය
ටූලූස් විශ්ව විද්‍යාලයෙන් උපාධිය ලබා, පැරිස් විශ්ව විද්‍යාලයේ (සෝබෝන්) කලා ඉතිහාසය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
ලුවර් කෞතුකාගාරයේ, බහුමාධ්‍ය දෙපාර්තමේන්තුවේ, ජපාන-ප්‍රංශ ඒකාබද්ධ ව්‍යාපෘතියේ හිටපු සම්බන්ධීකාරක,
ජැපෑන් එක්ස්පෝ හි හිටපු අන්තර්ගත සැලසුම් කළමනාකරු



### යුකෝ මසුඩා Yuko Masuda සහායක මහාචාර්ය

කොලොම්බියා විශ්ව විද්‍යාලයේ (නිව්යෝර්ක්, ඇමරිකා එක්සත් ජනපදය) සමාජ කාර්ය පිළිබඳ පාසලේ සමාජ කාර්ය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
මානසික සෞඛ්‍ය පිළිබඳ පශ්චාත් උපාධි මධ්‍යස්ථානයේ මනෝ විශ්ලේෂණය සහ විශ්ලේෂණ මනෝචිකිත්සාව පිළිබඳ සිව් අවුරුදු ශාස්ත්‍රපති උපාධිය
සොෆියා විශ්ව විද්‍යාලයේ විදේශ අධ්‍යයන පීඨයේ ස්පාඤ්ඤ භාෂා අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය (විදේශීය අධ්‍යයන)



### ඉසු මත්සුඔ Izu Matsuo සහායක මහාචාර්ය

කියෝතෝ විශ්ව විද්‍යාලයෙන් නීතිවේදී උපාධිය, දකුණු කැලිෆෝනියා විශ්වවිද්‍යාලයේ උපාධි පාඨමාලාවෙන් MBA
සෝනි ඉලෙක්ට්‍රොනික්ස් ඉන්කෝපරේෂන් (ඇමරිකා එක්සත් ජනපදය) හි හිටපු ජොෂ්ය නිෂ්පාදන අලෙවි කළමනාකරු, කාල් සෙයිස් විෂන් ඉන්කෝපරේෂන් (ඇමරිකා එක්සත් ජනපදය) හි හිටපු නිෂ්පාදන අලෙවි කළමනාකරු, කියෝසෙරා ඉන්ටර්නැෂනල් ඉන්කෝපරේෂන් (ඇමරිකා එක්සත් ජනපදය) හි හිටපු ජොෂ්ය නිෂ්පාදන කළමනාකරු, එක්ස්පීඩියා හෝල්ඩින්ග්ස් KK හි හිටපු බටහිර ජපානයේ ප්‍රාදේශීය කළමනාකරු



### ජූලියා යොනෙතනි Julia Yonetani සහායක මහාචාර්ය

ඕස්ට්‍රේලියාවේ සිඩ්නි විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධිය, තෝකියෝ විශ්වවිද්‍යාලයේ කලා හා විද්‍යා උපාධි පාසලෙන් කලා හා විද්‍යා ශාස්ත්‍රපති (ජාත්‍යන්තර සමාජ විද්‍යා ක්ෂේත්‍රය), ආසියාවේ ANU විද්‍යාලයේ සහ ඕස්ට්‍රේලියානු ජාතික පැසිෆික් විශ්වවිද්‍යාලයේ ඉතිහාසය පිළිබඳ ආචාර්ය (ඉතිහාස ක්ෂේත්‍රය) වර්තමානයේ කියෝතෝ ප්‍රාන්තයේ නන්තාන් හි ගොවියෙකු ලෙස සේවය කරන අතරතුර, ලොව පුරා ප්‍රදර්ශනවලදී සෞන්දර්යාත්මක බලපෑමක් ඇති කරන කෘති ප්‍රදර්ශනය කරමින් සමකාලීන කලාකරුවෙකු ලෙස සේවය කරයි.


ඊ-ඉගෙනුම් කලාගාරය


ප්‍රායෝගික විද්‍යාගාරය


විවේකාගාරය


පුස්තකාලය



# කැම්පස්

## කියෝතෝ ප්‍රධාන පාසල

කියෝතෝ ප්‍රධාන පාසල කැම්පස් දෙකකින් සමන්විත වේ. මෙම සරසවිවල විවිධාකාර වූ ශිෂ්‍ය ප්‍රජාව විසින්, ව්‍යවහාරික තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ඉහළම අධ්‍යයන උපාධිය වන තොරතුරු තාක්‍ෂණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ගැනීම සඳහා පුළුල් පරාසයක අධ්‍යයන හා පර්යේෂණ කටයුතු සිදුකරයි. ෂටල් බස් රථය මගින් කැම්පස් දෙක අතර නොමිලේ ගමන් කල හැකිය.

### හයකුමන්බෙන් සරසවිය, සක්යෝ-කු, කියෝතෝ

2004 දී, පාසලට සිසුන් ඇතුලත් කිරීම ආරම්භ කිරීමත් සමගම, හයකුමන්බෙන් සරසවිය අධ්‍යාපන හා පර්යේෂණ මධ්‍යස්ථානයක් ලෙස පිහිටවනු ලැබීය. බොහෝමයක් පන්ති මෙම ගොඩනැගිල්ල තුළ පවත්වන බැවින්, සාමාන්‍යයෙන් සිසුන් හා මහාචාර්යවරු විශාල සංඛ්‍යාවක් මෙහි රැස්වේ. කියෝතෝ කේන්ද්‍රයේ ඇති කියෝතෝ විශ්ව විද්‍යාලයට ආසන්නව ශිෂ්‍යයන් බහුලව ගැවසෙන ප්‍රදේශයක පිහිටා ඇති බැවින්, ඉගෙනීමේ හා සිතීමේ නිදහස සඳහා වූ වාතාවරණයකින් මෙම කැම්පස්එක පිරී ඇත. එක්තරා කාලයක මෙම කැම්පස්එක KCG හි විශාල පරිගණක මධ්‍යස්ථානයක් වී තිබූ අතර, එහි සිසුන් විසින් UNIVAC Vanguard පරිගණක භාවිතයෙන් පරිගණක පුහුණුවීම් සිදු කරන ලදී.

### කියෝතෝ එකිමඑ සැටලයිට්, මිනාමි-කු, කියෝතෝ

කියොතෝ එකිමාර් චන්ද්‍රිකාව 2005 වසන්ත ඍතුවේ දී නිම කරන ලදී. විශාල මගීන් සංඛ්‍යාවක් සංක්‍රමණය වන ගමනාගමන මධ්‍යස්ථානයක් වන කියෝතෝ දුම්රිය ස්ථානයට යාබදව පිහිටා ඇති මෙම කැම්පස්එක සුවිශේෂී වූ පහසු ස්ථානයක තිබේ. විවෘත බාහිර පෙනුමෙන් කැපී පෙනෙන කියොතෝ එකිමාර් චන්ද්‍රිකාව අති නවීන ඊ-ඉගෙනුම් කලාගාරයකින් සමන්විත වන අතර, දේශන රාශියක් මෙම ස්ථානයේ සිට ජාත්‍යන්තරයට බෙදා හැරීමට හැකිවී තිබේ. KCG හි පිහිටි කියොතෝ එකිමාර් සරසවිය සමඟ එක්ව, නවීන තොරතුරු තාක්ෂණ අධ්‍යාපනයේ ප්‍රධාන මධ්‍යස්ථානයක් ලෙස කියොතෝ එකිමාර් චන්ද්‍රිකාව ක්‍රියා කරයි.








## චන්ද්‍රිකා කැම්පස්

ප්‍රධාන කැම්පස්එක මෙන්ම, චන්ද්‍රිකා කැම්පස් ද, දැනටමත් වෘතීය ලෝකයට අවතීර්ණ වූ අය ද ඇතුළුව විවිධාකාර සිසුන්ව ආකර්ෂණය කර ගනී. චන්ද්‍රිකා කැම්පස් සමඟ කියෝතෝ ප්‍රධාන කැම්පස් එක සම්බන්ධ වනු ලබන්නේ, ලබාදෙන-පන්ති (ප්‍රධාන කැම්පස්එකේ සිට පැමිණෙන උපදේශකයින් විසින් පවත්වනු ලබන පන්ති) මගින් පමණක් නොව, ප්‍රධාන කැම්පස්එක සමඟ රියල් ටයිම් සම්බන්ධ වන නවීනතම ඊ-ඉගෙනුම් පද්ධති මගින් ද වේ. කලින් පටිගත කරන ලද වීඩියෝ භාවිතා කරමින් කෙරෙන ඉගෙනීම ද ලබාදෙනු ලැබේ. තවද, සෑම සිසුවෙකුටම තම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සහය වීමට, එක් එක් චන්ද්‍රිකාවේ සිටින කැපවූ උපදේශකයින් විසින් ඉතා වැදගත් අධ්‍යයන උපකාර ලබා දෙයි.

### සප්පොරො චන්ද්‍රිකාව dGIC ඉන්කෝපරේෂන් තුල පිහිටා ඇත

2012 අප්‍රේල් මාසයේ දී, ජපානයේ ඉතා උතුරින් පිහිටි හොක්කයිදෝ ප්‍රාන්ත මධ්‍යයේ පිහිටි සප්පොරො හි සප්පොරො චන්ද්‍රිකා කැම්පස්එක විවෘත විය. කියෝතෝ නගරයෙන් පිටත පිහිට වූ පළමු KCG කණ්ඩායම් පහසුකම මෙම කැම්පස්එක වේ.
සප්පොරො චන්ද්‍රිකා කැම්පස් හි කැපවී කාර්ය කරන උපදේශකයින් සියල්ලම දැනට තොරතුරු තාක්ෂණ කර්මාන්තයේ ඉදිරි පෙළේ ක්‍රියාකාරීව යෙදී සිටි. තොරතුරු තාක්ෂණ කර්මාන්තයේ වර්තමාන ගැටළු වලදී, උපදේශකයින් ඔවුන්ගේ අත්දැකීම් කථා සමඟ නවතම කර්මාන්ත තොරතුරු එකට සම්මිශ්‍ර කරයි. එමගින්, නුදුරු අනාගතයේ දී තොරතුරු තාක්ෂණ ව්‍යාපාරයට අවශ්‍ය දැනුම, කුසලතා සහ සන්නිවේදන හැකියාවන් පිළිබඳ පැහැදිලි විස්තර කිරීම් ලබා දෙයි. මෙම පාඨමාලාව මගින් හොක්කයිදෝ හි තොරතුරු තාක්ෂණ පුහුණුව ලබන සිසුන්ව පමණක් නොව, කියෝතෝ ප්‍රධාන කැම්පස් හි සිසුන්ව ද බුද්ධිමය වශයෙන් උත්තේජනය කරයි.

### තෝකියෝ චන්ද්‍රිකාව හිතොමීඩියා ඉන්කෝපරේටඩ් හි පිහිටා ඇත

තෝකියෝ චන්ද්‍රිකාව, තෝකියෝ හි මිනාතො නගරයේ රොප්පොන්ගි හිල්ස් අසල ස්ථානයක පිහිටා ඇත. තෝකියෝ චන්ද්‍රිකාව සප්පොරො චන්ද්‍රිකාවෙන් පසු ඇති වූ දෙවන ස්ථානය ලෙස 2012 ඔක්තෝම්බර් මාසයේදී විවෘත විය.
තෝකියෝ චන්ද්‍රිකාවෙ හි සිටින බොහෝ උපදේශකයින් වර්තමාන සමාජයේ වේගවත් ඩිජිටල්කරණයේ ඉදිරි පෙළ ක්‍රියාකාරීන් වේ. මේ හේතුව නිසා, තෝකියෝ චන්ද්‍රිකාව විසින් ලබාදෙන තොරතුරු තාක්‍ෂණ පුහුණුව සහ තාර්කික චින්තනයේ පන්ති, කියෝතෝ ප්‍රධාන කැම්පස් හි සිසුන් ඇතුළු සිසුන්ගේ නිරන්තර ප්‍රියතමයන් වේ. ලෝක වේදිකාවේ වැදගත් කාර්යභාරයක් ඉටු කළ හැකි ව්‍යවහාරික තොරතුරු තාක්ෂණයේ ඉහළ පෙළේ නායකයින් ඇති කිරීමට, තෝකියෝ චන්ද්‍රිකාවෙන් ලබා දෙන අධ්‍යාපනය බෙහෙවින් දායක වේ.





### පරිගණක භාවිත පද්ධතිය

දැනට භාවිතයේ නොමැති ප්‍රායෝගික විද්‍යාගාර වලින් ප්‍රයෝජන ගැනීමෙන් සිසුන්ට පන්ති කාලයෙන් පිටත පවා පරිගණක සම්පත් භාවිතා කළ හැකිය. වෙන් කරවා ගැනීම් හෝ අමතර ගාස්තු අවශ්‍ය නොවේ. මෙම අති නවීන උපකරණ ඔබට භාවිතා කළ හැකිය.

### මයික්‍රොසොෆ්ට්
අධ්‍යාපන ආයතන සඳහා Office 365 ProPlus බලපත්‍ර වැඩසටහන
අධ්‍යාපන ආයතන සඳහා OVS-ES බලපත්‍ර වැඩසටහන

අධ්‍යාපන ආයතන සඳහා වන Office 365 ProPlus බලපත්‍ර සහ OVS-ES බලපත්‍ර වැඩසටහන යටතේ KCG හට මයික්‍රොසොෆ්ට් සමගම විසින් බලපත්‍ර ලබා දී ඇත. මෙම බලපත්‍ර වැඩසටහන් මඟින් Office යෙදුම් (applications), විවිධ සංවර්ධන මෙවලම් සහ Windows මෙහෙයුම් පද්ධති පෞද්ගලික උපාංගවල භාවිතය සඳහා සාධාරණ මිලකට ලබා ගත හැකිය. (ශිෂ්‍ය භාවිතය සඳහා එකඟතා ගිවිසුමක් ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.)

### මිලදී ගැනීමට ඇති මෘදුකාංග

- මයික්‍රොසොෆ්ට් Office 365 ProPlus
- මයික්‍රොසොෆ්ට් Office Professional
- මයික්‍රොසොෆ්ට් Windows මෙහෙයුම් පද්ධති (OS) සඳහා අප්ඩේට්

සටහන: Windows මෙහෙයුම් පද්ධති සඳහා ලබාගත හැක්කේ අප්ඩේට් පමණි.







**පීය සම්මුඛ පරීක්ෂණ**

# ජපන් සජීවීකරණය සම්බන්ධ ව්‍යාපාරයන් ගවේෂණය

**ප්‍රධාන විධායක නිලධාරී, සීමාසහිත ගයිනැක්ස් කියෝතෝ සමාගම ජපානයේ විද්‍යා ප්‍රබන්ධ සහ ෆැන්ටසි ලේඛකයින්ගේ (SFWJ) සහ ජපානයේ අභ්‍යවකාශ කතුවරුන්ගේ සමාජයේ (SACJ) සාමාජික ගයිනැක්ස් හි ආදිකතෘ සාමාජික. නාඩියා, ද සීක්‍රට් ඔෆ් බ්ලූ වෝටර් සහ ටෙන්ගන් ටෝප්පා ගුරෙන් ලාගන් ඇතුළු ජපානයේ බොහෝ ප්‍රසිද්ධ සජීවිකරණ කෘතිවල නිෂ්පාදකයා**

මහාචාර්ය 武田 康廣

# යෂුහිරෝ ටැකීඩා
# Yasuhiro Takeda













KCG සමූහයේ 50 වන සංවත්සර වෙළඳ දැන්වීම (URL ලිපිනය: kcg.ac.jp/gainax)

## ජපන් සජීවීකරණ සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණය

තොරතුරු තාක්ෂණ මංගා කාටූන් සහ ඇනිමේ සංකේන්ද්‍රණ ක්ෂේත්‍රය තුළ, නව වෙළඳපල සහ ව්‍යාපාර ආකෘති නිර්මාණය කිරීමේ කටයුතු වලදී KCGI මෙම සංයෝජන භාවිතා කරයි. සජීවිකරණ සැලසුම්කරණය, නිෂ්පාදනය සහ ප්‍රවර්ධනය පිළිබඳ විශේෂ මාතෘකා මහාචාර්ය යසුහිරෝ ටකෙඩා විසින් උගන්වනු ලැබේ. මහාචාර්ය ටකෙඩා යනු නාඩියා, ද සීක්‍රට් ඔෆ් බ්ලූ වෝටර් සහ ටෙන්ගන් ටෝප්පා ගුරෙන් ලාගන් වැනි කෘති සඳහා කීර්තියක් උසුලන චිත්‍රාගාරයක් වන ගයිනැක්ස් හි සමාරම්භකයෙකි. ගයිනැක්ස් හි සජීවීකරණ නිෂ්පාදකයෙකු ලෙස මහාචාර්ය ටකෙඩා නියොන් ජෙනිසිස් එවැන්ජලියන්: අයන් මේඩන් වැනි ක්‍රීඩා සහ ඒම් ෆෝ ද ටොප් 2! ඩයිබස්ටර්, මැජිකල් ෂොපින් ආකේඩ් ඇබෙනොබෂි සහ හනමාරු කින්ඩගාටන් වැනි මංගා කාටූන් ඇතුළු බොහෝ සජීවීකරණ කෘතිවලට සම්බන්ධ වී ඇත. ගයිනැක්ස් සමඟ සහයෝගීත්වයෙන්, මහාචාර්ය ටකෙඩා විසින් KCG සමූහයේ 50 වන සංවත්සරය සමරමින් වෙළඳ දැන්වීමක් නිෂ්පාදනය කරන ලදී.

## ව්‍යාපාරක් යනු “ආදායම කොපමණ ද?” යන්න පිළිබඳ ප්‍රශ්නයකි

— සජීවිකරණය ව්‍යාපාරයක් කිරීමේදී ඔබට කිව හැකි මූලිකපදය කුමක්ද?

මේ දක්වා මාගේ ප්‍රධාන කාර්යය වී ඇත්තේ ගයිනැක්ස් හි සජීවිකරණ කෘති සැලසුම් කිරීම සහ නිෂ්පාදනය කිරීමයි. විකාශන වාර නිර්ණය කිරීමට සහ නිශ්චිත අයවැයක් සහතික කිරීම සඳහා මම සජීවිකරණ යෝජනා නිර්මාණය කර සමාගම් සමඟ සාකච්ඡා පවත්වමි. නිෂ්පාදනයක් සිදු කළ පසු, එය කොතරම් ආදායමක් උපයාවිදැයි සිතීම වැදගත්. මම හිතන්නේ ඔයාට ඒක ව්‍යාපාරයක් කියලා කියන්න පුළුවන් කියලා.

— සජීවිකරණය හා සම්බන්ධ වීමෙන් ඔබට ලැබුණු දේ අපට කියන්න.

මා සැලසුම් කර ඇති කෘති අතර විෂ් අපොන් ද ප්ලියේඩිස් සහ ටෙන්ගන් ටෝප්පා ගුරෙන් ලාගන් ඇතුළත් වේ. මා දැන් නව සජීවිකරණ සැලසුම් ගණනාවක නිරත වෙමින් සිටිමි. නමුත් මම මේ ආකාරයේ රැකියාවක් කිරීමට සැලසුම් කළේ නැහැ. පාසලේදී මම සම්පූර්ණයෙන්ම වෙනස් දෙයක් ඉගෙනගත්තේ. මම ඒක දැනගන්න කලින්, පාසැලේදී කරන ලද සිද්ධීන් සහ ස්වාධීන නිපැයුම් මගේ රැකියාව බවට පත් වුණා. ඒ නිසා මම තවමත් රසවත් දේවල් කරනවා වගේ දැනෙනවා. “විනෝදජනක හා රසවත් දේවලින් මූලික පියවර ගන්න” යන මගේ ආධුනික වසර වලින් ගත් අදහස කවදාවත් අමතක නොකරන්න මම තීරණය කළා.

— කරුණාකර සජීවිකරණය ඉගෙන ගන්න කැමති සිසුන් සඳහා අපට පණිවිඩයක් දෙන්න.

සැළසුම් කිරීම සහ නිෂ්පාදනය කිරීම සඳහා විශාල ශක්තියක් අවශ්‍යයි. මීට අමතරව අරමුදල් එක්රැස් කිරීම හා සජීවිකරණ නිෂ්පාදනය කිරීම වගකීම් සහගතයි. ඔබේ සේවය දෙස බලා සිටින්නන්, විවේචන, අරමුදල් එක්රැස් කිරීම සහ ඔබේ සමාගමේ නම කැතවීම නිෂ්පාදන කාර්යට ඇතුළත් වේ. එතරම් දුර සිතීම සැලසුම්කරණයේ අවසානයයි. ඔබ නිෂ්පාදනයක් නිෂ්පාදනය කරන තාක් දුරට ඔබ විශ්වාස කරන්නේ ස්වයං තෘප්තිය පමණි. නිෂ්පාදනයක් සම්පූර්ණ වන්නේ එය විවේචනය කළ විට පමණි. විවේචනය ඔබේ නිෂ්පාදනයෙන් පමණක් නොව, ඔබ ඔබේ ක්‍රියාවන් හා වචන ඇතුළු ඔබ ලෝකයට මුදා හරින සෑම දෙයක්ම ඉලක්ක කළ හැකිය. සජීවිකරණය ඉගෙනීම පිළිබද උනන්දුවක් දක්වන ශිෂ්‍යයන්ගෙන් මන් ඉල්ලා සිටින්නේ ලබන විවේචන වලට මුහුණ දීමට අවශ්‍ය ආත්ම ශක්තිය සමග අධ්‍යනය කිරිම සිදුකරන්න යන්නයි.







**පීය සම්මුඛ පරීක්ෂණ**

නියෝජිත අධ්‍යක්ෂ.
ක්‍රිප්ටන් ෆියුච මීඩියා,
හට්සුනි මිකි නිෂ්පාදක

මහාචාර්ය

# හිරෝ්යුකි අයිතෝ

## Hiroyuki Itoh 伊藤 博之



"මිරායි කරා කිටා හජිමෙට් නො ඔටෝ" ("අනාගතයෙන් පළමු හඬ") යන ජපන් වාක්‍යයෙන් උද්ගතවන නමක් ඇති, හට්සුනි මිකි යනු තාත්වික ප්‍රතිමාවක් වන අතර පරිශීලකයෙක් භාවගීතය සහ ස්වර රචනයක් පරිගණකයට ඇතුළත් කළ විට ඔහු කෘතිම හඬකින් සින්දුව ගායනා කරයි. හට්සුනි මිකි ජපානයේ පමණක් නොව විදේශයන්හි පවා සජීව ප්‍රසංග පවත්වා ඇති අතර රසිකයින් සමූහයක හදවත තුළ රැදේ. මෙම සංවේදනයේ හේතුව වන හට්සුනි මිකි කෘතිම හඬ නිර්මාණය කළ සමාගම වන, ක්‍රිප්ටන් ෆියුච මීඩියා හි නියෝජිත අධ්‍යක්ෂ හිරෝ්යුකි අයිටෝ මහාචාර්යවරයෙක් ලෙස KCGI හා එකතු වී ඇත. පරිගණකගත හඬවල් නිෂ්පාදනය කරන මෘදුකාංග අඛණ්ඩව සංවර්ධනය කරන මහාචාර්ය අයිටෝ අනාගතයේ තොරතුරු තාක්ෂණ කර්මාන්තය මෙහෙයවන තරුණ පරපුරට පහත සඳහන් පණිවිඩය ලබා දේ. "අපි අතරමඟ පමණක් සිටින තොරතුරු විප්ලවයේ දේශ සීමාව සීමාවක් නොමැතිව විශාල වන අතර ඔබගේ අනාගත දෘෂ්ටි කෝණ සීමාවක් නොමැතිව ඔබට පෙර විසිරී යයි. මෙම සංකල්පය දැඩිව මනසේ තබාගෙන ඔබගේ අධ්‍යයන සඳහා කැපවන මෙන් මම ඉල්ලා සිටිමි."

### හඬ සංස්ලේෂණයේ විප්ලවයක් ඇතිකළ, ද වර්ල්ඩ් ඔෆ් හට්සුනේ මිකු

ක්‍රිප්ටන් ෆියුච මීඩියා යනු වීඩියෝ ක්‍රීඩා හෝ සක්‍රීයකරණ සමාගමක් නොවේ. අපි සංගීතය සකස් කිරීමට මැදිහත්වුවත්, එය පටිගත සමාගමක්ද නොවේ. එයට හේතුව අපි ව්‍යාපාරයක් තුළට පරිගණක සංගීත විනෝදාංශයක් සකස් කිරීමයි. මම අප ගැන හිතන්නේ අපි "ශබ්දය අලෙවිකරන්නෙක්" ලෙසයි. හට්සුනි මිකි 2007 අගෝස්තුවල අලෙවිය සඳහා පළමුවෙන් පිරිනමන ලද නමුත් නිර්මාණාත්මක කාර්යයක ජනතාව සම්බන්ධ කිරීම සඳහා මෙම මෘදුකාංගය අවස්ථාවක් බවට පත් වූ බව මම විශ්වාස කරමි.

මනුෂ්‍යත්වය එහි අතීතය තුළ පරිවර්තන තුනකට මුහුණ දී ඇතිබව කියනු ලැබේ. පළමුවැන්න වූයේ කෘෂිකාර්මික විප්ලවයයි. මෙම විප්ලවය හේතු කොට ගෙන, දඩයම්කිරීම මත ඔවුන්ගේ විශ්වාසය නිසා ඔබමොබ යාමට බලකරන ලද මනුෂ්‍ය වර්ගයා ක්‍රමානුකූලව ආහාර නිෂ්පාදනය කළ අතර, ඒවා ගබඩා කිරීම කරා පැමිණියේය. මෙසේ ස්ථිර වාසස්ථානවල ජීවත්වීම ආරම්භ විය. මේ නිසා, සමාජ සහ රාජ්‍ය සකස් විය. එමෙන්ම ධනයේ විෂමතාවන් නිර්මාණය විය. ආර්ථිකයන්ගේ සංවර්ධනය යුද්ධයට හේතුවක් බවට පත් වූ බව කියනු ලැබේ.

දෙවන විප්ලවය වූයේ කාර්මික විප්ලවයයි. ක්‍රියාවෙහි යොදන බලය සොයා ගනු ලැබූ අතර එක සමාන අයිතම කාර්යක්ෂමව නිර්මාණය කිරීමට හැකිවීම වැනි නව්‍යකරණයන්ගේ වර්ධනය බහු නිෂ්පාදනයට සහ බහු පරිභෝජනයට උපත ලබාදුන්හ මෙය විශාල පරිමාණයේ ධනය ඇතිකිරීමට සහය වෙමින් වෙළෙඳාම සහ වාණිජය ඉක්මණින් ඉදිරියට ගෙන යන ලදී. මෙම විප්ලවය "ජනගහන ප්‍රසාරණය." ට හේතුවක් විය. කාර්මික විප්ලවයට පෙර ඉහළ උපත් සහ ඉහළ මරණ අනුපාතයක් සහිත යුගය තුළ, මනුෂ්‍ය ජනගහනය සැබැවින්ම ස්ථිරව තිබුනු අතර, සමාජය තුල ධනයේ උච්ඡාවචන යම් තරමකට තිබූ නමුත් කාර්මික විප්ලවය සමඟ මනුෂ්‍ය ජනගහනය වේගයෙන් වැඩිවිය.

තෙවන විප්ලවය වන්නේ අන්තර්ජාලය විසින් නියෝජනය කරන තොරතුරු තාක්ෂණයේ වටිනාකම විසින් ඇතිකළ තොරතුරු විප්ලවයයි. අන්තර්ජාලයට පෙර, තොරතුරු සම්ප්‍රේෂකයින් සීමා වූ අතර, එය ඒකාකාධිකාරි විය. තොරතුරු මූලාශ්‍රයන්ට පුවත්පත් සමාගම්, රූපවාහිණී සහ ගුවන්විදුලි මධ්‍යස්ථාන සහ ප්‍රකාශන සමාගම් වැනි මාධ්‍ය ආයතන ඇතුළත් නමුත් මෙම කණ්ඩායම් තොරතුරු බෙදා හැරීමේදී, පහසුකම් සහ මනුෂ්‍ය බලය අනුව සැලකියයුතු පිරිවැයක් ඒ සමග පවතී. තවද, මෙම කාලයේදී තොරතුරු ප්‍රමාණයෙන් අඩුවන අතර ඒකදිශාගත වේ. එසේවුවත්, අන්තර්ජාලයේ පැමිණීම තොරතුරුවල මෙම විප්ලවය ඇති කරන ලදී. තොරතුරු බෙදා හරින ආකාරය සැලකිය යුතු ලෙසින් වෙනස් කර ඇත.

දැන් අන්තර්ජාලය අතිශයින්ම සමීපව පවතී, අපේ අත්වල අල්ල මත, අපේ මේසවල, සහ අපෙ සාක්කුවලට රිංගා ඇත. ප්‍රවෘත්ති, චිත්‍රපටි සහ සංගීතය ලෙස ඩිජිටල්කරණය කළ හැකි තොරතුරු, සම්පූර්ණයෙන්ම තොරතුරු, පහසුවෙන් අන්තර්ජාලය හරහා සම්ප්රේෂණය කර ගබඩා කර තැබිය හැකිය. ජීවිතය සහ රැකියාව අතිශයින්ම පහසු, විනෝදජනක සහ සුවපහසු බවට පත් වී තිබේ; ක්ෂණිකව ඔබට ඔබේ ප්රියතම වීඩියෝ සහ විකාශන මාධ්‍යයන් කැඳවීමට සහ බැලීමට හැකිය. මීට අමතරව, මෙම තොරතුරු මඟින් ඕනෑම කෙනෙකුට පහසුවෙන්ම සහ ක්ෂණිකව ෆේස්බුක්, ට්විටර් සහ බ්ලොග් ඔස්සේ පුද්ගලික පුවත්වල ඉතා කුඩා දෙවල් ඇතුළුව ඔවුන් ගැන තොරතුරු පහසුවෙන්ම සහ ක්ෂණිකව බෙදා ගැනීමට හැකි වේ.

එසේවුවත් තොරතුරු විප්ලවය හේතු කොට ගෙන සිදුවන වෙනස්වීම්වලට පූර්විකාව අපි තවමත් අත්විඳිමින් සිටින බව මම විශ්වාස කරමි. කෘෂිකාර්මික සහ කාර්මික විප්ලව මනුෂ්‍ය වර්ගයා ජීවත් වූ ආකාරය බරපතල ලෙස වෙනස් කරන ලදී. තොරතුරු විප්ලවයෙන් ඇතිකළ වෙනස්වීම මෙතෙක් ඒ මට්ටමට පැමිණ නැත. මෙය හුදෙක් පරිවර්තනීය කාලපරිච්ඡේදයක් වන අතර සැබෑ වෙනස්වීම් ආරම්භ වීමට නියමිතය. මෙතැන් සිට වසර 20 සිට 30ක් තුල ජනතාවගේ ජීවන රටාවට සහ ලෝකය තුළ විශාල වෙනස්වීම් අපිට දැකිය හැතිවනු ඇතැයි මම විශ්වාස කරමි. එසේවුවත්, මම මෙවැනි වෙනස්වීම් කෙසේවේද? මේවා වෙනස්වන්නේ කෙසේද සහ එය අපට සහ ඉදිරි පරම්පරාව භාරගන්නා තරුණ පරපුරට එය බලපාන ආකාරය. මම නොදනිමි.



හට්සුනි මිකි
රූප සටහන KEI විසින්
©Crypton Future Media, INC.

පීය සම්මුඛ පරීක්ෂණ

## අති නවීන වේදිකා සංදර්ශන නිර්මාණය කිරීම සඳහා තොරතුරු තාක්ෂණය භාවිතා කිරීම

මහාචාර්ය ニッツァ・メラス

# නිට්සා මෙලස්

## Nitza Melas



Cirque du Soleil Main හඬ ශිල්පී,
ගායක / ගීත රචක

**ඇය කැනඩාවේ මොන්ට්‍රියල් හි උපත ලද, ලොව පුරා සිටින ජනයා අමන්දානන්දයට පත්කළ බහුභාෂා ගායිකාවක් / ගීත රචිකාවකි. සර්කසයක් සහ සංගීතයක් ලෙස ලොව පුරා අඛණ්ඩව රඟදක්වන විනෝදාස්වාද කණ්ඩායමක් වන Cirque du Soleil හි ප්‍රධාන හඬ ශිල්පීන් තිදෙනාගෙන් එක් අයෙකු වන්නේ ඇයයි. තමා විසින්ම රචනා කළ ගීතයක් Cirque du Soleil ප්‍රසංගයෙහි ඉදිරිපත් කිරීමට හැකිවූ එකම ගායිකාව බවට ඇය පත්වූයේ, ඇය සැබවින්ම කණ්ඩායමේ ප්‍රධාන ගායිකාව බවට පත් කරමිනි. ඇය කිසිදු සලකුණකට අයත් නොවන අතර, ඇයගේම සංගීතය රචනා කිරීම හා සැකසීම පමණක් නොව, ග්‍රැෆික් නිර්මාණය, ප්‍රවර්ධනය සහ විකුණුම් ආදිය ද ඇය විසින්ම සිදු කරයි.**

### නව විනෝදාස්වාද ලෝකයක්

කලා ලෝකය හා තොරතුරු තාක්ෂණ ලෝකය සමීපව එකිනෙකට බැඳී පවතී. නිර්මාණාත්මක දැක්ම සහ අරුම පුදුම තාක්‍ෂණය එකිණෙක මුණගැසුණු විට, එමඟින් ප්‍රේක්ෂකයා වෙනත් මානයකට ගෙන යයි. එබැවින් නවීන තාක්‍ෂණයේ පෙරමුණ ගත් අධ්‍යාපන ආයතනයක් පමණක් නොව, විස්මිත වේගයෙන් විකසනය වන නිර්මාණශීලීත්වයකින් යුත් පුළුල් පරිගණක ක්ෂේත්‍රයක දැනුම ලබාගත හැකි පරිසරයක් නිර්මාණය කර දෙන ආයතනයක් සමඟ සම්බන්ධව සිටීම සාමාන්‍ය දෙයකි.
විනෝදාස්වාද කර්මාන්තය තුළ තොරතුරු තාක්ෂණය අප ව්‍යාපාරයේ සෑම අංශයකටම කිඳාබැස තිබේ. සංගීතය, චිත්‍රපට හඬකැවීම සහ වෙළඳ දැන්වීම් පටිගත කිරීම සහ සංස්කරණය කිරීම සඳහා පරිගණක භාවිතා කිරීම හෝ Cirque du Soleil හි විවිධාකාර පුහුණු සහ බහුමාධ්‍යයන් වේවා, මා සිදු කරන සෑම ඉදිරිපත් කිරීමක් සඳහාම, කලාකරුවන් හා තාක්‍ෂණ ශිල්පීන්ගෙන් යුත් කණ්ඩායමෙහි උසස් ගණයේ විශේෂඥ තාක්‍ෂණය සහ නිර්මාණශීලීත්වය අවශ්‍ය වේ.
වීඩියෝ සහ ශ්‍රව්‍ය ප්‍රසංග නිර්මාණය සඳහා අවශ්‍ය වන සහසම්බන්ධී අංගය වන්නේ කලාව සහ තාක්‍ෂණය අතර පවතින මෙම සහයෝගිතාවයයි. ව්‍යාපාරික ලෝකයේ බොහෝ අංශවලදී උපයෝගී කරගැනීම සඳහා අවශ්‍ය වන කලාත්මක හා තාක්‍ෂණික දැනුම ඔපමට්ටම් කරගැනීමට අවශ්‍ය මෙවලම් ලබා ගැනීමට KCGI සිසුන්ට අවස්ථාව ලබා දෙයි. ප්‍රක්ෂේපණ සිතියම්කරණය, එනම් කලා ප්‍රකාශන පරිණාමයේ පරම තක්ෂණය, කලාව හා සම්බන්ධ තොරතුරු සැකසුම් තාක්‍ෂණ ශිල්පීන් සඳහා වන තනතුරු සඳහා ඉල්ලුමක් නිර්මාණය කර ඇති අතරම, ප්‍රේක්ෂකයින්ගේ අපේක්ෂාවන් ඉක්මවා යන නිර්මාණාත්මක ප්‍රකාශනයක් සඳහා ඉඩහසර විවර කර ඇත. KCGI මෙම ක්‍ෂේත්‍රය සම්බන්ධ ඉගෙනීමේ ප්‍රමුඛයෙකු වන අතර, සිසුන්ට තම හැකියාවන් ඉක්මවා යාමට ප්‍රේරණය කරන අධ්‍යාපනික වටපිටාවක් ලබා දේ.





KCG සමූහය ආරම්භ වී 50 වන සංවත්සරය වෙනුවෙන් 'MUΣA' සංයුක්ත තැටිය ප්‍රකාශයට පත් කිරීමේ ප්‍රසංගයේ දී මහාචාර්ය නිට්සා මේලාස්.



පීය සම්මුඛ පරීක්ෂණ

## අනාගත ඊ-ව්‍යාපාරික නායකයින් පුහුණු කිරීම

මහාචාර්ය 高 弘昇

# කෝ, හොං සංග්

## Ko, Hong Seung



සීමාසහිත සැම්සුන් ඉලෙක්ට්‍රොනික්ස් සමාගම, තොරතුරු උපායමාර්ග (CIO) පිළිබඳ හිටපු කළමනාකරු, උපායමාර්ග සැලසුම් කාර්යාලය.

නිපොන් ව්‍යවහාරික තොරතුරු සංගමයේ (NAIS) නියෝජිත අධ්‍යක්ෂ

**මහාචාර්ය හොං සංග් කෝ දකුණු කොරියාවේ උපත ලැබූ අතර, දැවැන්ත දකුණු කොරියානු විදුලි උපකරණ සහ ඉලෙක්ට්‍රොනික උපාංග නිෂ්පාදකයෙකු වන සැම්සුන් ඉලෙක්ට්‍රොනික්ස් හි හිටපු තොරතුරු උපායමාර්ග කළමනාකරු වශයෙන් කටයුතු කළ අතර අන්තර්ජාල-මූලික ආයතනික මූලෝපාය වන CALS (මූලික වශයෙන් B2B සංකල්පිකව පදනම් වූ), සහ සාමාන්‍ය පාරිභෝගිකයින් සඳහා ඊ-වාණිජ්‍යය හඳුන්වා දීමට කටයුතු කළේය. එමෙන්ම ඔහු එම සමාගමේ තොරතුරුකරණය හා ලාභදායිතාවය වෙනුවෙන් විශාල දායකත්වයක්ද ලබා දුන්නේය. ඊ-ව්‍යාපාරික ලෝකය තුළ සිදුවන ශීඝ්‍ර දියුණුවත් සමඟ ඒ සඳහා අවශ්‍ය වන මානව කුසලතාවන් පිළිබඳව මහාචාර්ය හොං දීර්ඝ වශයෙන් කථා කළේය.**

### ඊ-ව්‍යාපාර සඳහා උපාය මාර්ගයක් අවශ්‍ය වේ

—ඊ-ව්‍යාපාර ලෝකය ශීඝ්‍රයෙන් වෙනස් වෙමින් පවතින බව පෙනෙන්නට තිබේ. අන්තර්ජාලයේ එම පුළුල් ව්‍යාප්තියත් සමඟ ව්‍යාපාරත් වෙනස් වී තිබේද?

90 දශකයේ මැද භාගයේදී මා තොරතුරු උපායමාර්ග පිළිබඳ කළමනාකරු වශයෙන් පත්වූ පසුව, සැම්සුන් සමාගම විසින් දේශීයව සහ ජාත්‍යන්තර ගනුදෙනුකරුවන් සඳහා තම වෙබ් අඩවිය එළිදක්වන ලදී. එකල කිසිවෙකු විසින් අන්තර්ජාලය අලෙවිකරණය සඳහා ප්‍රබල මෙවලමක් ලෙස නොසැලකූ අතර, එම ක්‍රියාව පෙනී ගියේ හුදෙක්ම සමාගමෙහි සන්නාම පිළිගැනීම වැඩි දියුණු කිරීමේ ක්‍රමයක් ලෙස පමණි. කෙසේ වෙතත්, අපි වෙබ් අඩවිය විවෘත කළ විට, ලොවපුරා පාරිභෝගිකයින්ගෙන් නිෂ්පාදන පසු රැකවරණ සේවා, පැමිණිලි ආදිය පිළිබඳව විමසීමට දිනකට විද්‍යුත් තැපැල් 200 ක් පමණ අප වෙත ලැබුණි. අපගේ වෙබ් අඩවිය අලෙවිකරණ මෙවලමක් ලෙස භාවිතා කළ හැකිය යන හැඟීම මා තුළ ඇති වූයේ ඒ අවස්ථාවේදී ය.
ඉන් පසුව ඇණවුම් කිරීමේ පද්ධති සහ මූල්‍ය කොටස් වෙළඳාම වැනි අන්තර්ජාලය භාවිතා කළ ව්‍යාපාර වර්ධනය වීම සිදුවිය. එහෙත්, අන්තර්ජාලය තුළ භාවිතය සඳහා පද්ධතියක් නිර්මාණය කර එළිදැක්වීම මගින් විකුණුම්වල විශාල පරිමාණයේ වර්ධනයක් දැකගැනීමට අපට නොහැකි විය. දකුණු කොරියාවේ තොරතුරු තාක්‍ෂණය තුල අසාර්ථක ඉහළ නැඟීමක් සිදුවූ අතර, එයට හේතුව වූයේ හුදෙක්ම අන්තර්ජාලය භාවිතය හරහා ඔවුන්ගේ ව්‍යාපාර ඉහළ මට්ටමකට පත්වනු ඇතැයි ඔවුන් සිතූ බැවිණි. ඔවුන් සිතුවේ ඔවුන් අන්තර්ජාලය මත පදනම් සාප්පු සංකීර්ණයක් සාදා, විකිණීම සඳහා නිෂ්පාදන ඉදිරිපත් කර ලොව පුරා සිටින ගනුදෙනුකරුවන් සම්බන්ධ කරගතහොත් වාණිජ කටයුතු සාර්ථකව සිදු කරගත හැකි වනු ඇති බවයි. නමුත් වසර කිහිපයක් තුළ එම අන්තර්ජාල සාප්පු සංකීර්ණ සියල්ලම පාහේ අතුරුදහන් විය.
අවසානයේදී, ඔවුන් නොදැන සිටි දෙය නම් අන්තර්ජාලය හුදෙක්ම එක් මෙවලමක් පමණක් බවයි. තවද, ඔවුන් බොහෝ විට උපාය මාර්ගයක් නොතිබුණි. ඔබ අන්තර්ජාලයේ කොපමණ නිෂ්පාදන ප්‍රදර්ශනය කර තිබුණද, ඒවා හුදෙක් තිරයක් මත පෙන්වන නිෂ්පාදන පමණක්ම විය. එයට හේතුව වූයේ බොහෝ අවස්ථාවන්හිදී ගනුදෙනුකරුවන් තම නිෂ්පාදන මිලදී ගනු ලැබුවේ ඒවා දැතින් ස්පර්ශ කර පරීක්ෂා කර බැලීමෙන් පසුව වීමයි.

### ජපන් සමාගම් වල අසාර්ථක වීම සහ මානව කුසලතා හිඟකම

—මෙම දැවැන්ත වෙනස්කම් මධ්‍යයේ, වර්තමාන ගෝලීය ව්‍යාපාරික වටපිටාව ඔබ දකින්නේ කෙසේද?

අවාසනාවකට මෙන් අනෙකුත් අතරෙහි ජපානයේ සහ දකුණු කොරියාවේ අනෙකුත් වර්තමාන තත්ත්වය නම්, සමාගම් අලෙවිය ඉහළ නංවාගැනීම සඳහා අන්තර්ජාලය භාවිතා කිරීම පිළිබඳ උපාය මාර්ග මුදුන් පමුණුවා ගැනීමට අවශ්‍ය මානව කුසලතා හිඟයක් පවතී. එසේම, තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සැකසීම සඳහා සමාගම් විශාල ආයෝජනයක් ද සිදු කරන බැවින් මෙම තත්ත්වය ඔවුන්ට නොනවතින ගැටළු සමුදායක් ඇති කරයි.
සරලවම කිවහොත් සමාගම්වලට අවශ්‍ය වන්නේ ඊ-ව්‍යාපාර මූලෝපායන් නිර්මාණය කිරීමට උපකාරී වන මානව කුසලතා වේ. ප්‍රධාන වශයෙන්, ඔවුන් කළ යුත්තේ අලෙවිකරණය සහ කළමනාකරණය සඳහා තොරතුරු තාක්ෂණ සම්පත් ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය ශක්‍යතාව ඇතිකර ගැනීමයි.
ජපන් හා දකුණු කොරියානු සමාගම්වල සේවකයින් අතර ඇත්තේ අලෙවිකරණය පිළිබඳ දුර්වල සවිඥානකත්වයක් බවට සැලකේ. මෙයට හේතුව වැටුප පිළිබඳ ඔවුන්ගේ චින්තනයේ පදනම වන්නේ, ඔවුන්ගේ එදිනෙදා වැඩ සඳහා උපයන වැටුප හරහා ලැබාගත හැකි ලාභය සාධාරණව බෙදී යාම වීමයි.
එහෙත් එක්සත් ජනපදයේ තත්ත්වය මීට වෙනස් වේ. කොපමණ වැඩ ප්‍රමාණයක් සිදු කරනවාද යන්න සහ ඔබේ රැකියාවෙන් ඇත්තෙන්ම සමාගමට කොපමණ දායකත්වයක් ලැබේද යන්න පිළිබඳ නිරන්තර, දැඩි පීඩනයක් පවතී.
එක්සත් ජනපද සමාගම්වල අලෙවිකරණය සඳහා පමණක්ම වෙන් කරන ලද දෙපාර්තමේන්තුවක් නොමැති තරම් වේ. සියලුම සේවකයින් දැනටමත් මෙම මානසිකත්වයෙන් යුක්ත නිසා ඇති මෙම දෙපාර්තමේන්තු වල අවශ්‍යතාවයක් නොදැනේ. ආර්ථිකය කෙතරම් දුෂ්කර තත්ත්වයකට හැරුණත් ලාභදායිතාව ඉහළ නංවාගන්නේ කෙසේද යන්න ගැන සිතා බැලීමට එක්සත් ජනපදයේ සමාගම් මානසිකත්වය සැකසී ඇති බැවින් ඔවුන්ට සෑම විටම ඉදිරියට යාමට හැකියාවක් ඇත. ජපාන සහ දකුණු කොරියානු සමාගම් වලට ඔවුන් සමඟ පැහීම දුෂ්කර වන්නේ මේ නිසා ය. ජපානයේ සහ දකුණු කොරියාවේ විශාල සමාගම් ඇතුළුව අලෙවිකරණය යනු විකුණුම්කරණය, වෙළඳ ප්‍රචාරණය සහ සන්නාමකරණය ලෙස වරදවා වටහාගත් බොහෝ සමාගම් දක්නට ලැබේ. ව්‍යාපාර සඳහා අන්තර්ජාලය භාවිතයේදි තොරතුරු තාක්‍ෂණ සමාගම් ලෙස සාර්ථකත්වයට පත්වී ඇත්තේ දැනට එක්සත් ජනපද සමාගම් පමණක් වීමට හේතුව එයයි. ජපානයේ සහ දකුණු කොරියාවේ දේශීය වශයෙන් එවැනි පිළිගැනීමක් ලබා ඇති සමාගම් ඇති නමුත්, ඔවුන් සිදුකර ඇත්තේ යටිතල පහසුකම්වල දියුණුව හේතුවෙන් ඇති වූ ඊ-ව්‍යාපාර රැල්ල ඔස්සේ ගොස් සූදුවක ආකාරයේ අනුමානයකින් සාර්ථකත්වයට පත්වීමතත් වේ. ඊ-ව්‍යාපාර සම්බන්ධයෙන් සාර්ථකත්වයට පත් වූ යුරෝපීය සමාගම් ද දක්නට නොලැබේ. මෙයට හේතුව අන්තර්ජාල ව්‍යාප්තියේ ප්‍රධාන ප්‍රමාදයන් වේ.

### ආසියාව තුළ ආධිපත්‍යය දරන විශේෂිත උපාධි පාසලක් බවට පත්වීම

—මෙම ව්‍යාපාරික පරිසරය තුළ, KCGI විසින් සැකසිය යුත්තේ කුමන ආකාරයේ විශේෂාංගයන් ද; අප අරමුණු කළ යුත්තේ කුමක් සඳහා ද?

තොරතුරු තාක්ෂණය පිළිබඳ විශේෂඥ උපාධිධාරී පාසල් එතරම් ප්‍රමාණයක් නොමැත. එසේම, KCGI පැවත එන්නේ කියෝතෝ කම්පියුටර් ගකුඉන් වෙතිනි. මෙය අප සතු විශාලතම වාසියයි.
එපමණක් නොව, KCGI හි විශේෂඥ කුසලතා සහ දැනුමින් පිරිපුන් සහ ප්‍රධාන සමාගම්වල සේවය කර ඇති ගුරුවරුන් විශාල ප්‍රමාණයක් සිටී. මගේ දේශනවලදී, මම මගේ සාර්ථකත්වය ගැන පමණක් නොව, මගේ අසාර්ථකත්වයන් ගැනද කතා කිරීමට උත්සාහ කරමි. එයට හේතුව වන්නේ අසාර්ථක වීම් වලින් බොහෝ විට සාර්ථකත්වයන්ටත් වඩා බොහෝ දේ උගන්වන බැවිනි. මා මේ යුගයට සැබවින්ම අවශ්‍යව පවතින මානව කුසලතා පුහුණු කරන්නේ මේ අයුරිනි.
වෙනත් රටවලද විශ්ව විද්‍යාල සම්බන්ධ අධ්‍යාපන ජාලය වසරින් වසර පුළුල් වේ. මෙම ක්ෂේත්‍රය ජපානයට පමණක් සීමා වූවක් නොවේ. KCGI ආසියාවේ සහ ගෝලීය මට්ටමේ වැඩ කිරීමේ හැකියාව ඇති මානව කුසලතා පුහුණු කිරීමට දායක විය හැකි විශේෂිත උපාධි පාසලක් වනු දැකීමට මා කැමතිය.

# කියෝතෝ, ශිෂ්‍යයන් සඳහා වූ නගරය

කියොතෝවට වසර 1200 කට වැඩි ඉතිහාසයක් තිබේ. එය එක් වරක ජපානයේ අගනුවරවූ අතර තවමත් ජපානයේ සංස්කෘතික හදබිමයි. එය ජාත්‍යන්තර නගරයක් වන අතර බොහෝ තරුණ සිසුන් නගරයේ ජීවත් වේ. KCG විශ්ව විද්‍යාල පහසු ප්‍රදේශ වල පිහිටා ඇති අතර, කියෝතෝ නගරයේ සෑම ප්‍රදේශයකින්ම ඔබට ඒවාට ප්‍රවේශ විය හැක. ඊට අමතරව, ඔසාකා, නාරා, කෝබේ සහ ඔට්සු වැනි කන්සායි ප්‍රදේශයේ අනෙකුත් ස්ථාන වල සිට පහසුවෙන් ළඟා විය හැකිය.



## කියෝතෝ ප්‍රධාන පාසලේ KCGI හයකුමන්බෙන් සරසවිය අවට ප්‍රදේශය

මෙම ප්‍රදේශයේ මුරොමචි සංස්කෘතිය නියෝජනය වන ගින්කකුජි විහාරය, ජිදයි මත්සුරි සමග සම්බන්ධ (කියෝතෝහි විශාලතම උත්සවය අතරින් එකක්)හෙයිඅන් ජින්ගු සිද්ධස්ථානය, සකුරා මල් පිපෙන ගස් සඳහා ප්‍රසිද්ධ ටෙත්සු ගකුනෝ මිචි, ජපානයේ දෙවැනි පැරණිතම සත්වෝද්‍යානය වන කියොතෝ සිටි සත්වෝද්‍යානය, සහ කියෝතෝ සිටි කෞතුකාගාරය (තවත් බොහෝ ස්ථාන අතර). මෙම ජපන් සංස්කෘතිය හා ඉතිහාසය සමඟ සම්බන්ධ වීම පහසුය!

ස්ථානය

- ජින්කාකුජි
- ටෙට්සුගාකු-නො-මිචි (දාර්ශනිකයින්ගේ පාගමන)
- නන්සෙන්ජි පන්සල
- කියෝතෝ නගරයේ කියොසෙරා කලා කෞතුකාගාරය
- කියෝතෝ නගරය සත්තුවත්ත
- හෙයියන් ජින්ගු විහාරය
- ඊකන්ඩු සෙන්රින්-ජි
- චියොන්ජි පන්සල
- නූතන කලාව පිළිබඳ ජාතික කෞතුකාගාරය



## KCGI අවට ප්‍රදේශය කියොතෝ එකිමාඊ චන්ද්‍රිකා සරසවිය

ජපානය පුරා සංචාරය කිරීම ගොඩක් මිනිස්සුට ජේ.ආර්. කින්තෙත්සු සහ නාගරික උමං රේඛා ධාවනය වන කියොතෝ දුම්රිය ස්ථානය කියොතෝ වෙත දොරටුවකි. නවීන ගොඩනැඟිලි සහ ඓතිහාසික ගොඩනැගිලි යන දෙකම මෙම ප්‍රදේශය තුළ පවතින අතර, අපට වෙනස් වාතාවරනයක් දැනේ.

ස්ථානය

- ටොජී
- නිෂි හොන්ග්වන්ජි විහාරය
- හිගාෂි හොන්ගාන්ජි පන්සල
- ටොකෙජී පන්සල
- කියෝතෝ කුළුණ
- සන්ජුසන්ජෙන්ඩු
- කියෝතෝ ජාතික කෞතුකාගාරය
- කියෝතෝ දුම්රියපොළ ගොඩනැගිල්ල
- කියෝතෝ මින්මැදුර





## KCG අවට ප්‍රදේශය රකුහොකු සරසවිය

කිතාඔජි උමං දුම්රිය ස්ථානයෙන් හා රකුහොකු සරසවිය අසල බස්රථ පර්යන්තයේ සිට කියෝතෝ නගරය සහ කියොතෝ දුම්රිය ස්ථානයේ සිට උමං මාර්ගයෙන් සහ නගර බසයෙන් රකුහොකු ප්‍රදේශයට යන්න පහසුය. නවීන ගොඩනැඟිලි වලින් පෙළගැසුණු කිතයමා වීදියට කමිගමෝ සිද්ධස්ථානය ආසන්න වන අතර උද්භිද උද්‍යානය, මිදොරොග-ඉකෙ විල සහ කමෝ ගඟෙහි අපට විනෝද විය හැක.

ස්ථානය

- කමිමමෝ සිද්ධස්ථානය
- මිදොරොගා-ඉකි විල (එමෙන්ම මිසෝරොගා-ඉකි විල ලෙසද හඳුන්වයි)
- කියොතෝ උද්භිද උද්‍යානය
- කිතායාමා වීදිය

## KCG අවට ප්‍රදේශය කමොගවා සරසවිය

කියෝතෝහි විශාලතම උත්සව තුනෙන් එකක් වන අඔයි උත්සවය සමග සම්බන්ධ ෂිමගොමෝ සිද්ධස්ථානය, සහ කියෝතෝහි රජ මාලිගය සරසවිය අසල පිහිටා ඇත. මෙය ස්වභාව ධර්මයෙන් පොහොසත් ප්‍රදේශයකි.

ස්ථානය

- ෂිමොගාමො විහාරය
- කියෝතෝ හි අධිරාජ්‍ය මාලිගය
- ටඩාසු නො මොරි (විහාර වනය)
- කියෝතෝ නගරයේ ඓතිහාසික කෞතුකාගාරය





# kcg.edu අධ්‍යාපන ජාලය

කියෝතෝ තොරතුරු විද්‍යා උපාධි අධ්‍යයන විද්‍යාලය අනෙකුත් KCG සමූහ අධ්‍යාපන ආයතන සමග සමීප ජාලයක් නිර්මාණය කරමින් රාජ්‍ය හා විදේශීය විශ්ව විද්‍යාල සමඟ සහයෝගයෙන් කටයුතු කරමින්, ගෝලීය අධ්‍යාපන ආයතනයක් මෙන්ම තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය පිළිබඳ ප්‍රමුඛයා ලෙසද ලෝක මට්ටමේ ඉහල මට්ටමේ තොරතුරු තාක්ෂණ අධ්‍යන සාක්ෂාත් කර ගැනීම අරමුණු කරයි.



රොචෙස්ටර් තාක්ෂණික ආයතනය යනු 1829 දී ආරම්භ කරන ලද ඉංජිනේරු විශ්ව විද්‍යාලයක් වන අතර තොරතුරු තාක්ෂණ පාඨමාලා පිහිටුවීමට (1991) එක්සත් ජනපදයේ පළමු විශ්ව විද්‍යාල වලින් එකක් ලෙස ප්‍රසිද්ධය. පරිගණක චිත්‍රක, ක්‍රීඩා සහ තොරතුරු තාක්ෂණ යන ක්ෂේත්‍රවල එක්සත් ජනපදය තුළ ඉහළම ප්‍රතිඵල පෙන්වීම පිළිබඳ අපි සාඩම්බර වන්නෙමු. රොචෙස්ටර් තාක්ෂණික ආයතනය 1996 දී කියෝතෝ කොම්පියුටර් ගැකුයින් සමග සහෝදර පාසල් ගිවිසුමකට එළඹී ඇත.

1963 ජපානයේ ප්‍රථම පරිගණක අධ්‍යාපන ආයතනය ලෙස ආරම්භ කරන ලදුව වසර 55කට අධික සම්ප්‍රදායන් හා ජයග්‍රහණ අගයමින්, කියෝතෝ කොම්පියුටර් ගකුඉන් මඟින් 50,000 ක පමණ උපාධිධාරීන් පිරිසක් සහිත ජපානයේ තොරතුරු තාක්ෂණ කර්මාන්තයේ විශාලතම පුද්ගලික ජාලය නිර්මාණය කර ඇත.

**kcg.edu**
Kyoto Computer Gakuin
**KCG**

**RIT**
Rochester Institute of Technology

**kcg.edu**
Kyoto Computer Gakuin Automobile School
**KCGM**

**kcg.edu**
The Kyoto College of Graduate Studies for Informatics
**KCGI**

කියෝතෝ කොම්පියුටර් ගැකුයින් මෝටර් රථ පාසල ඊළඟ පරම්පරාව සඳහා වූ රථවාහන තාක්ෂණයට අදාළ තොරතුරු තාක්ෂණය හා ජාලකරණය පිළිබඳ දැනුම සහ උසස් තාක්ෂණික ක්‍රම සමඟින් රථවාහන යාන්ත්‍රික ක්‍රම පෝෂණය කරයි.



**kcg.edu**
Kyoto Japanese Language Training Center
**KJLTC**

කියෝතෝ ජපන් භාෂා පුහුණු මධ්‍යස්ථානයේ, ජපන් භාෂා අධ්‍යාපන පහසුකම අධිකරණ අමාත්‍ය විසින් අනුමත කර ඇති අතර, තම රට තුල අධ්‍යාපන, සංස්කෘතික, ක්‍රීඩා, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යයංශ යටතේ වසර 12 ක පාසල් අධ්‍යාපනයක් නොලැබූ සිසුන් සඳහා වූ ජපන් භාෂා ආයතනයක් ලෙස නම් කර ඇත.

**kcg.edu**
Kyoto Computer Gakuin - U.S.A.
**නිව් යෝර්ක් කාර්යාලය**

KCG සමූහයේ විදේශ මෙහෙයුම් සඳහා පදනම ලෙස, නිව් යෝර්ක් කාර්යාලය නිව් යෝර්ක් ලෝක වෙළඳ මධ්‍යස්ථානය තුල 2000දී පිහිටුවන ලදී. සැප්තැම්බර් 11 දින ඇමරිකා එක්සත් ජනපදය හදිසි ත්‍රස්ත ප්‍රහාරවලින් පීඩාවට පත් වුවත්, දැන් නිව් යෝර්ක් කාර්යාලය රොක්ෆෙලර් මධ්‍යස්ථානයේ පිහිටා ඇති අතර එහි කටයුතු නැවත ආරම්භ කර ඇත.



**kcg.edu**
Kyoto Computer Gakuin - China
**බීජිං කාර්යාලය**
**ඩාලියන් කාර්යාලය**
**ෂැංහයි කාර්යාලය**

චීනයේ විශ්ව විද්‍යාල සමඟ හුවමාරු කර ගැනීමේ පදනමක් ලෙස කේ.සී.ජී. බීජිං කාර්යාලය 2002 දී බීජිං හි චීන ජාතික පුස්තකාලය තුළ ස්ථාපිත කරන ලද අතර කේ.සී.ජී. විසින් එය සමග සබඳතා ශක්තිමත් කරගනිමින් සිටී.කේ.සී.ජී. විසින් 2008 දී කේ.සී.ජී. ඩේලියන් කාර්යාලය සහ 2018 දී KCG ෂැංහයි කාර්යාලය විවෘත කළ අතර එමඟින් චීන විශ්ව විද්‍යාල සඳහා තොරතුරු තාක්ෂණ අධ්‍යාපනික සහාය ලබා දෙයි.



**kcg.edu**
Kyoto Computer Gakuin - Vietnam
**හැනෝයි කාර්යාලය**

2019 දී KCG විසින් වියට්නාමයේ KCG හි පළමු පදනම ලෙස හැනෝයි කාර්යාලය පිහිටුවන ලදී.









## KCGI සමාලෝචනය

**නම:** කියෝතෝ තොරතුරු විද්‍යා උපාධි අධ්‍යයන විද්‍යාලය

**මව් සංවිධානය:** කියොතෝ ජෝහෝ ගකුඑන්

**ලිපිනය:** 7 තනකමොන්සෙන්-කු, සක්යො-කු, කියොතෝ 606-8225, ජපානය

**උපාධි පාසල:** ව්‍යවහාරික තොරතුරු තාක්ෂණ විද්‍යාලය

**ප්‍රධාන:** අන්තර්ජාල ව්‍යාපාර තාක්ෂණ වැඩසටහන

**සම්පූර්ණ කළ යුතු ක්‍රෙඩිට් ගණන:** 44

**ඇතුළත් වූ සිසුන් සංඛ්‍යාව:** 600 (මුළු ධාරිතාව පුද්ගලයන් 1200 කි.)

**පාඨමාලා වාරය:** අවුරුදු 2 යි

**උපාධිය:** තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය (M.S. - IT)

URL: https://www.kcg.edu/

KYOTO



රොම්, මුරුටා නිෂ්පාදන, නින්තෙන්දෝ, හොරිබා, ක්යොසෙරා, නිඩෙක් සහ ඔම්රොන් ඇතුලු ජපන් කර්මාන්තයේ නියමුවන් වන තොරතුරු තාක්ෂණ සමාගම් බොහෝමයක්, ජපානයේ සාම්ප්‍රදායික සංස්කෘතියේ මධ්‍ය ලක්ෂය වන කියොතෝහි පිහිටා ඇත. කියොතෝ බොහෝ නොබෙල් ත්‍යාගලාභීන් ද උපන් භූමිය වේ. KCGI විසින් කියෝතෝ විසින් නිෂ්පාදනය කරනු ලබන අති උත්කර්ෂවත් බලශක්තිය රැගෙන ඒවා පංති කාමරය තුලට ගෙන ඒමට අරමුණු කරයි.

### හයකුමන්බෙන් සරසවිය, කියෝතෝ ප්‍රධාන පාසල






**ලිපිනය:** 7 තනකමොන්සෙන්-කු, සක්යො-කු, කියොතෝ 606-8225, ජපානය
**ප්‍රවේශය:** හයකුමන්බෙන් මංසන්ධියේ සිට මිනිත්තු 1 ක් උතුරට ඇවිද යන්න, දෙමචියනගි දුම්රිය ස්ථානයේ සිට මිනිත්තු 8 ක් ඇවිද යන්න; කෙයිහන් දුම්රිය හෝ එයිසන් විදුලි දුම්රියෙන් ගමන් කරන්න
කියොතෝ දුම්රිය ස්ථානයෙන් අංක 17 බස් රථය ගන්න "හයකුමන්බෙන්" වලින් බසින්න, නැත්නම් අංක 206 බස් රථයක නැග "අසුකයිචෝ" වලින් බසින්න.

### කියොතෝ එකිමාඊ චන්ද්‍රිකා, කියෝතෝ ප්‍රධාන පාසල






**ලිපිනය:** 10-5 නිෂිකුජෝ, තෙරනොමඑ-චො, මිනමි-කු, කියොතෝ 601-8407, ජපානය
**ප්‍රවේශය:** කියොතෝ දුම්රිය ස්ථානයෙන් හචිජෝ බටහිර පිටවීමේ සිට සිට මිනිත්තු 7 ක් බටහිරට ඇවිද යන්න.

### සප්පොරො චන්ද්‍රිකාව






**ලිපිනය:** දයිගෝ ගොඩනැගිල්ල 7 වන මහල (dGIC ඉන්කෝපරේෂන් ඇතුළත), 5-11 ඔදොරිනිෂි චුඕ-කු, සප්පොරො, 060-0042, ජපානය
**ප්‍රවේශය:** ඔදොරි දුම්රිය ස්ථානයේ 2වන පිටවීමෙන් උතුරට මිනිත්තු 1 ක් ඇවිද යන්න.

### තෝකියෝ චන්ද්‍රිකාව






**ලිපිනය:** VORT මොතෝඅසබු 4වන මහල (හිතොමිඩියා ඉන්කෝපරේෂන් ඇතුළත) 3-1-35 මොතෝඅසබු, මිනතෝ-කු, ටෝකියෝ, 106-0046, ජපානය
**ප්‍රවේශය:** ටෝකියෝ මෙට්‍රො හිබියා මාර්ගයේ පිහිටි රෝප්පොන්ගි දුම්රිය ස්ථානයේ 1A පිටවීමේ සිට මිනිත්තු 8ක ඇවිදීම
තොඑයි ඔඑදො මාර්ගයේ පිහිටි රෝප්පොන්ගි දුම්රිය ස්ථානයේ 3 පිටවීමේ සිට මිනිත්තු 10ක ඇවිදීම